වාචිකව උත්තර දුන්න එකක් නම් කවදාවත් නැවත න්‍යාය පත්‍රයට ඇතුළත කරන්නේ නැහැ. එහෙමනම් මේ නිලධාරි මණ්ඩලය අපව දැනුවත් කරනවා. අපිට ඒ අය ඇවිල්ලා කියලා තිබෙනවා. ඒක මන්ත්‍රීතුමාගේ වරදක්වත්, කාලය නාස්ති කිරීමක්වත් නොවෙයි. ඒ අදාළ නිලධාරින් දී තිබෙන වාචික පිළිතුරු, ඒ වාගේම ලිඛිත පිළිතුරු ගැන සොයා බලනවා. එහෙම

** පුස්තකාලයේ තබා ඇත.*
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library.*

කලින් උත්තර දීලා තිබෙන ප්‍රශ්නයක් නම් ඒ අය ඇවිල්ලා මාව හමු වෙලා ඒ ගැන කියලා තිබෙනවා. ඉතින් මේක මේ මන්ත්‍රීතුමා පිට දමලා, එතුමා කාලය නාස්ති කිරීමක් කරනවා කියන එක සම්පූර්ණ වැරැදියි. ඔබතුමා සොයා බලා කියන්න, මොකක්ද සිදු වෙලා තිබෙන්නේ කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කවුරුවත් පිට දමන්නේ නැහැ. මා මේ ගැන පරීක්ෂා කර බලන්නම්. ගරු ඇමතිතුමා ළඟ තිබෙන හැන්සාඩ් වාර්තාවත් මට ඉදිරිපත් කරන්න. [බාධා කිරීමක්] ඒකත් ඉදිරිපත් කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, තව එක පැහැදිලි කිරීමක් කරන්නම්. මේක නිලධාරින්ගේ ප්‍රශ්නයක් නොවෙයි. මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම නිලධාරින් ඒ ගැන කටයුතු කරනවා. නමුත් මන්ත්‍රීවරයාගේ වග කීමක් තිබෙනවා එකම ප්‍රශ්නය දෙසැරයක් ඉදිරිපත් නොකිරීමට. එකම ප්‍රශ්නය දෙ සැරයක් ඉදිරිපත් කර එකම උත්තරය ලබා ගෙන සෑහීමකට පත් නොවීම අනවශ්‍ය කාලය ගත කිරීමක්. කාලය අපතේ යැමක්. ලිඛිත ප්‍රශ්නයට උත්තර ලැබුණා; ඒකෙන් සෑහීමකට පත් වුණා. දෙ වනුව වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් විධියටත් ඒක අහනවා. [බාධා කිරීමක්] හිට ගෙන කථා කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, ලිඛිත උත්තරයක් වුවමනා ප්‍රශ්නයක්ද, වාචික උත්තරයක් වුවමනා ප්‍රශ්නයක්ද කියලා තීන්දු ගන්නේ ඔබතුමා. ඒ කියන්නේ නිලධාරි මණ්ඩලය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අපි බලමු.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
වැරැදි පිළිවෙළට කෑ ගහන්න ගියාම, කාලය නාස්ති වෙනවා කියලා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මා එතුමාට ස්තුතිවන්ත වනවා මේ කාරණය මතු කළාට. ඒ ගරු මන්ත්‍රීතුමාටත් මා ස්තුතිවන්ත වනවා, ගරු සභාවේ දී "කමක් නැහැ" කියලා එය පිළිගත්තාට.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එතුමා "කමක් නැහැ" කිව්වාට හරි යන්නේ නැහැ. මෙය අපේ විරුද්ධ පක්ෂයට තිබෙන ප්‍රශ්නයක්. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කොහොම වුණත් අපි මේක බලමු කෝ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපි ප්‍රශ්නයක් අහපුවාම, ඒ ප්‍රශ්නයට ලිඛිත පිළිතුරු ලබා දෙනවාද, වාචික පිළිතුරු ලබා දෙනවාද කියලා තීරණය කරන්නේ කවුද? අපි තීරණයක් අරගෙන තිබෙනවා. එය තීන්දු කරන්නේ ගරු කථානායකතුමාගේ කාර්යාලයෙන්. ඒකට අපි අවසරය දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය පිළිබඳව කරුණු ඉදිරිපත් කළාට ගරු ඇමතිතුමාට ස්තුතියි. [බාධා කිරීමක්] හොඳයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ලිඛිත පිළිතුරු ලබා දුන් ප්‍රශ්නයක් ආපහු වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් හැටියට ඉදිරිපත් කරන කොට එම ප්‍රශ්නයම ඉදිරිපත් වුණාද කියන එක බලන්නට ඕනෑ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂයට අහන්න ප්‍රශ්න නැත්නම් අපි ලියලා දෙන්නම්. එකම කාරණය දෙතුන් වතාව අහන්න එපා. අපි ප්‍රශ්න ලියලා දෙන්නම්. සුළු දෙයක් නේ. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේ අහපු ඒවාට උත්තර දෙන්න කෝ. හැමදාම අහන ප්‍රශ්න 6කට 7කට උත්තර නැහැ. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වලපනේ ගැන නම් අහන්නේ නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ටිකක් වෙලාව තිබෙන නිසා කමක් නැහැ. ප්‍රශ්න අංක 9-0222/08 - (1) ගරු ජෙමසිරි මානගේ මහතා.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம். எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය ආදායම් හා මුදල් අමාත්‍යතුමා සහ මුදල් ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய - அரச இறைவரி, நிதி அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapititya—Minister of State Revenue and Finace and Deputy Minister of Finance of Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம். எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
ගරු කථානායකතුමනි, මේකේ තේරුම මොකක්ද? අද මම ප්‍රශ්න තුනක් ඇහුවා. ඒ ප්‍රශ්න තුනටම කල් ඉල්ලුවා. බාලගිරි දෝෂය වාගෙයි. අද කාල වේලාවත් ඕනෑ තරම් තිබුණා. ගරු කථානායකතුමනි, කොහොම වුණත් ප්‍රශ්න 100ක් ඇහුවොත් උත්තර දෙන්නේ ප්‍රශ්න 25ටයි. සියයට 75කටම කල් ගන්නවා. මාසයක් කල් ගන්නවා; මාස දෙකක් කල් ගන්නවා. මේවා සරල ප්‍රශ්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලුවා. ඔබතුමා දන්නවා, අපේ අමාත්‍යාංශය හැම විටකම අහන ප්‍රශ්නවලට ඉතාම සවිස්තරාත්මකව පිළිතුරු දෙන්න උත්සාහ කරන බව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්, ඔව් ඇමතිතුමා ඉන්නවා. උත්තර දෙන්න. ඒක ලොකු දෙයක්.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, 30 වන දා තමයි මේ ප්‍රශ්නය අපේ අමාත්‍යාංශයට ලැබුණේ. වැඩ කරන දින 7ක් තමයි අපට තිබුණේ. ආයතන කිහිපයක්, මහ බැංකුව, අපේ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු කිහිපයක් එකතු වෙලා පිළිතුර සකස් කළ යුතුයි. ඒ නිසා මම සාධාරණ කාලයක් ඉල්ලුවේ. එතුමන්ලාට පිළිතුර ලබා ගැනීමට තිබෙන අයිතිය වාගේම සත්‍ය, සාධාරණ පිළිතුර ලබා දීමේ වගකීමත් අපට තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසායි මාසයක් කල් ඉල්ලුවේ.

**ගරු එම්. එම්. පේමසිරි මානගේ මහතා**
(மாண்புமிகு எம். எம். பேமசிறி மானகே)
(The Hon. M. M. Pemasiri Manage)
මේ ප්‍රශ්නය මා ඔබතුමාට යොමු කළේ. ඉංග්‍රීසින් ලංකාවට ආපු කාලයේ ගොඩක් කල් වනවා ප්‍රශ්නය යොමු කරලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, නමුත් අමාත්‍යාංශයට ලැබී තිබෙන්නේ 30 වැනි දා 26 වැනි න්‍යාය පුස්තකයේයි මේක ඇතුළත් වෙලා තිබෙන්නේ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා:විදේශ සංචාර
**இளைஞர் வலுவுட்டுனக, சமூக பொருளாதார அபிவிருத்தி அமைச்சர்: வெளிநாட்டு விஜயங்கள்**
MINISTER OF YOUTH EMPOWERMENT AND SOCIO ECONOMIC DEVELOPMENT: FOREIGN TOURS

0406/'09

10. **ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) එතුමා මෙම අමාත්‍ය තනතුරට පත් වූවාට පසුව විදේශ ගත වූ වාර ගණන සහ එම රටවල් කවරේද;
(ii) විදේශ ගත වූ හේතුව සහ අදාළ කාලය කවරේද;
(iii) ගත කළ දින ගණන කොපමණද;
(iv) එතුමා සමග විදේශ ගත වූ නිලධාරීන් කවුරුන්ද;
(v) ඔවුන්ගේ තනතුරු කවරේද;
(vi) එතුමා සමග විදේශ ගත වූ සියලු නිලධාරීන් මේ වන විට ආපසු දිවයිනට පැමිණ සිටීද;
(vii) යම් කිසිවෙකු ආපසු නොපැමිණියේ නම් ඒ කවුරුන්ද;
(viii) ඒ කවර හේතුවක් නිසාද;
(ix) විදේශ ගත වූ වාරවලදී වියදම් කළ මුදල කොපමණද;
(x) එම මුදල් වැය කළේ අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් නොවේ නම්, වෙනත් බාහිර ආයතනයකින් නම් එම ආයතනය කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

இளைஞர் வலுவூட்டுகை , சமூக பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) (i) அவர் இந்த அமைச்சுப் பதவிக்கு நியமிக்கப்பட்ட பின்னர் மேற்கொண்ட வெளிநாட்டு விஜயங்களின் எண்ணிக்கைகளும் அந்த நாடுகளும் யாவை என்பதையும்,
(ii) வெளிநாட்டு விஜயம் மேற்கொள்ளப்பட்டமைக்கான காரணம் மற்றும் உரிய காலப் பகுதி யாவை என்பதையும்,
(iii) கழித்த நாட்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்,
(iv) அவருடன் பங்கேற்ற உத்தியோகத்தர்கள் யாவர் என்பதையும்,
(v) அவர்களது பதவிகள் யாவை என்பதையும்,
(vi) அவருடன் வெளிநாடு சென்ற சகல உத்தியோகத்தர்களும் தற்போது மீண்டும் நாடு திரும்பியுள்ளனரா என்பதையும்,
(vii) எவரேனுமொருவர்மீண்டும் திரும்பிவரவில்லையெனில், அவர் யார் என்பதையும்,
(viii) அது எக்காரணத்தினால் என்பதையும்,
(ix) வெளிநாட்டு விஜயங்களை மேற்கொண்ட போது செலவிடப்பட்ட தொகை எவ்வளவு என்பதையும்,
(x) இத் தொகை அமைச்சுக்கான ஒதுக்கீடுகளிலிருந்து மேற்கொள்ளப்படாமல் வேறு வெளி நிறுவனத்தின் மூலம் மேற்கொள்ளப்பட்டிருக்குமாயின் அந்த நிறுவனம் யாது என்பதையும்

தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Empowerment and Social Economic Development:

(a) Will he inform this House separately—

(i) of the number of times he has gone abroad after assuming duties in this Ministry and the names of the countries he has visited;

(ii) of the reasons for going abroad and the relevant periods;

(iii) of the number of days he spent abroad;

(iv) of the names of the officials who joined him in those tours;

(v) as to what their posts are;

(vi) as to whether all officials who had gone abroad with him have returned to the country;

(vii) of the names of the officials who have not returned , if any officers have not returned to the country;

(viii) of the reason for it;

(ix) of the amount of expenditure incurred with respect to each of those foreign trips; and

(x) of any external institution that sponsored these tours, if the expenses were not made by the allocations of the Ministry?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවා. ගරු මන්ත්‍රීතුමා පිළිතුරට අදාළ සම්පූර්ණ විස්තරය තිබෙනවා.

*** සභා මේසය මත තබන ලද පිළිතුර:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled:*

(අ) (i)

| රට | විදේශ ගත වූ වාර ගනන |
|---|---|
| නෝර්වේ-ඔස්ලෝ | 01 |
| එකතුව | 01 |

(ii)

| | රට | කාරණය | කාලය |
|---|---|---|---|
| 01 | නෝර්වේ-ඔස්ලෝ | රාජකාරී | 2008 අප්‍රේල් 05-15 |

(iii) ඉහත ප්‍රශ්න අංක (ii) යටතේ පිළිතුරු අදාළ වේ.

(iv) - (v)

| | රට | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|---|
| 1. | නෝර්වේ-ඔස්ලෝ | එම්. ෆාරුක් මහතා | පුද්ගලික ලේකම් |
| 2. | එම | කේ. ඩී. ජී. මීගොඩ මහතා | උපදේශක |

(vi) ඔව්.

(vii) අදාළ නොවේ.

(viii) අදාළ නොවේ.

(ix) නොර්වේ-ඔස්ලෝ. - රු. 2,191,700.00

(x) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
ගරු ඇමතිතුමනි, සම්පූර්ණයෙන් වැය කළ මුදල විතරක් කියන්න පුළුවන් ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මුළු මුදල රුපියල් විසි එක් ලක්ෂ අනූ එක් දහස් හත්සියයයි.

## නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය : අංග
### புதிய கொழும்பு நுகர்வோர் விலைச்சுட்டி : விடயங்கள்
NEW COLOMBO CONSUMER PRICE INDEX : ITEMS

0072/'09

**1. ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - மாண்புமிகு ரவி கருணாநாயக்க - சார்பாக)
(The Hon. M. Joseph Michael Perera on behalf of The Hon. Ravi Karunanayake )
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1) :

(අ) (i) කොළඹ පාරිභෝගික මිල දර්ශකය වෙනස් කළ දිනය කවදාද;

(ii) නව කොළඹ පාරිභෝගික මිල දර්ශකයට ඇතුළත් අංග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව මිල දර්ශකය හා පැරණි මිල දර්ශකය අතර සංසන්දනයක ආකාරය කවරේද;

(ii) පැරණි හා නව මිල දර්ශක අතර උද්ධමන වෙනසෙහි සංසන්දනයක ආකාරය කවරේද;

(iii) රටේ උද්ධමනය සංසන්දනය කිරීමට උපයෝගී කර ගනු ලබන අනෙකුත් දර්ශක කවරේද;

යන්නත් කොළඹ පාරිභෝගික මිල දර්ශකය වෙනස් වූ දින සිට අද දක්වා වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு நுகர்வோர் விலைச்சுட்டி மாற்றப்பட்ட திகதியையும்,

(ii) புதிய, கொழும்பு நுகர்வோர் விலைச்சுட்டியில் உள்ள விடயங்களையும்

அவர் இச்சபைக்கு அறியத்தருவாரா?

(ஆ) கொழும்பு நுகர்வோர் விலைச்சுட்டி மாற்றப்பட்ட தினத்திலிருந்து இற்றைக்குமான ,

(i) பழைய விலைச்சுட்டியுடனான புதிய விலைச் சுட்டியின் ஒப்பீடு ஒன்றையும்,

(ii) புதிய மற்றும் பழைய விலைச் சுட்டிகளுக்கிடையிலான பணவீக்க வித்தியாசத்தின் ஒப்பீடு ஒன்றையும்,

(iii) நாட்டின் பணவீக்கத்தினை ஒப்பிடப் பயன்படுத்தப்படும் ஏனைய சுட்டிகளையும்

வருட வாரியாக அவர் சமர்ப்பிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

ask the Minister of Finance and Planning :

(a) Will he inform this House—

(i) the date that the Colombo Consumer Price Index was changed; and

(ii) the items on the new Colombo Consumer Price Index?

(b) Will he submit to this House on yearly basis to date, from the date that the Colombo Consumer Price Index was changed—

(i) a comparison of the new Price Index with the old Price Index;

(ii) a comparison of the inflation difference between the old and new indexes; and

(iii) other indexes that are used to compare the inflation of the country?

(c) if not, why?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்சித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapititya)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභා මේසය මත තබන ලද පිළිතුර :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(අ) (i) 2008 මැයි.

(ii) නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය සඳහා භාණ්ඩ හා සේවා කාණ්ඩ 10ක් සහ උප කාණ්ඩ 83ක් තෝරා ඇති අතර නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය සඳහා 46.7% ආහාර සඳහා ද 53.3% ක් ආහාර නොවන භාණ්ඩ හා සේවා සඳහා ද බර තැබීම් සිදු කර ඇත. පැරණි කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අයත් වූයේ භාණ්ඩ හා සේවා ප්‍රධාන කාණ්ඩ 05ක් සහ උප කාණ්ඩ 38කි. නව කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අයත් වන භාණ්ඩ හා සේවා සඳහා වූ අයිතමයන් ඇමුණුම අංක 1න් පෙන්නුම් කරයි.

(ආ) (i) පදනම (1952=100) ලෙස ගණනය කරනු ලැබූ පැරණි මිල දර්ශකයෙහි පැවති දුර්වලතාවක් ඉදිරිපත් කරනු වස් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2002දී පවත්වනු ලැබූ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ (HIES*) තොරතුරු මත පදනම්ව නව පාර්භෝගික මිල දර්ශකයක් සකසන ලදී. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (පදනම 2002=100) ලෙස හඳුන්වයි.

නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2002=100) හා පැරණි කොළඹ පාරිභෝගික මිල දර්ශකය (1952=100) අතර දැකිය හැකි පැහැදිලි වෙනස්කම් පහත දැක්වේ.

| විශේෂ ලක්ෂණ | පැරණි CCPI | නව CCPI |
|---|---|---|
| පදනම් වර්ෂය | 1952-100 | 2002—100 |
| ඉලක්ක ගෘහ ඒකක | කොළඹ මහ නගර සභා ප්‍රදේශයේ වැඩ කරන පන්තිය නියෝජනය කරන ගෘහ ඒකක | කොළඹ දිස්. නාගරික සියළුම ගෘහ ඒකක |
| භූගෝලීය ලක්ෂණ | කොළඹ මහ නගර සභා කොට්ඨාසය | කොළඹ දිස්. සියළුම නාගරික කොට්ඨාස |
| නියැදි තරම | ගෘහ ඒකක 455 | ගෘහ ඒකක 1300 |
| පවුල් තරම | 5.8 | 4.5 |
| මිල රැස්කරන වෙළඳපොළවල් | 07 | 12 |
| අයිතමයන් ගණන | 213 | 334 |
| ප්‍රධාන කාණ්ඩ | 05 | 10 |
| උප කාණ්ඩ | 38 | 83 |
| බර තැබීම් අනුපාතය | | |
| ආහාර කාණ්ඩ | 68.3 | 46.7 |
| ආහාර නොවන කාණ්ඩ සඳහා | 31.7 | 53.3 |
| බඩු මල්ලේ වටිනාකම | රු. 202.24 | රු. 17,966.38 |
| එක් දර්ශකයක වටිනාකම | රු. 2.02 | රු. 179.96 |

Househould Income and Expenditure Survey

මූලාශ්‍ර — ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

උක්ත වෙනස්කම් සවිස්තරාත්මකව පෙන්නුම් කළහොත්

1. පදනම් වර්ෂය

නව දර්ශකයෙහි (2002=100 භාණ්ඩ හා සේවා සඳහා (කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික අංශයේ සාමාන්‍ය ගෘහ ඒකකයක) මාසික පාරිභෝජන වියදම රු. 17,996.38 වූ අතර පැරණි කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (CCPI) පදනම් කාලයෙහි මුළු පරිභෝජන වියදම වූ රු. 202 සමඟ සැසඳීමේදී 88 ගුණයක පමණ වැඩි වීමකි. මෙම වැඩි වීම මඟින් ආදායම් සහ මිල මට්ටම්වල වැඩි වීම සහ පාරිභෝගික බඩු මල්ලෙහි සංයුතියෙහි සිදුවී ඇති වෙනස්වීම් නිරූපණය කරයි. මෙමඟින් පරිභෝජන රටාවෙහි කාලීන වෙනස්වීම් හඳුනා ගත හැකිය.

2. යොදා ගත් නියැදිය

නව දර්ශකය සඳහා වූ භූගෝලීය ආවරණය ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, මොරටුව මහ නගර සභාව සහ කොලොන්නාව, සීතාවකපුර, මහරගම, කැස්බෑව සහ බොරලැස්ගමුව නගර සභාවද අයත් වන පරිදි පුළුල් කර ඇත. නමුදු පැරණි දර්ශකය කොළඹ නගරයට පමණක් සීමා වූ, වැඩ කරන පන්තියේ ගෘහ ඒකක 455කට පමණක් නියැදිය සීමා වී තිබුණ.

3. සියළුම සමාජ ආර්ථික පන්ති ආවරණය වීම

නව දර්ශකය සඳහා වූ (HIES) සමීක්ෂණය මගින් ගෘහ ඒකක 1300ක් ආවරණය වූ අතර කොළඹ දිස්ත්‍රික්කයෙහි නාගරික ප්‍රදේශවල පවතින සියලුම සමාජ ආර්ථික පන්ති එම සමීක්ෂණයට ඇතුළත් විය. තවද, කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (1952=100) ඇස්තමේන්තු වූ ගෘහ ඒකකයක 5.8 වූ සාමාන්‍ය පුද්ගලයන් ගණන 2002 දී ගෘහ ඒකකයක සාමාන්‍ය පුද්ගලයන් ගණන 4.5 ක් දක්වා අඩු විය.

4. වෙළඳපළවල් සංඛ්‍යාව
නව දර්ශකයෙහි මිල රැස් කිරීමේ මධ්‍යස්ථාන 12 කි.

| | | |
|---|---|---|
| 1. පිටකොටුව | 5. ග්‍රෑන්ඩ්පාස් | 9. කෝට්ටේ |
| 2. මරදාන | 6. බොරැල්ල | 10. නුගේගොඩ |
| 3. වැල්ලවත්ත | 7. කිරුළපන | 11. කොලොන්නාව |
| 4. දෙමටගොඩ | 8. දෙහිවල | 12. රත්මලාන |

5. මත්පැන් පරිභෝජනය අධෛර්යමත් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව නව කොළඹ පාභෝගික මිල දර්ශකයෙහි භාණ්ඩ හා සේවා මල්ලෙන් මත්පැන්, දුම්කොළ හා මත් ද්‍රව්‍ය සඳහා වන කාණ්ඩය බැහැර කිරීම.

6. නව සහ පැරණි දර්ශකයන් සඳහා වූ දර්ශකාංකයන්හි විචලනයන් පහත දැක්වේ.

**නව සහ පැරණි දර්ශක අංකයන්හි විචලනයන්**

| *වර්ෂය* | *මාසය* | *දර්ශක අංකය* | *උද්ධමනය (නව)* | | *දර්ශක අංකය* | *උද්ධමනය (පැරණි)* | |
|---|---|---|---|---|---|---|---|
| | | | *ලක්ෂ්‍යමය උද්ධමනය* | *මාස 12 වාර්ෂික වෙනස්වීම්* | | *ලක්ෂ්‍යමය උද්ධමනය* | *මාස 12 වාර්ෂික වෙනස්වීම්* |
| | | *2002=100* | *%* | *%* | *1952=100* | *%* | *%* |
| 2002 | | | | | 3176.4 | 11.3 | 9.6 |
| 2003 | | 108.9 | | 5.8 | 3377.0 | 5.0 | 6.3 |
| 2004 | | 123.0 | 13.0 | 9.0 | 3632.8 | 13.8 | 7.6 |
| 2005 | | 132.2 | 7.4 | 11.0 | 4055.5 | 8.0 | 11.6 |
| 2006 | | 150.0 | 13.5 | 10.0 | 4610.8 | 19.3 | 13.7 |
| 2007 | | 178.1 | 18.8 | 15.8 | 5416.1 | 16.4 | 17.5 |
| 2008 | ජනවාරි | 183.5 | 20.8 | 16.4 | 6302.5 | 21.6 | 17.6 |
| | පෙබරවාරි | 188.6 | 21.6 | 17.0 | 6345.4 | 24.0 | 18.1 |
| | මාර්තු | 191.9 | 23.8 | 17.7 | 6441.7 | 28.1 | 18.8 |
| | අප්‍රේල් | 195.4 | 25.0 | 18.7 | 6527.1 | 29.9 | 20.0 |

(ii) පැරණි හා නව මිල දර්ශක අතර උද්ධමන වෙනසෙහි සංසන්දනය 2003 - 2008 ජනවාරි - අප්‍රේල් පහත වගුවෙන් පෙන්නුම් කරයි.

| *වර්ෂය* | | *ලක්ෂ්‍යමය උද්ධමනය* | | *නව සහ පැරණි දර්ශක අතර වෙනස්වීම* | *මාස 12 වාර්ෂික වෙනස්වීම්* | | *නව සහ පැරණි දර්ශක අතර වෙනස්වීම්* |
|---|---|---|---|---|---|---|---|
| | | *1952=100* | *2002=100* | *(4)=(3)-(2)* | *1952=100* | *2002=100* | *(7)=(6)-(5)* |
| *(1)* | | *(2)* | *(3)* | | *(5)* | *(6)* | |
| 2003 | | 5.0 | | | 6.3 | 5.8 | -0.5 |
| 2004 | | 13.8 | 13.0 | -0.8 | 7.6 | 9.0 | 1.4 |
| 2005 | | 8.0 | 7.4 | -0.6 | 11.6 | 11.0 | -0.6 |
| 2006 | | 19.3 | 13.5 | -5.8 | 13.7 | 10.0 | -3.7 |
| 2007 | | 16.4 | 18.8 | 2.4 | 17.5 | 15.8 | -1.7 |
| 2008 | ජනවාරි | 21.6 | 20.8 | -0.8 | 17.0 | 16.4 | -0.6 |
| | පෙබරවාරි | 24.0 | 21.6 | -2.4 | 18.1 | 17.0 | -1.1 |
| | මාර්තු | 28.1 | 23.8 | -4.3 | 18.8 | 17.7 | -1.1 |
| | අප්‍රේල් | 29.9 | 25.0 | -4.9 | 20.0 | 18.7 | -1.3 |

**පැරණි හා නව මිල දර්ශක අතර උද්ධමනයෙහි වෙනස**
**2003 - 2008 (ජනවාරි - අප්‍රේල්)**







(iii) රටක උද්ධමනය මැනිය හැකියැයි දැනට භාවිත කරනු ලබන සඳහන් දර්ශකයන් පහත දැක්වේ.
ගම්‍ය මිල දර්ශකය
තොග මිල දර්ශකය
නාමික වැටුප් අනුපාතය

(ඇ) අදාළ නොවේ.

Annex 1

NEW COLOMBO CONSUMER PRICE INDEX CCPI (N) D1-D10
(BASE 2002) ITEM LIST

| *Commoditics* | *Item* | *Unit* |
|---|---|---|
| | **Group 1-Total** | **149** |
| 1. Rice | 1. Rice-(Samba) | |
| | No. 1: | 1 Kg |
| | No. 2: | 1 Kg |
| | 2. Rice-(Kekulu)-Red | |
| | No. 1: | 1 Kg |
| | No. 2 : | 1 Kg |
| | 3. Rice-(Kekulu)-White | |
| | Local: | 1 Kg |
| | Imported: | 1 Kg |
| | 4. Rice (Nadu)-White | 1 Kg |
| 2. Flour | 1. Wheat flour-(Prima) | 1 Kg |
| | 2. Rice flour- (Harischandra) | 400g |
| 3. Bread & Bakery Products | 1. Bread (normal) | Each |
| | 2. Biscuits-Maliban | |
| | Mari | 90g |
| | Creamcracker | 190g |
| | 3. Buns-(Tea bun) | Each |
| 4. Starchy Food | 1. Yams-Potatoes | |
| | Local : | 1 Kg |
| | Imported : | 1 Kg |
| | 2. Other Starchy Food-Jak | 1 Kg |
| | 3. Bread fruit | 1 Kg |
| | 4. Sweet potatoes (Bathala) | 1 Kg |
| 5. Pulses | 1. Dhall | |
| | No. 1 : (Large nuts) | 1 Kg |
| | No. 2 : (Small nuts) | 1 Kg |

| *Commoditics* | *Item* | *Unit* |
|---|---|---|
| | 2. Gram (Chinthamanie) | |
| | Large : | 1 Kg |
| | Small : | 1 Kg |
| | 3. Green gram | |
| | Local : | 1 Kg |
| | Imported : | 1 Kg |
| | 4. Soya meat | |
| | Without Flavour-90g (Lanka Soy) | 90g |
| 6. Other Cereal & Cereal Products | 1. Noodles Harishchandra (Normal) | 400g |
| | 2. Papadam Harishchandra | 100g |
| | 3. Ulundhu –flour (Harishchandra) | 200g |
| | 4. Infants cereal foods- Cerelack (Milk rice)-Stage 1 | 400g |
| 7. Meals bought outside | 1. Rice with fish & vegetables | 1Pkt. |
| | 2. Rice with meat and vegetables | 1Pkt. |
| | 3. Rice with only vegetables | 1Pkt. |
| | 4. String hoppers | |
| | 1. Rice Flour : | Each |
| | 2. Wheat Flour : | Each |
| | 5. Pittu | |
| | 6. Milk tea | Each |
| | 7. Thosai | Each |
| | 8. Plain tea | Each |
| | 9. Hoppers | Each |
| | 10. Rotti | Each |
| 1. Meat and Meat Products | 1. Chicken | |
| | 1. Fresh : | 1 Kg |
| | 2. Frozen : | 1 Kg |
| | 2. Beef | 1 Kg |
| | 3. Mutton | 1 Kg |
| | 4. Sausages-Chicken (Keels) | 300g |
| | 5. Meat ball-Chicken (Keels) | 200g |
| 1. Fish | 1. Kelavalla | 1 Kg |
| | 2. Thalapapth | 1 Kg |
| | 3. Balaya | 1 Kg |
| | 4. Mullet | 1 Kg |
| | 5. Paraw | 1 Kg |
| | 6. Seer | 1 Kg |
| 2. Small Fish | 1. Salaya | 1 Kg |
| | 2. Hurulla | 1 Kg |
| | 3. Other small fish-(Small Mullet and parati) | |
| | 1. Small Mullet | 1 Kg |
| | 2. Patati | 1 Kg |
| | 4. Kumbalawa | 1 Kg |
| | 5. Sprats | 1 Kg |
| 3. Dries Fish | 1. Sprats (dried) | 1 Kg |
| | 2. Katta (dried) | 1 Kg |
| | 3. Keeramin/Salaya (dried) | |
| | 1. Keeramin (dried) | 1 Kg |
| | 2. Salaya (dried) | 1 Kg |
| | 4. Balaya (dried) | 1 Kg |
| | 5. Seer (dried) | 1 Kg |
| 4. Processed Fish | 1. Maldive fish | 1 Kg |
| | 2. Canned fish (salmon)-Delmage | 425g |

| *Commoditics* | *Item* | *Unit* |
|---|---|---|
| 1. Eggs | 1. Hen | |
| | White : | Each |
| | Brown : | Each |
| 2. Milk | 1. Milk powder- | |
| | Highland | 400g |
| | Lakspray | 400g |
| | Anchor | 400g |
| | 2. Infant milk powder- | |
| | Lactogen I | 400g |
| | Lactogen II | 400g |
| 3. Coconut Products | 1. Coconut | |
| | Large | Each |
| | Medium | Each |
| 4. Milk Products | 1. Ice-cream-Vanila (Elephant House) | II |
| | 2. Yogurt and Moru-Highland-80ml | 1 cup |
| | 3. Cheese-Craft 250g | 1 Pkt. |
| 1. Cooking Oil & Fat | 1. Coconut oil | |
| | Loose-(1 Bottle) | 750ml |
| | N-Joy white Coconut oil | II |
| | 2. Margarine –Astra | 250g |
| | 3. Butter-(Highland/Anchor) | |
| | Highland | 200g |
| | Anchor | 227g |
| | 4. Vegetable oil- | |
| | Turkey brand | II |
| 2. Oil Seed/Nuts | 1. Groundnuts-(clean) | 1 Kg |
| 1. Frest Frutits-Plan- Tations | 1. Banana | |
| | Anamalu | Each |
| | Kolikuttu | Each |
| | Ambul | Each |
| 1. Fresh Fruits | 1. Papaw | 1 Kg |
| | 2. Apple (Chinese.India) | 1 Kg |
| | 3. Mangoes | |
| | Karthacolomban | Each |
| | Vilad (Other) | Each |
| | 4. Oranges-(Mandarin) | Each |
| | 5. Grapes | 100g |
| | 6. Pineapple | 1 Kg |
| 1. Low Country Vegetables | 1. Brinjal | 1 Kg |
| | 2. Sweet pumpkin | 1 Kg |
| | 3. Tomatoes | |
| | No.: 1 | 1 Kg |
| | No. : 2 | 1 Kg |
| | 4. Long beans | 1 Kg |
| | 5. Bandakka | 1 Kg |
| | 6. Ash Plantain | 1 Kg |
| | 7. Bitter gourd | 1 Kg |
| | 8. Snake gourd | 1 Kg |
| | 9. Ridge gourd | 1kg |
| | 10. Cucumber | 1kg |
| 2. Up Country Vegetables | 1. Beans | |
| | Green | 1kg |
| | Butter | 1kg |
| | 2. Carrot | 1kg |
| | 3. Cabbage | 1kg |
| | 4. Beet-root | 1kg |
| | 5. Leeks | 1kg |

| Commoditics | Item | Unit |
|---|---|---|
| 3. Leavy Vegetables | 1. Mukunuwenna | 1kg |
| | 2. Gotukola | 1kg |
| | 3. Kankun | 1kg |
| | 4. Katurumurunga | 1kg |
| | 5. Sarana | 1kg |
| 1. Sugar | 1. Sugar | 1kg |
| 2. Jaggery & Treacle | 2. Jaggery- | |
| | Kithul | 1kg |
| | Coconut | 1kg |
| 3. Confectionery | 1. Jam-(MD) Mixed Fruit | 485g |
| | 2. Chocolates- | |
| | Kandos Milk | 45g |
| | 3. Toffees-Delta Milk | Each |
| | 4. Marmite (Medium) | 115g |
| 2. Condiments | 1. Bombay onions | 1kg |
| | Local: | 1kg |
| | Imported: | 1kg |
| | 2. Chilly powder-loose | 100g |
| | 3. Curry powder (Sarakku) | 100g |
| | 4. Red onions | |
| | Local: | 1kg |
| | Imported: | 1kg |
| | 5. Pepper (Seeds) | 1kg |
| | 6. Green Chillies | 1kg |
| | 7. Limes | |
| | No:- 1 (Large) | 1kg |
| | No:- 2 (Small) | 1kg |
| | 8. Dried chillies | |
| | No:- 1 | 1kg |
| | No:- 2 | 1kg |
| | 9. Salt - Laklunu | 1kg |
| | 10. Garlic | 1kg |
| | 11. Turmeric and Turmeric powder | |
| | Turmeric | 1kg |
| | Turmeric powder | 100g |
| | 12. Curry leaves-Karapincha | 100g |
| | 13. Cinnamon | 1kg |
| | 14. Tamarind | 1kg |
| 1. Tea & coffee | 1. Tea dust (loose) | 1kg |
| | 2. Coffee powder (Harishchandra) | 100g |
| 2. Mineral Waters, Soft drink and Vegetable Juices | 1. Soft drinks- | |
| | Elephant-Cream Soda | 400ml |
| | Fanta/Coke | 300ml |
| | 2. Fruit drinks and cordial -MD- Mixed Fruit | 750ml |
| | 3. King coconut | Each |
| | **Group 3-Total** | **40** |
| 1. Materials for clothing | 1. Blouse Material-Japanese Polyester | 1m |
| | 2. Poplin (China) | |
| | (i) White (36") | 1m |
| | (ii) Colour (36") | 1m |
| | 3. Printed Fabric (36")-China | 1m |
| 2. Materials for School Uniforms | 4. Tetron-Cotton (65/35)- Japanese (45") | 1m |
| | 5. Trouser Materials-Yellow Line-(60") | 1m |

| Commoditics | Item | Unit |
|---|---|---|
| 1. Shirts | 1. Emerald (65/35) - Long sleeves | Each |
| | 2. Emerald (65/35) - Short sleeves | Each |
| 2. Trousers | 1. Long Trouser-Cotton/Polyester Local Brand | Each |
| 3. T-Shirts | 1. Local (Reborn) - 100% Cotton | Each |
| 4. Sarongs/Vetti | 1. Plain - White | Each |
| | 2. Check - White | Each |
| | 3. Check - Colour | Each |
| | 4. Pijama - Stiched | Each |
| 7. Frocks | 1. A line style frock (Synthetic)- Local Printed | Each |
| | 2. Night dress - 100% Cotton Local | Each |
| 8. Skirt/Blouses | 1. Skirts | |
| | (i) Flared - Local | Each |
| | (ii) Tight - Local | Each |
| | 2. Blouses | |
| | (i) Shape Blouse- with short sleeves (100%) Cotton) | Each |
| | (ii) Shape Blouse-with short sleeves (Cotton Mix) | Each |
| 9. Sarees | 1. Voile - Printed (Imported) | Each |
| | 2. Handloom (Local) | Each |
| 10. Women's underwear | Synthatic Printed (Imported) | Each |
| | 1. Local (Senorita/Velona) | Each |
| | 2. Imported (Apple/Moffi) | Each |
| 12. Children's dress | 1. Baby suits (Sleeveles vest & Short trouser) | Each |
| | 2. Girls frock (6-10 years) | Each |
| | 3. Boys T-Shirt & Shirt (Age 6-8) | Each |
| Tailoring Charges | 1. Shirt - long sleeves | Each |
| | 2. Shirt - short sleeves | Each |
| | 3. Trousers - long | Each |
| | 4. Trousers - short | Each |
| | 5. Sarong - single | Each |
| | 6. Sarong - double | Each |
| 1. Shoes and Sandals | Shoes | |
| | 1. Mens dress shoes | |
| | Dress shoes - Bata | 1 Pair |
| | Dress shoes - DSI | 1 Pair |
| | 2. Boys school shoes - DSI | 1 Pair |
| | 3. Girls school shoes | 1 Pair |
| | Sandals/Slippers | 1 Pair |
| | 4. Sandals - Ladies | 1 Pair |
| | 5. Rubber slippers | 1 Pair |
| | **Group 4 - Total** | **12** |
| 1. Rent | 1. Rent (Actual) | |
| 1. Materials and Maintenance | 1. Paints | |
| | (i) Enamel - CIC | 41 |
| | (ii) Emulsion - CIC | 41 |
| | 2. Cement - Holcim | 50kg |
| | 3. Bricks (Engineering Brick) | 1000 Nos |
| | 4. Sand (River) | 1 Cube |

| *Commoditics* | *Item* | *Unit* |
|---|---|---|
| 1. Water bills | 1. Water bill | 20 Unit |
| 1. Electricity | 1. Electricity | 67 Unit |
| 1. Gas | 1. Prices for 12.5kg cylinder | |
| | Shell | 12.5kg |
| | Laugfs | 12.5kg |
| Liquid fuels | 1. Kerosene oil | 1l |
| 1. Firewood | 1. Firewood | 50kg |
| | **Group 5 -Total** | **34** |
| 1. Almyrahs | 1. Solid wood - Teak | Each |
| | 2. Steel - Damro | Each |
| 2. Chairs | 1. Armchair - solid wood | Each |
| | 2. Armchair - Plastic (Damro) | Each |
| | 3. Dinning chair - solid wood | Each |
| | 4. Dinning chair - plastic (Damro) | Each |
| 3. Mattress | 1. Form - Single layer - Double bed (Damro) | Each |
| 4. Beds | 1. Double bed - solid wood (Teak) | Each |
| 1. Mosquito nets | 1. Duro (Double) | Each |
| 2. Material for curtains Furnishing | 1. For windows - Local lace (120˝) | 1m |
| | 2. For doors - printed - imported (60˝) | 1m |
| 3. Bed sheets | 1. Double - Handloom (72˝x 90˝) | Each |
| 1. Refrigerators | 1. Sisil (Model No. SL—KR 72V) | Each |
| 2. Cookers (Kerosene / Gas / Electric) | 1. Gas - Imported (Cornel Double) | Each |
| | 2. Kerosene - India (Pigeon 21) | Each |
| 3. Washing machines | 1. Washing machines - Sisil (Model No. SL - WM55) | Each |
| 1. Plastic ware | 1. Plastic bucket (5l) | Each |
| | 2. Plastic basin (Dia. 15˝) | Each |
| 2. Aluminum ware | 1. Sauce Pan (2 l) | Each |
| | 2. Cooking pot (3 l) | Each |
| | 3. Frying pan - Non stick (Kanchan) | Each |
| 3. Glass ware | 1. Drinking glass (Height 15 cm) | Each |
| | 2. Feeding bottle (Farlin) | Each |
| 1. Electric bulbs | 1. Phillips/best - 60W | Each |
| 2. Dry cell batteries | 2. Eveready/Laxapana 1.5V | Each |
| 1. Washing soap | 1. Sunlight | 130g |
| 2. Washing powder | 1. Rin | 500g |
| 3. Mosquito coils | 1. Mortein - normal | 1Pkt. |
| 4. Candles | 1. 4˝ normal 40 Nos | 1Pkt. |
| 5. Matches | 1. Soorya | Each |
| 6. Detergents/disinfectants | 1. Harpic (Powder) 500g | Each |
| 1. Laundry Charges | 1. Shirt | Each |
| | 2. Trouser | Each |
| | 3. School Uniform) | Each |
| | **Group 6 -Total** | **14** |

| *Commoditics* | *Item* | *Unit* |
|---|---|---|
| 1. Purchase of medical & Pharmaceuticals | 1. Panadol | Each |
| | 2. Disprin | Each |
| | 3. Peyawa 30g | Each |
| | 4. Plaster | Each |
| | 5. Dettol | 500ml |
| | 6. Eau de cologne | 100ml |
| | 7. Gripe water | 1 bot. |
| 1. Corrective Eyeglass | 1. Plastic lenses (Bifocal, Low powerful lenses<0.1) | 1 pair |
| | 2. Glass lenses (Bifocal, Low powerful lenses<0.1) | 1 pair |
| 1. Fees to private medical practice including Medicine | 1. Family Doctor | 1 person |
| 2. Consultation fees to specialists | 1. General Physician (3 Channeling Centers) | 1 person |
| | 2. Payments to private hospital Charges, Room charges (Nawaloka Private hospitals) | 1 day |
| 1. Payments to medical Lab test analysis | 1. Standard blood test (WBC) | Each |
| 2. Other health expenses | 1. X –Ray - Chest (Normal) | Each |
| | **Group 7 -Total** | **23** |
| 1. Motorcycles/Scooters | 1. Motorcycles (Bajaj) | Each |
| 1. Tyres/tubes and spare Parts | 1. Tyres (24 ˝ & 18˝) D.S.L. | Each |
| | 1. Tubes (24 ˝ & 18˝) D.S.L. | Each |
| 1. Petrol and other fuels | 1. Petrol 90 Octain | 1l |
| | 2. Diesel - (IOC, Ceypetco) | |
| | IOC | 1l |
| | Ceypetco | 1l |
| 2. Lubricating/gear and brake oil | 1. Engine oil - Petrol, SAE 40 CALTEX | 1l |
| | 2. Engine oil - Diesel DS 40 CALTEX | 1l |
| | 3. Brake oil - CALTEX DOT 3.0 | 1l |
| 1. Repair charges or spare parts and accessories | 1. Brake repair - replacing of brake pads | |
| | Car | Each |
| | Motor Cycle | Each |
| | 2. Tube repair (Vulcanizing/Punch) - Motorcycle & Car | |
| | Tube repair (Vulcanizing) Motorcycle | Each |
| | Tube repair (Vulcanizing) Car | Each |
| | Tube less repair Car | Each |
| 2. Cost of servicing of Vehicles | 1. Motorcycle /Car | Each |
| 1. License and Insurance Fees | 1. License - Motorcycles/Cars (3rd Party) | |
| | 2. License - Cars (3rd Party) | |
| | 3. Insurance - Motorcycles/Cars (3rd Party) | |
| | 4. Insurance - Cars (3rd Party) | |

| *Commoditics* | *Item* | *Unit* |
|---|---|---|
| 1. Train/Bus (Other than schooling) | 1. Train fair<br>2. Bus fair | <br>1 section |
| 1.Taxi and Three Wheelers | 1. per. 5 km | |
| 1. Transport charges for schooling | Transport charges for schooling | 1 children |
| | **Group 8 -Total** | **5** |
| 1. Postal and Telegraph charges | 1. Post card<br>2. Post (normal)<br>3. Aerogrames | Each<br>Each<br>Each |
| 1. Telephones | Normal Mobile Phone (NOKIA) | Each |
| 1. Telephone charges | SLT (up to 200 units) | 200 units |
| | **Group 9 -Total** | **21** |
| 1. Television and Video Decks | 1. 14˝/ 21˝ (Sony, LG, Pansonic)<br>14˝ - Television<br>(Model No. SET - 1427)<br>21˝ - Television<br>(Model No. SET - 2127) | <br>Each<br><br>Each |
| 1. Personal Computer | 1. Personal Computer | Each |
| 1. Maintenances of radio receivers TVs | 1. TV - Replacements of circuit board<br>2. Fly back transformers<br>3. Radio-Replacement of IC | |
| 1. Toys | 1. Building blocks<br>2. Car with battery<br>3. Doll (normal) | Each<br>Each<br>Each |
| 2. Sports | 2. Swimming pool & Gym (Member ship) | |
| 2. Social activities/ ceremonies | 1. Cinema rates<br>ODC:<br>1 St class :<br>1. Photo print charges (Size 3R Matt paper) | <br>1 Person<br>1 Person<br>Each |
| 1. Lotteries/Betting's | 1. Mahajana Sampatha<br>2. Wasana Sampatha | Each<br>Each |
| 1. Books/Newspapers /Magazines | 1. Books-Novel (175-200 Pages)<br>2. Newspapers<br>1. Daily News<br>2. Dinamina<br>3. Thinakaran<br>3. Magazines - Muthuhara<br>Pariganaka | Each<br>Each<br><br><br><br>Each<br>Each |
| 1. Package holidays | 1. Hotel charges (No AC Double room) | 1 Day |
| | **Group 10 -Total** | |
| 1. Tuition fees | 1. O/L-English, Maths, Science<br>2. A/L-Fees for 3 subjects<br>Science/Maths<br>Art/Commerce | 1 Student<br><br>1 Student<br>1 Student |
| 1. Higher eduction | 1. Registration fees for Charted Acc:Institute | 1 Person |
| 2. Exercise books and stationaries | 1. Exercise books (80 pg)<br>2. Graph books (40 pg)<br>3. Drawing books (20 pg)<br>4. Foolscap papers (1dz) | Each<br>Each<br>Each<br>Eac |
| 3. School facility fees (Government) | 1. SFF (Government) | 1 Children |
| 4. School Fees (Private) | 5. School fees (Private) | 1 Children |
| 1. Vocational training | 1. Computer Diploma Course (IDM) | 1 Children |
| | **Group 12 -Total** | |
| 1. Hair dressing and shaving charges | 1. Hair cut charges<br>Adult<br>Child<br>2. Shaving charges | <br>1 Person<br>1 Person<br>1 Person |
| 2. Beauticare/Cookery and Dress making | 1. Beauty culture (Facial- standard/with clean up) | 1 Person |
| 1. Toilet soap | 1. Lux<br>2. kohomba<br>3. Lifebuoy | Each<br>Each<br>Each |
| 2. Tooth paste | 1. Clogard (120g)<br>2. Signal (70g) | Each<br>Each |
| 3. Shaving goods | 1. Racer (Gillette II)<br>2. Shaving Cream (Morning pride-50g) | Each<br>Each |
| 4. Perfumes | 1. For men's (Black knight)<br>2. For lady's (Gooya)<br>3. For Lady's (Voodoo) | Each<br>Each |
| 5. Powder | 1. Gooya<br>2. Black knight | Each<br>Each |
| 6. Face cream & Lotions | 1. Lacto Calamine<br>2. Nevea Tin | Each<br>Each |
| 7. Tooth brushes | 1. Denta<br>2. Signal | Each |
| 1. Jewelleries | 1. Basic ring-22 karat | Each |
| 2. Clocks/watches | 1. Alarm Quarts clocks<br>2. Wrist watch (Q & Q) | Each |
| 1. Hand bags/ Travelling Bags | 1. Lady's hand bag | Each |
| 2. Umbrellas | 1. Walking stick Umbrella<br>Ladies folding umbrella<br>1. Kandurata<br>2. Rainco | Each<br><br>Each<br>Each |
| 1. Insurance | 1. Normal health Insurance (Installtment for Year) | 1 Person |
| 1. Contribution to trade unions, etc. | 1. Clerical Services union | |
| | **Total Items** | **334** |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3-0267/'09-(1), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5-0073/'09-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8-0074/'09-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා දැන් නැඟී සිටිනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, Parliamentary Business Committee එකේ රැස්වීමක් අද කැඳවලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද දහවල් 12.00ට.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඔව්, දහවල් 12.00ට.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බැරිද ඒක දහයහමාරට යොදා ගන්න?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක ප්‍රශ්නයක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාවේ කටයුතු යන හැටියට ඒක ටිකක් කලින් පටන් ගන්න පුළුවන් වාගෙයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒකේ ප්‍රශ්නයක් නැහැ. මට තිබෙන ප්‍රශ්නය මේකයි. අපි ඉල්ලීමක් කළා, අද ඒ Business Committee එකේදී කථා කරන්නේ මොනවාද යන්න පිළිබඳ විස්තර, ඒ programme එක අපට දෙන්න කියලා. මේ වන තුරුත් මට ඒක ලැබිලා නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපටත් ලැබිලා නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ වාගේම අනෙක් පක්ෂවලටත් ලැබිලා නැහැ. එහෙම වුණාම මේවාට පක්ෂ මට්ටමෙන් ගන්න තීරණ මොනවාද කියන එක සම්බන්ධයෙන් අපට පැහැදිලි පිළිතුරක් දෙන්න හම්බ වන්නේ නැහැ. ඒ වාගේම මෙතැනදී නඟන ප්‍රශ්නවලට උත්තර නොදීම පිළිබඳව අපි අද ඒ Business Committee එකේදී කථා කරමු කියා මම යෝජනා කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. මී ළඟට, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය

**தனி அறிவித்தல் மூல வினா**

QUESTION BY PRIVATE NOTICE

## 2008 අපොස (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් මුහුණ පා ඇති ගැටලු

**2008 கபொத (உயர்தர) பரீட்சைக்குத் தோற்றிய மாணவர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்**

PROBLEMS FACED BY STUDENTS AT GCE (A/L) EXAMINATION 2008

**ගරු අනුර දිසානායක මහතා**

(மாண்புமிகு அனுர திஸாநாயக்க)

(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය යොමු කිරීමට අවසර ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

2008 වසරේදී උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන් මුහුණ දී සිටින ගැටලු ගණනාවක් පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවීමට මා අපේක්ෂා කරනවා. මෑත කාලයේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ගැටලු ගණනාවක් උද්ගත වූ බව අප හැම දන්නවා. ඒ එක් එක් අවස්ථාවේදී තාවකාලික විසඳුම් යෝජනා වුවා මිස ප්‍රශ්නයේ මූලයට පිළියම් යෙදීමක් සිදු වුයේ නැහැ. අධ්‍යාපන පරිපාලන ක්‍රියාවලිය තුළ ඇති වී තිබෙන ව්‍යාකූල තත්ත්වයට නිසි පිළියම් නොයෙදීම නිසා දැන් නැවතත් සිසුන්ගේ අධ්‍යාපනය අර්බුදයට යමින් තිබෙනවා. මේ තත්ත්වයට ආසන්නතම උදාහරණය ලෙස, 2008 අගෝස්තු උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන්ගේ ප්‍රශ්නය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල 2009 ජනවාරි මාසයේ 03 වැනි දා නිකුත් වුණා. එම ප්‍රතිඵල මත පදනම්ව ඒ ඒ ශිෂ්‍යයන්ගේ Z ලකුණු ප්‍රමාණය, දිස්ත්‍රික්කය තුළ හා සමස්ත දිවයින තුළ ලැබූ ස්ථාන නිකුත් කර තිබුණා. ඒ නිකුත් කළ තොරතුරු අනුව සිසුන් තමන්ගේ ප්‍රතිඵල ගැන දළ අදහසක් ලබා ගත්තා. ඒ අනුව ඇතැම් අය ස්ථිර වශයෙන්ම තමන් විශ්වවිද්‍යාලයට තේරී ඇති බව නිගමනය කළා. ඔවුන් යළි 2009 උසස් පෙළ විභාගය සඳහා ඉල්ලුම් කළේ නැහැ.

නමුත් මේ නිකුත් වූ ප්‍රතිඵල ගැන සිසුන් තුළ අවිශ්වාසයක් තිබුණා. විභාග දෙපාර්තමේන්තුවේ ඇගැයීම් කටයුතු පිළිබඳ දිගින් දිගටම විවේචන මතු වූ බව අප හැම දෙනාටම මතකයි. මෙවර උසස් පෙළ සිසුන් විශාල ප්‍රමාණයක් විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා ඉදිරිපත් කළා. ඒ නැවත සමීක්ෂණ ප්‍රතිඵල පාසල්වලට ලබා දුන්නේ ජූලි මස ආරම්භයේදී යි. ඒ අනුව නැවත සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස හයක කාලයක් ගත කොට තිබෙනවා. එසේ නැවත සමීක්ෂණය කළ ප්‍රතිඵලවල විශාල වෙනස්කම් සිදු වී තිබෙනවා. ඉන් පසුව පසු ගිය ජූලි මුල් සතියේ විභාග දෙපාර්තමේන්තුව මඟින් නව ප්‍රතිඵල ලේඛනයක් නිකුත් කරනු ලැබුවා, දෙ වැනි වරට. එම දෙ වන ප්‍රතිඵල ලේඛනයේ එක් එක් ශිෂ්‍යයාට අදාළ "Z" ලකුණු, දිස්ත්‍රික් හා සමස්ත ලංකා මට්ටම් වෙනම දක්වා තිබෙනවා. ඒ අනුව පළමු ප්‍රතිඵල ලේඛනයේ සමත් ලෙස දක්වා තිබෙන ඇතැම් සිසුන් දෙ වන ප්‍රතිඵල ලේඛනයේ අසමත් වී තිබෙනවා. ඔවුන්ගේ දිස්ත්‍රික් මට්ටම් විශාල ලෙස වෙනස් වී තිබෙනවා. ඒ අතරින් ඇතැම් සිසුන් යළි විභාගයට ඉල්ලුම් කර නැති සිසුන්. ඒ නිසා ඔවුන්ට නැවත මෙවර විභාගයට පෙනී සිටීමේ අවස්ථාව අහිමි වී තිබෙනවා. පළමු ප්‍රතිඵල ලේඛනය ළඟ තබා ගැනීම වරදක් ලෙස නම් කොට එය යළි ආපසු එවන ලෙස විදුහල්පතිවරුන්ට දන්වා විභාග දෙපාර්තමේන්තුව ජූනි 29 දිනැති ලිපියක් පවා එවා තිබෙනවා.

කෙසේ වෙතත් නැවත සමීක්ෂණයේදී ප්‍රතිඵල විශාල ලෙස වෙනස් වීමට අධ්‍යාපන අමාත්‍යාංශය වග කිව යුතු බව පැහැදිලියි. පළමු ප්‍රතිඵල ලේඛනය හා දෙ වන ප්‍රතිඵල ලේඛනය අතර වෙනස්කම් ඇති වීමටත් අධ්‍යාපන අමාත්‍යාංශය වග කිව යුතුයි. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශ පරිපාලනයේ ඇති වී තිබෙන මේ ව්‍යාකූලත්වය හා අසමත්කම නිසා ශිෂ්‍ය ජීවිත අර්බුදයට ගොස් තිබෙනවා. ඒ නිසා පහත ප්‍රශ්න පිළිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමා, මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි මා අපේක්ෂා කරනවා.

1. 2008 උසස් පෙළ විභාග ප්‍රතිඵල පළමු වර සමීක්ෂණයේදී එම සමීක්ෂණ කටයුතු විධිමත් ලෙස සිදු වී ඇති බවට ඔබතුමාට සහතික විය හැකිද?
2. එසේ නැති නම් සමීක්ෂණයේ සිදු වූ දුබලතා පිළිබඳව ගෙන ඇති පියවර ගැන ඔබතුමා මෙම ගරු සභාව දැනුවත් කරන්නේද?
3. ප්‍රතිඵල සමීක්ෂණය නියමාකාරයෙන් සිදු වූයේ නම් නැවත සමීක්ෂණයේ ප්‍රතිඵල මෙතරම් වෙනස් වන්නේ කෙසේද?
4. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට මාස පහක කාලයක් ගත වූ තත්ත්වයක් තුළ නැවත සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් වීමට මාස හයක් ගත වීමට හේතුව කුමක්ද?
5. මීට පෙර නැවත සමීක්ෂණයෙන් පසු දෙ වන ප්‍රතිඵල ලේඛනයක් නිකුත් නොකර මේ වසරේදී පමණක් එසේ කිරීමට හේතුව කුමක්ද?
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ දුබලතාව නිසා අසාධාරණයට ලක් වූ සිසුන් සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා පියවර කුමක්ද?
7. ප්‍රතිඵල සම්බන්ධයෙන් ව්‍යාකූලත්වයක් මතු වී තිබියදීත් දෙ වන ප්‍රතිඵල ලේඛනය මත පදනම්ව විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීම් සිදු කිරීමට තරම් ඉක්මන් වීමට හේතුව කුමක්ද?

උක්ත ප්‍රශ්නවලට ඔබතුමා මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි අපේක්ෂා කරනවා. ඒ වාගේම අසාධාරණයට ලක් වී ඇති සියලු සිසුන්ට සාධාරණය ඉටු කිරීමේ කෙටි කාලීන පියවරයන් පිළිබඳව සාකච්ඡා කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිනවා. පොදුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේත්, විශේෂයෙන් විභාග දෙපාර්තමේන්තුවේත් මෑත කාලීනව ඇති වෙමින් තිබෙන අකාර්යක්ෂමතාවන්ට හා දුබලතාවන්ට දිගු කාලීන පිළිතුරක් සැපයීම කෙරෙහි ද මෙම ගරු සභාවේ අවධානය යොමු කර සිටිනවා. 2008 වසරේ උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීමට ගරු අධ්‍යාපන ඇමතිතුමා ප්‍රමාණවත් පියවරක් ගනු ඇතැයි මම අපේක්ෂා කරනවා. ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சர்)

(The Hon. A. D. Susil Premajayantha - Minister of Education)

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් මේ අවස්ථාවේදී ඔබතුමාගේ අවධානයටත්, පාර්ලිමේන්තුවේ අවධානයටත් යොමු කරන ලද කරුණු සම්බන්ධයෙන් හා එහිදී මතු කරන ලද සියලුම ප්‍රශ්න සම්බන්ධයෙන් පිළිතුරු මා දැන් ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, අපොස (උසස් පෙළ) 2008 විභාගයේ ප්‍රතිඵල 2009 ජනවාරි මස 03 දින නිකුත් කළ අතර ඒ සමඟ සිසුන් ලැබූ ශ්‍රේණි, "Z" අගය, දිස්ත්‍රික් කුසලතා යන තොරතුරු ද එහි අඩංගු කර තිබෙනවා. එහි දක්වා ඇති දිස්ත්‍රික් කුසලතාව කිසි සේත් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා නොගන්නා බව පැහැදිලිවම දක්වා තිබෙනවා. මෙය පසු ගිය වසර ගණනාව තිස්සේම විදුහල්පතිවරුන් දැනුවත් කරන ලද කරුණක්. ඇමුණුම 1 මඟින් මෙය සනාථ කරනවා. එය **සභාගත*** කරනවා.

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***

*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

*Produced at end of speech.*

[ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මා උදාහරණයක් ඉදිරිපත් කරන්නම්. ඇමුණුම 1 හි 8 වන තීරුව යටතේ "***දිස්ත්‍රික් කුසලතාව" හා "***දිවයිනේ කුසලතාව" යන්නෙන් ශීර්ෂ දෙකක් සඳහන් වනවා. ඇමුණුම 1 හි පහළ සටහනක් වශයෙන් සඳහන් කර තිබෙනවා, "***8 තාවකාලිකව දක්වා ඇති කුසලතා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අදාළ නොවේ" කියලා.

ගරු කථානායකතුමනි, දෙ වැනි කාරණය මේකයි. පාසල් ප්‍රතිඵල ලේඛනයේ ද, පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල සටහන්වල ද පැහැදිලිවම දක්වා ඇත්තේ නැවත සමීක්ෂණ ක්‍රියාවලියෙන් පසු එක් එක් අයදුම්කරු ලබා ඇති "Z " අගය වෙනස් වීමට ඉඩ තිබෙන බවයි. විදුහල්පතිවරුන් වෙත යවන ලද ආවරණ ලිපියේ පිටපතක් ඇමුණුම 2 වශයෙන්ද, පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රතිඵලවල සටහනක් ඇමුණුම 2.1. වශයෙන් ද හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා මා මේ සමඟ **සභාගත*** කරනවා.

ඇමුණුම 2 ලෙස ඉදිරිපත් කර ඇත්තේ සියලුම විදුහල්පතිවරුන් වෙත යවන ලද ආවරණ ලිපියයි. එම ලිපියේ 2.5හි මෙසේ සඳහන් කර තිබෙනවා:

"7 වන අංකය සහිත තීරුවෙන් සාමාන්‍ය 'Z' ලකුණ දක්වා ඇති අතර 'M' සංකේතයෙන් දක්වන්නේ සෘණ අගයයි. මෙම 'Z' ලකුණ නැවත සමීක්ෂණයෙන් පසු වෙනස් විය හැකිය."

ප්‍රතිඵල ලේඛනය සමඟ මේ පිළිබඳ සියලුම විදුහල්පතිවරුන් දැනුවත් වෙලා තිබෙනවා. විභාග දෙපාර්තමේන්තුව මඟින් පෞද්ගලික අයදුම්කරුවන්ට ප්‍රතිඵල යවන ලේඛනයේ, එම ප්‍රතිඵල සටහනේ පැහැදිලිව දක්වා තිබෙනවා මෙහි සඳහන් සාමාන්‍ය "Z" ලකුණ නැවත සමීක්ෂණයෙන් පසුව වෙනස් විය හැකිය කියා. එහි පාදයේ සටහන් කර තිබෙනවා, "තාවකාලිකව දක්වා ඇති කුසලතාවන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අදාළ නොවේ" යන්න. පාසල් අයදුම්කරුවන්ට පාසලට යවන ප්‍රතිඵල ලේඛනයේ සහ විදුහල්පතිට යවන ආවරණ ලිපිය අනුවත්, පෞද්ගලික අයදුම්කරුවන්ට යවන ප්‍රතිඵල සටහනේත් පැහැදිලිවම ලිඛිතව දක්වා ඇත්තේ ප්‍රතිඵල ලේඛනයේ සටහන් කර තිබෙන්නා වූ "Z" අගය පදනම් කර ගෙන දිස්ත්‍රික් සහ දිවයිනේ කුසලතාවන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අදාළ නොවන බවයි; නැවත සමීක්ෂණයෙන් පසුව එය වෙනස් විය හැකි බවයි. ඒ නිසා සෑම අයදුම්කරුවෙක්ම, සෑම විදුහල්පතිවරයෙක්ම මේ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කර තිබෙනවා.

ඉහත කරුණු හේතු කොට ගෙන පැහැදිලි වන කරුණ නම් දිස්ත්‍රික්ක කුසලතාව හෝ "Z" අගය හෝ කල් වේලා ඇතිව දැන ගැනීම තමා කිසියම් විශ්වවිද්‍යාලයකට හෝ පාඨමාලවකට අනිවාර්යයෙන්ම සුදුසුකම් ලබන්නේය යන්න පිළිබඳව ස්ථිර නිගමනයකට එළැඹිය නොහැකි බවයි. එය තීරණය වනුයේ ඒ ඒ පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍ර ප්‍රමාණය හා නැවත සමීක්ෂණයෙන් පසු සකස් කරන නව "Z" අගය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් සකස් කරනු ලබන දිස්ත්‍රික් කුසලතා ලේඛනය මතයි. විභාගයට පෙනී සිටින සිසුන් සංඛ්‍යාව සාමාන්‍යයෙන් 2,40,000ක් වුවත් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කරනු ලබන්නේ 46,000ක් පමණයි.

නැවත සමීක්ෂණය සඳහා විභාග දෙපාර්තමේන්තුව ඉල්ලුම් පත් භාර ගැනීමේ අවසාන දිනය 2009.01.28 වන දින වුණා. ඒ අනුව 2009.02.15 දින වන විට ඉල්ලුම් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවට ලැබුණා. ප්‍රශ්න පත්‍රවල I වන කොටස, II වන කොටස සහ III වන කොටස වශයෙන් උත්තර පත්‍ර වෙන් කර පරීක්ෂා කළ යුතුයි. මෙම උත්තර පත්‍ර ඒ ඒ මධ්‍යස්ථාන පැකට්වලින් නිසි පරිදි ඉවත් කර, සෑම පිටුවක් පාසාම රහස්‍ය මුද්‍රා තබා, එක් එක් විෂයයට සහ මාධ්‍යයට අනුව අංකනය කර, පැකට් වශයෙන් සකස් කර නැවත සමීක්ෂණ ඇගැයීම් ක්‍රියාවලියට සම්බන්ධ වන විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය වෙත යැවීමේ වැඩ පිළිවෙළ සඳහා පමණක් දින 40ක පමණ කාලයක් සෑම වසරකම ගත වනවා.

නැවත සමීක්ෂණය සඳහා මාර්තු මස සිට පේරාදෙණිය, කොළඹ, ජයවර්ධනපුර, කැලණිය, රුහුණ, වයඹ, සබරගමුව, මඩකළපුව සහ යාපනය යන විශ්වවිද්‍යාලවල ඒ ඒ විෂයයට සම්බන්ධ වූ ආචාර්ය සහ මහාචාර්යවරුන් යොදා ගැනීමට කටයුතු කළා. මෙම ක්‍රියාවලිය මෙම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන්නේ විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු සිදු කරන අතර තුරදීයි. ඒ අනුව මැයි මස අග සතිය වන විට විශ්වවිද්‍යාලවලින් නැවත සමීක්ෂණය කරන ලද උත්තර පත්‍ර හා ලකුණු විභාග දෙපාර්තමේන්තුවට ලැබුණා. එතැන් පටන් නැවත සමීක්ෂණ ප්‍රතිඵල ලේඛන සකස් කිරීම, නැවත සමීක්ෂණ ලකුණුවලට අනුකූලව මුල් දත්ත පාදකය සංශෝධනය කිරීම යනාදිය විභාග දෙපාර්තමේන්තුව විසින් ඉටු කළා. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත 2009.06.24 වන දින සංශෝධිත CD තැටිය භාර දීමට සිදු වුණා.

නැවත සමීක්ෂණ ප්‍රතිඵල හේතු කොට ගෙන කිසියම් ශිෂ්‍යයකුගේ හෝ ශිෂ්‍යයන් කිහිප දෙනකුගේ හෝ මුල් ප්‍රතිඵලයට වඩා අඩු ප්‍රතිඵලයක්, නොඑසේ නම් අඩු ශ්‍රේණියක් ලැබීමට ඉඩකඩ තිබෙනවා. නැවත සමීක්ෂණයෙන් පසු අයදුම්කරුවන්ගේ ලකුණුවල අඩු වීමක් හෝ වැඩි වීමක් හෝ පිළිගන්නා බව ඔවුන්ගේ නැවත සමීක්ෂණ ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු අනුව එකඟ වී තිබෙනවා. මෙය පසු ගිය වසර 20 තුළම විභාග දෙපාර්තමේන්තුව අනුගමනය කළ ක්‍රියා පිළිවෙතයි. නැවත සමීක්ෂණ අයදුම් පත්‍රයේ පිටපතක් මේ සමඟ අමුණා ඇති අතර එය ඇමුණුම 3 වශයෙන් **සභාගත*** කරනවා.

නැවත සමීක්ෂණ අයදුම් පත්‍රයේ - ඇමුණුම 03හි - අංක 7 අයදුම්කරුගේ ප්‍රකාශය යටතේ මේ ආකාරයෙන් සඳහන් වෙනවා:

"...නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන වෙනසක දී ලකුණු සහ ශ්‍රේණියේ අඩුවීමක් හෝ වැඩිවීමක් භාර ගැනීමට ද, නැවත සමීක්ෂණය පිළිබඳ නීතිරීති වලින් බැඳී සිටීමට ද එකඟ වන බව ප්‍රකාශ කරමි."

කිසි යම් අයදුම්කරුවකුට නැවත සමීක්ෂණ ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිට විභාගය ඉල්ලුම් කිරීමට නොහැකි වූ විටෙක එම හේතුව මත ඔහුට විභාගයට ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා දීම පසු ගිය වසර 20 තුළදීම විභාග දෙපාර්තමේන්තුව අනුගමනය කළ අතර මෙවරද එම අවස්ථාව ඔවුන්ට ලබා දීමට කටයුතු සිදු කර තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැවත සමීක්ෂණයේ අවසන් ප්‍රතිඵල ආපු දිනය කවදාද?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டீ. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඒ කියන්නේ විශ්වවිද්‍යාලයෙන් ලැබුණු දිනයද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අවසානයේදී නැවත සමීක්ෂණ ප්‍රතිඵල පාසල්වලට යවන ලද දිනය.

---

* *කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

* *කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
පාසල්වලට යැවෙන්නේ 24.06.2009 වන දින CD තැටිය යවනවාත් සමඟම. ඒ කියන්නේ "Z" අගය. ඊට පෙර තමයි ප්‍රතිඵල යැවෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ජුනි 24 වන දිනද?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
24 වන දිනට පෙර.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ජූලි 03 වන දින තමයි අවසන් ප්‍රතිඵලය ගියේ?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඔව්. කිසි යම් අයදුම්කරුවකුට නැවත සමීක්ෂණ ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිට විභාගය ඉල්ලුම් කිරීමට නොහැකි වූ විටෙක එම හේතුව මත ඔහුට විභාගයට ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා දීම පසු ගිය වසර 20 තුළම විභාග දෙපාර්තමේන්තුව අනුගමනය කළ ක්‍රියා පිළිවෙතයි. මෙවරද නැවත සමීක්ෂණය ඉල්ලුම් කළ ඕනෑම අපේක්ෂකයකුට 2009 අපොස (උසස් පෙළ) විභාගය සඳහා ඉල්ලුම් කිරීමට ඉඩකඩ ලබා දී තිබෙනවා.

විශ්වවිද්‍යාලයට තෝරා ගැනීමේ දිස්ත්‍රික්ක කුසලතාව තීරණය කරනු ලබන්නේ විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රතිඵල ලේඛනය අනුව නොව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් සකස් කරනු ලබන දිස්ත්‍රික් කුසලතා ලේඛනය අනුවයි. ඒ නිසා විභාග දෙපාර්තමේන්තුව විසින් මුල් අවස්ථාවේ දී නිකුත් කර ඇති දිස්ත්‍රික් කුසලතාව හෝ "Z" අගය හෝ විශ්වවිද්‍යාලයට බඳවා ගැනීමේ නිර්ණායක නොවන බව මේ අනුව පැහැදිලි වනවා.

මුල් අවස්ථාවේ දී විදුහල්පතිවරුන් වෙත යවන ලද ප්‍රතිඵල ලේඛනය ඔවුන් වෙත රඳවා නොගෙන විභාග දෙපාර්තමේන්තුවට ආපසු එවන ලෙස දන්වා ඇත්තේ පරිගණක මුද්‍රිත සංශෝධිත නව ප්‍රතිඵල ලේඛනයක් ඔවුන් වෙත යැවීම නිසායි. මෙසේ ගෙන්වා ගනු ලබන්නේ වැරදීමකින් හෝ විදුහල්පතිවරයා විසින් පැරණි ප්‍රතිඵල ලේඛනය උපයෝගී කර ගෙන යම් අයදුම්කරුවකුට ප්‍රතිඵල සටහනක් ලබා දීම වැළැක්වීම සඳහායි.

මෙය ඇමුණුම 04න් දක්වා තිබෙනවා. ඇමුණුම 04 මඟින් සියලුම විදුහල්පතිවරුන්ට මේ විධියට දැනුම් දී තිබෙනවා:

"නැවත සමීක්ෂණයෙන් පසු ප්‍රතිඵල වෙනස් වීම් මුල් ප්‍රතිඵල ලේඛනයට ඇතුළත් කිරීමේ දී ඇතැම් විදුහල්පතිවරුන් මාගේ උපදෙස් පරිදි ක්‍රියා නොකිරීම හේතුවෙන් අවස්ථා කිහිපයක දී ගැටලු පැන නැඟී තිබූ බැවින්, මුල් ප්‍රතිඵල ලේඛනයේ සංශෝධන ඇතුළත් කිරීම වෙනුවට සංශෝධිත පරිගණක ප්‍රතිඵල ලේඛනයක් ඔබ වෙත එවීමට මෙවර කටයුතු යොදා ඇත."



ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් යොමු කරන ලද ප්‍රශ්න එකිනෙකට මම පිළිතුරු ඉදිරිපත් කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, විවාදයක් පවත් වනවා නොවෙයි. මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ මෙහෙමයි. ජනවාරි මාසයේ ප්‍රතිඵල නිකුත් කරනවා. ඒ අනුව ළමයි ප්‍රතිඵල දැන ගන්නවා. දැන් මේ ප්‍රශ්නය කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් මතු වෙලා තිබෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඔව්. ඒකෙන් ඒ අය දළ අදහසක් ඇති කර ගන්නවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ලැබෙන ප්‍රතිඵල ලේඛනය අනුව තමන් ඉන්නේ දිස්ත්‍රික්කයේ එකද, දෙකද, තුනද, හතරද කියන එක මත පදනම්ව ඒ අය විශ්වවිද්‍යාලයට සමත් වෙලා තිබෙනවාය කියා තීරණය කරනවා. මොකද, එවැනි දළ අදහසක්වත් ඒ ප්‍රතිඵල ලේඛනයෙන් ගන්න බැරි නම්, ළමයි ඒ ප්‍රතිඵල ලේඛනය බලන එකේ තේරුමක් නැහැ නේ. ප්‍රතිඵල ආවා යයි කියලා ළමයි බලන්නේ ඔය පළමුවෙන් එන ප්‍රතිඵල ලේඛනයයි. විභාග ප්‍රතිඵල තිබෙනවා. "මම විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලබලා තිබෙනවා" කියලා ඒකෙන් තමයි ළමයි සතුටට පත් වෙන්නේ. සාමාන්‍යයෙන් අපේ දිස්ත්‍රික්කයෙන් වෛද්‍ය පීඨයට ගන්නේ ළමයින් 22ක් නම්, "මම දහ වැනියාට ඉන්නවා. ඒ නිසා මට වෛද්‍ය පීඨයට යන්න පුළුවන්" කියන විශ්වාසය ඒ දරුවන් ඇති කර ගන්නවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
අනිවාර්යයෙන් ඇතුළත් වනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ එතැන නොවෙයි. ඊට පස්සේ විශාල සිසුන් ප්‍රමාණයක් ප්‍රතිඵල නැවත සමීක්ෂණයට ඉල්ලා සිටියා. එතකොට ඒ ගොල්ලන්ගේ ප්‍රතිඵල අඩුවෙනුයි තිබුණේ. ඊට පස්සේ නැවත සමීක්ෂණයට ඉල්ලා සිටි ළමයින් අනෙක් ළමයින් ඉක්මවා ඉදිරියට ඇවිල්ලා තිබෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
වෙන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතකොට අර තමන් වෛද්‍ය පීඨයට තේරේවි, විශ්වවිද්‍යාලයට තේරේවි කියන විශ්වාසයෙන් හිටපු ළමයින්, පසු පසට ගිහිල්ලා තිබෙනවා. දැන් ඔවුන් කිසිදු විශ්වවිද්‍යාලයකට යෝජනා වෙන්නේ

[ගරු අනුර දිසානායක මහතා]

නැහැ. ඔවුන් ඊළඟ වාරයේ උසස් පෙළ විභාගයට ඉල්ලුවේත් නැහැ. මොකද, උසස් පෙළ විභාගයට ඉල්ලන්න හේතුවක් නැහැ, පළමු වන ප්‍රතිඵල ලේඛනය අනුව ඔවුන් විශ්වවිද්‍යාලයට තේරෙනවාය කියා දන්නවා. ඒ නිසා ඔවුන් විභාගයට ඉල්ලුවේත් නැහැ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
මම ඒකට උත්තරයක් දෙන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දෙ වන ප්‍රතිඵල ලේඛනය ජූනි මාසයේ නිකුත් කරනවා. එතකොට ජූනි මාසයේ තමයි ළමයින් දැන ගන්නේ, "අනේ මාව පළමු වන ප්‍රතිඵල ලේඛනය අනුව විශ්වවිද්‍යාලයට තේරිලා තිබුණාට, දෙ වන ලේඛනය අනුව විශ්වවිද්‍යාලයට තේරෙන්නේ නැහැ"යි කියලා. ගරු කථානායකතුමනි, ඒ අනුව වෛද්‍ය පීඨයට තේරුණා යයි උපකල්පනය කරලා හිටපු ළමයින්ට අද කිසිදු විශ්වවිද්‍යාලයක් නැහැ. ඒ ළමයින්ට කිසිදු විශ්වවිද්‍යාලයක් ලැබෙන්නේ නැතුවා පමණක් නොවෙයි නැවත විභාගයට ඉල්ලන්න කාලයකුත් නැහැ. මොකද, විභාගය තිබෙන්නේ අගෝස්තු මාසයේ. ප්‍රතිඵල එන්නේ ජනවාරි මාසයේ. ජනවාරි මාසයේ එන ප්‍රතිඵලවලින් ඒ ළමයි තීන්දු කරනවා, තමන් සමත් වී තිබෙනවාය කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා ප්‍රකාශය කරලා ඉවර ද?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
නැහැ. නැහැ. මේකට පිළිතුරු දෙන්න ඔබතුමා මට ඉඩ දෙනවා ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ජූනි මාසයේ අවසන් ප්‍රතිඵලය අනුව තමන් විශ්වවිද්‍යාලයට තේරෙන්නේ නැහැයි කියලා දකින කොට අගෝස්තු මාසයේ විභාගයට ලියන්නත් බැහැ, විභාගයට ඉල්ලුම් පත්‍ර-

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමාට පිළිතුරු දෙන්න ඉඩ දෙන්න.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මගේ පිළිතුර තවම අවසන් නැහැ. ගරු මන්ත්‍රීතුමාට ඒ ප්‍රශ්නයටත් මම පිළිතුරක් දෙන්නම්.

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්න මාලාවේ පළමු වන ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. එතුමා අහලා තිබෙන පළමු වන ප්‍රශ්නය තමයි-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා අන්තිමට ප්‍රශ්න අහලා තිබෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ප්‍රශ්න හතක් අහලා තිබෙනවා. මම දැන් ඒවාට පිළිතුරු දෙනවා.

1. ඔව්.
2. අවශ්‍ය නොවේ. තම ප්‍රතිඵල ගැන සෑහීමට පත් නොවන්නේ නම් නැවත සමීක්ෂණයකට අවස්ථාව ලබා දී තිබුණි.
3. එසේ විශාල ලෙස වෙනස්වීමක් සිදු වී නොමැත.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තිබෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඉන්න. තිබෙන අයට නැවත අවස්ථාව දීලා තිබෙනවා.

නැවත සමීක්ෂණයෙන් පසු ශ්‍රේණි වෙනස් වීම, ඉල්ලුම් කළ සංඛ්‍යාවෙන් සිදු වී ඇත්තේ සියයට 1.28කට පමණි. ඉල්ලුම් කරන ලද සංඛ්‍යාවෙන් ප්‍රතිඵල වෙනස් වෙලා තිබෙන්නේ සියයට 1.28කිනුයි. ගරු කථානායකතුමනි, මේ වර්ෂය වන තෙක් සිදු වුණු ක්‍රියාවලිය තමයි නැවත සමීක්ෂණයේ ප්‍රතිඵල -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ළමයි කී දෙනෙක් ඉල්ලා -

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
මට පැහැදිලි කරන්න ඉඩ දෙන්න. ගරු කථානායකතුමනි, මෙතෙක් පැවැති ක්‍රමය තමයි නැවත සමීක්ෂණයේ ප්‍රතිඵල යැව්වාම ඒ ප්‍රතිඵලය අදාළ වන අයගේ පමණක් ප්‍රතිඵල "Z"

අගයට සකස් කිරීම. නමුත් ඒ ක්‍රමය පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව මේ වර්ෂයේ යම් ක්‍රියා පිළිවෙතක් අනුගමනය කර තිබෙනවා. උදාහරණයක් වශයෙන් අයදුම්කරුවකු 'සී' සාමාර්ථයක් ලබා තිබෙන යම් විෂයයකට "බී" සාමාර්ථයක් ලැබෙනවා. එතකොට ඒ ප්‍රතිඵලය එම ශිෂ්‍යයාට පමණක් නොවෙයි බලපාන්නේ. මොකද විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව බලන්නේ "Z" අගයයි. ඒ නිසා එයට අදාළව සෑම ශිෂ්‍යයකුගේම ඒ ප්‍රතිඵලවල අවසාන decimals දෙකේ -දශමස්ථානවල අවසාන අංක දෙකෙහි- උදාහරණයක් ලෙස 1.7583 වනවා නම් 1.75න් පසුව එන අටයි, තුනයි කියන ඉලක්කම් දෙකෙහි යම් වෙනස්කමක් ඇති වෙන්න පුළුවන්. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ප්‍රතිඵල සකස් කිරීමේදී ඒක ලොකු වෙනසකට බලපාන්නේ නැහැ. ඒ කාරණය මෙවර පළමු වතාවට සිදු වෙලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් සිසුන් 10 දෙනෙකුගේ ප්‍රතිඵල වෙනස් වුණොත් ඊට අනුරූපව "Z" අගය වෙනස් වීම, ඊට අදාළව ඊට වඩා වැඩි සංඛ්‍යාවකගේ අවසාන දශම ස්ථාන දෙකේ විය හැකියි. විශාල පිරිසකගේ ප්‍රතිඵල නැවත සංශෝධනය වුණාය කියා ඒක වරදවා වටහා නොගත යුතුයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාවලිය අනුව කුසලතාව සහ ජාතික මට්ටමෙන් තෝරා ගැනීමේදී අර වෙනස් කිරීම සිදු කරන නිසා ප්‍රතිඵල සංශෝධනය නොවී "Z" අගය වෙනස් වීමක් අවසාන දශමස්ථාන දෙකේ විය හැකියි.

4. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ගත වී ඇත්තේ මාස 5ක් නොව මාස 4කි. නැවත සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ගත වී ඇත්තේ මාස 6ක් නොව මාස 4 දින 9කි. මීට වඩා අඩු කාලයකදී නැවත සමීක්ෂණ ක්‍රියාවලිය අවසන් කිරීමට ප්‍රායෝගිකව ඉඩකඩක් නැත. ඊට හේතුව මේකයි. ගරු කථානායකතුමනි, උසස් පෙළ සෑම ප්‍රශ්න පත්‍රයකම 1 වන සමීක්ෂණය සිදු වන්නේ ප්‍රවීණ ගුරුවරුන්ගෙන් වුවත්, ඒ සෑම panel එකක්ම භාරව විශ්වවිද්‍යාලවල සහකාර කථිකාචාර්යවරයෙක් ඉන්නවා. ඊට ඉහළ මට්ටමෙන් ඒ අවස්ථාවේදීම කරන නැවත පරීක්ෂණයේදී -ඒ ශාලාවේදීම සිදු වන පරීෂණයේදී- තවත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් ඉන්නවා. අවසාන වශයෙන් ඒ ප්‍රශ්න පත්‍රය සකස් කරන ලද විශ්වවිද්‍යාල මහාචාර්යවරයාගේ අධීක්ෂණය යටතේ තමයි 1 වන සමීක්ෂණයත් සිදු වන්නේ. 2 වන සමීක්ෂණයේදී සිදු වන්නේ සෑම ප්‍රශ්න පත්‍රයක්ම අර මා කලින් කී අන්දමට ඉවත් කරලා අදාළ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට යොමු කිරීමයි. 1 වන සමීක්ෂණයේදී ශාලාවකදී කෙටි කාලයක් තුළ සමීක්ෂණය සිදු වුණත් 2 වන සමීක්ෂණයේදී ඒ ඒ විශ්වවිද්‍යාලවලට ගියාම, ඊට වඩා වැඩි කාලයක් ගත වනවා. මොකද, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් තමන්ගේ අනිකුත් කටයුතු කරන අතරේ තමයි ඒ සමීක්ෂණය සිදු කරන්නේ. ඒ කාල සීමාව අවම කර ගැනීම ඉතාම අපහසුයි. මොකද, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය මඟිනුයි මේ කාර්යය සිදු වන්නේ.

5. මීට පෙර නැවත සමීක්ෂණයෙන් පසු සංශෝධිත වෙනස්කම් සඳහන් වූ ප්‍රතිඵල ලේඛන පාසල්වලට යවා මුල් ලේඛනය අදාළ සංශෝධන කර ගන්නා ලෙස විදුහල්පතිවරුන්ට උපදෙස් දුන්නත් එසේ සංශෝධිත ප්‍රතිඵල ඇතුළත් කිරීමේදී සිදු විය හැකි අඩු පාඩු මඟ හරවා ගැනීමට මෙවර සංශෝධිත ප්‍රතිඵල ලේඛනයක් යැවීමට පියවර ගන්නා ලදී. ඒ අනුව ප්‍රතිඵල ලේඛන දෙකක් පාසලේ තිබීම මඟින් සිදු විය හැකි දෝෂයන් වළක්වා ගැනීම සඳහා මුල් ලේඛනය නැවත ගෙන්වා ගැනීමට පියවර ගෙන ඇත.

6. එබඳු දුබලතාවක් නොමැත. මේ අනුව කිසිදු සිසුවකුට අසාධාරණයක් වීමට ඉඩ කඩ සලසන්නේ නැත.

7. ප්‍රතිඵල සම්බන්ධයෙන් කිසිදු ව්‍යාකූල තත්ත්වයක් නොමැති අතර පසු ගිය දශක දෙක තුළදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගෙන ඇත්තේ නැවත සමීක්ෂණයෙන් පසුව නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනය පදනම් කර ගෙනය.

තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා 2009.08.02 වන දින දක්වා මාසයක කාලයක් අයදුම්කරුවන්ට ලබා දී ඇත.

ගරු කථානායකතුමනි, මීට අමතරව මෙම ගරු සභාවේ දැන ගැනීම සඳහා මා යම් කරුණක් සඳහන් කළ යුතුව තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමාත් දන්නවා ඇති, මා මෙම අමාත්‍යාංශය භාර ගැනීමටත් පෙර 2005 අප්‍රේල් මාසයේ රසායන විද්‍යාව ප්‍රශ්න පත්‍රයේ බහුවරණ ප්‍රශ්න සම්බන්ධයෙන් OMR machine එකේ සිදු වූ ප්‍රශ්නයක් නිසා පසුව ඒ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වුණේ මටයි. ඒ වන කොට ප්‍රතිඵල නිකුත් වෙලා, නැවත සමීක්ෂණ ප්‍රතිඵල ඇවිල්ලා, "Z" අගය නිකුත් කළාම තමයි ගැටලුව මතු වුණේ. නමුත් ඒ අවස්ථාවේදී පවා සිසුන්ට අසාධාරණයක් නොවන ආකාරයට අභියාචනා ගෙන්වා ගෙන සිසුන් 925ක් විවිධ පීඨවලට ඇතුළත් කිරීමට කටයුතු කළා. රජරට විශ්වවිද්‍යාලයේත් අලුතින් වෛද්‍ය පීඨයක් ආරම්භ කළා. ඒ නිසා යම් කිසි කෙනෙකුට මේ පිළිබඳව ගැටලුවක් තිබේ නම් අභියාචනා ඉදිරිපත් කරන්න මාසයක කාලයක් ලබා දී තිබෙනවා. අභියාචනා මණ්ඩලයට ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට හැකියාව තිබෙනවා.

**ගරු දි. මු. ජයරත්න මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**

(மாண்புமிகு டி. எம். ஜயரத்ன - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)

(The Hon. D. M. Jayaratne - Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, මෙය දැන් විවාදයක් හැටියට පැවැත්වෙනවාද, එහෙම නැත්නම්, -

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ගරු ඇමතිතුමනි, අද ප්‍රශ්න වෙලාවෙන් පසුව පොඩ්ඩක් කාලය තිබුණා. [බාධා කිරීමක්] එතුමා හොඳ පිළිතුරක් දුන්නා නේද?

**ගරු අනුර දිසානායක මහතා**

(மாண்புமிகு அனுர திஸாநாயக்க)

(The Hon. Anura Dissanayake)

නැහැ, ගරු කථානායකතුමනි. ප්‍රමාණවත් නැහැ.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ප්‍රමාණවත් නැහැ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් සිදු වී තිබෙන්නේ මෙයයි. මා දන්නා විධියට අද කුරුණෑගල දිස්ත්‍රික්කයේ ළමයින් සහ දෙමවුපියන් ඇමතිතුමාව මුණ ගැසෙන්නට අධ්‍යාපන අමාත්‍යාංශයට එනවා. සැබැවින්ම සිදු වී තිබෙන්නේ, වෛද්‍ය පීඨයට තේරී තිබෙන සිසුවියන් පිරිසක් නැවත සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව කිසිදු පීඨයකට සුදුසුකම් නොලබන තත්ත්වයකට පහතට ගිහින් තිබීමයි. ඔවුන් වෛද්‍ය පීඨයේද කියලා උපකල්පනය කරන්නේ ජනවාරි මාසයේ ලැබුණු ප්‍රතිඵල ලේඛනයෙන් දළ අදහසක් ගන්නයි, දිස්ත්‍රික්කයේ සිටින්නේ එකද, දෙකද, තුනද කියන එක මත.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, සම්පූර්ණ කාලයම ගත්තේ මේ ක්‍රියාදාමය පැහැදිලි කරන්නයි. විභාග ප්‍රතිඵල ලේඛනයේ එන rank එකයි, දිස්ත්‍රික්කයයි විශ්වවිද්‍යාලයේ පීඨයකට ඇතුළත් වීම සඳහා අවසාන rank එක නොවෙයි කියලා ලිඛිතව සඳහන් කර තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා හරි, මම හරි, ඉස්කෝලේ යන කාලේ විභාග ප්‍රතිඵල ලේඛනය -දැන් වාගේ සංකීර්ණත් නැහැ- ආවාම අපි ඒ ප්‍රතිඵල ලේඛනය කෙරෙහි තමයි විශ්වාසය තබන්නේ. මෙහි පොඩි අකුරෙන් යටින් දමලා තිබෙනවා, "සැලකිය යුතුයි. මෙය බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය ලෙස නොසලකන්න." කියලා. එහෙම තිබුණාට ජනවාරි මාසයේ තුන් වැනි දා එන ප්‍රතිඵල ලේඛනය තමයි, තමන්ගේ ප්‍රතිඵල කියා ළමයි තේරුම් ගන්නේ. ඒ ප්‍රතිඵල ලේඛනය අනුව තමයි දෙමව්පියන් කිරි බත් උයන්නේ, තෑගි ගෙනෙන්නේ, විභාගය පාස් වෙලා කියලා ළමයින් ප්‍රීති ප්‍රමෝද වන්නේ. මේ ඔක්කොම වන්නේ ඒ ලැබෙන ප්‍රතිඵල ලේඛනය අනුවයි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මා හිතන්නේ එතුමාගේ ප්‍රකාශයට මා පැහැදිලි පිළිතුරක් දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇමතිතුමාගේ ස්ථාවරය ඇමතිතුමා පැහැදිලි කළා නේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඒ පිළිතුර සාමාන්‍යයෙන් ඕනෑම කෙනෙකුට අවබෝධ වනවා. ඔබතුමා සඳහන් කරන ඔය කාරණය අපට යොමු කරන්න. අපි ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවත් එක්ක සාකච්ඡා කරන්නම්. මා ඔබතුමාට කිව්වා, අපි බොහොම ප්‍රතිවාර දක්වනසුලුයි කියා. කිසි දෙයකින් මඟ හැරලා ගිහිල්ලා නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක හරි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතීතයේදීත් ප්‍රතිචාර දක්වා තිබෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
අර මුල් අවස්ථාවේ දී උදාහරණයක් මා පෙන්වුවේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ, රසායන විද්‍යාව - chemistry - ප්‍රශ්නයේදී මා ඔබතුමාගෙන් ප්‍රශ්න ඇහුවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඔබතුමා ඒක යොමු කරන්න. මා ඒ කාරණය සම්බන්ධයෙන් අභියාචනය කරලා, ඒ අයට සාධාරණයක් වන විධියට යම් පිළියමක් යොදන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அனுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කිරීමක් කර ගන්නට තිබෙනවා, ගරු කථානායකතුමනි. අමාත්‍යතුමා මේ අවස්ථාවේ දී ප්‍රකාශ කළා, අපට යම් ක්ෂේත්‍රයක මොකක් හරි වැරැදීමක් සිදු වෙලා තිබෙනවා නම් ඒක ගැන කථා කරලා නිවැරදි කර ගන්න අවස්ථාවක් ඔබතුමා ලබා දෙනවාය කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉතින් ඒක නේ කිව්වේ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ඒක කරන පිළිවෙළක් තිබෙනවා, ඒ සඳහා කාලයක් දීලා තිබෙනවා. ඒ අභියාචනය යොමු කරන්න, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒක තමයි ගරු ඇමතිතුමනි. ඔය පිළිවෙළ ඔස්සේ අපි කිහිප වතාවක්ම තමුන්නාන්සේට අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින යම් යම් ප්‍රශ්න ගැන ඉදිරිපත් කළා. තමුන්නාන්සේම දන්නවා, මේ පළාත් අධ්‍යක්ෂකවරුන් පත් කරන ක්‍රියාවලියේ දී වයස වැඩි අය පත් කිරීම සම්බන්ධයෙන් උතුරු මැද පළාතේ සහ වයඹ පළාතේ විශාල ප්‍රශ්නයක් තිබුණු බව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් මේ වෙන කාරණයක් යන්නේ. දැන් විභාග පිළිබඳ කාරණය නොවෙයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අපි දිගින් දිගටම ඒ කාරණය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ තමුන්නාන්සේ ඒවාට ක්‍රියා මාර්ග ගත්තේ නැති එකයි. පාසල්වලට ළමුන් ඇතුළත් කර ගැනීමේ සිට ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නයක් මතු කළාම ඒක විවාදයක් කර ගන්න බැහැ. අධ්‍යාපන ඇමතිතුමාගේ පිළිවෙළක් තිබෙනවා. පුළුවන් තරම් සවිස්තරව පිළිතුරු දෙනවා.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, මේ ගරු මන්ත්‍රීතුමා දැන් මතු කරපු ප්‍රශ්නය මා දන්නවා. එතුමාත් එක්ක මමත් එකඟ වෙනවා. මොකද, අධ්‍යාපන පරිපාලන සේවයේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා, ඒකට පිළිතුරු දෙනවාද?

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
විනාඩි දෙකෙන් මම උත්තර දෙන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මගේ විරුද්ධයක් නැහැ. මන්ත්‍රීවරුන් අසන ප්‍රශ්නවලට උත්තර දෙනවාට මා විරුද්ධ වෙන්නේ නැහැ. ඒක ඇමතිවරයාගේ අභිලාෂය, මගේ නොවෙයි.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
මාත් බොහොම කැමැතියි, මේ සභාවේදීම උත්තර දෙන්න. මොකද, එතකොට අපේ මාධ්‍ය මඟින් මේක නිවැරදිව වාර්තා වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මටත් ඒක පේනවා. වෙලාව තමයි ප්‍රශ්නෙ.

**ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A. D. Susil Premajayantha)
නැත්නම් අපරාදෙ කාලය නාස්ති කර ගෙන මෙතුමාට පුවත් පත් සාකච්ඡාවක් තියන්න වෙනවා, නැවත මේ ගැන කියන්න. මම මේ ප්‍රශ්නයට උත්තර දෙන්නම්. ගරු කථානායකතුමනි, අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණිය සඳහා උසස්වීම් දීමේ ක්‍රියාවලිය අවුරුදු 8ක් ප්‍රමාද වුණා, පාර්ශ්ව දෙකක් විසින් අවුරුදු 8ක් තිස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු කියපු නිසා. ඒ නඩුව අවසන් වුණායින් පස්සේ අපි පියවර ගත්තා, ඒ අධිකරණ නියෝගය අනුවම ජ්‍යෙෂ්ඨතා ලේඛනය සකස් කරලා පරිපාලන සේවයේ 1 ශ්‍රේණියට උසස්වීම් දීමට. පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව උසස්වීම් දීමේ කාර්ය පටිපාටියක් තිබෙනවා. අපේ රේණුකා හේරත් හිටපු ඇමතිතුමියත් මේ ගැන දන්නවා. එතුමිය බොහොම අවධානයෙන් අහගෙන ඉන්නවා. ගරු කථානායකතුමනි, හිටපු අධ්‍යාපන ඇමතිවරයෙක් හැටියට ඔබතුමාත් මේ ගැන දන්නවා. එතකොට අධ්‍යාපන පරිපාලන සේවයේ උසස්වීම් ලබා දීමේදී, ඒ පටිපාටිය අනුව ජ්‍යෙෂ්ඨතා ලේඛනය වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරලා ජ්‍යෙෂ්ඨතාව අනුව අපි දැන් වසරෙන් වසරට උසස්වීම් දීගෙන එනවා. ඒක තමයි ක්‍රියා පිළිවෙත. උදාහරණයක් වශයෙන් 2001 ජූනි මස 01 වන දිනට තිබූ පුරප්පාඩු සංඛ්‍යාවට ඒ වන කොට eligible, ඒ සඳහා සුදුසුකම් සපුරා තිබූ සියලු දෙනාට අයදුම් කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඒ පිරිස සම්මුඛ පරීක්ෂණයට තියලා 2001 ජූනි 01 වන දාට පත්වීම් දෙන්න තීරණය කළාම, 29 දෙනෙක් සම්මුඛ පරීක්ෂණයට ආවා. එයින් හතර දෙනයි සේවයේ ඉන්නේ. ඉතුරු 25 දෙනාම විශ්‍රාම ගිහිල්ලා. මොකද, අවුරුදු 8ක් නඩු කිව්වා නේ. දැන් හතර දෙනායි ඉතුරු වෙලා ඉන්නේ. එතකොට ඒ හතර දෙනාට අපි පත්වීම් දුන්නා. දැන් 2002 ජූනි 01 වන දාට ඉන්න පිරිසට සම්මුඛ පරීක්ෂණය පවත්වනවා. ඊළඟට 2003, 2004. පරිපාලන සේවා ව්‍යවස්ථාවේ තියෙන්නේ වර්ෂයෙන් වර්ෂය ගණනය කර ඒ වර්ෂයට අදාළ වෙන්නා වූ පුරප්පාඩු සංඛ්‍යාවට ඒ වර්ෂයට සුදුසුකම් ලබන පිරිස සම්මුඛ පරීක්ෂණයට කැඳවා උසස්වීම් දිය යුතුයි කියලායි. ඒ ක්‍රියාදාමය වෙනවා. ඒ අනුව ඔබතුමා කථා කරන වයඹ පළාතේ පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ දක්ෂ නිලධාරියෙක් ඉන්නවා. එතුමාට පරිපාලන සේවයේ 1 ශ්‍රේණියට මමම පත්වීම දුන්නා. දැන් ඒ පළාත් සභාවට තිබෙන්නේ ඒ පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියාට පත්වීම දීලා විශ්‍රාම ගිහින් ඉන්න අයව ඒ ආකාරයෙන් විශ්‍රාම යැවීමට කටයුතු කිරීමයි. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා දහතුන්වන ආණ්ඩුක්‍රම සංශෝධනය අනුව පළාත් විෂයයක් හැටියට අධ්‍යාපන විෂයය විමධ්‍යගත වෙලා තිබෙන බව.දැන් කවුරු මොන දේ කථා කළත් බලය බෙදී ගිහින් තිබෙනවා. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඉතින් මම කියන දේ අහගෙන ඉන්නකෝ. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාතේ විෂය භාර අධ්‍යාපන අමාත්‍යවරයා තමයි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාව නම් කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ concurrence එකත් එක්ක. ඒ කියන්නේ අපේ එකඟතාව විතරයි ඕනෑ. පත් කිරීම සිදු කරන්නේ එහෙන්. අපේ එකඟතාව තිබෙනවා, පරිපාලන සේවයේ I ශ්‍රේණියේ අලුතින් උසස්වීම ලැබුණු නිලධාරියාව පත් කරන්න. හැබැයි පත්වීම කරන්න ඕනෑ, එම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසිනුයි. ඒ නිසා මම මේ සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යවරුන්ගේ අවධානය යොමු කරවලා තිබෙනවා. මම ඔබතුමාට සහතික වෙනවා, අගෝස්තු මාසයේ අවසන් වීමට පෙර අධ්‍යාපන පරිපාලන සේවයේ ඉතිරි පුරප්පාඩු සියල්ලම පුරවන බවට. අදාළ සම්මුඛ පරීක්ෂණ අපි පවත්වා ගෙන යනවා. ඒ අයට උසස් වීම් ටික දෙනවා. එතකොට සැප්තැම්බර් මාසයේ සිට අපි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නවා, අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ උසස් වීම් ලබන සියලු දෙනාට පළාත් මට්ටමෙන් පත්වීම් ලබා දිය යුතුයි කියලා. එතකොට ඔය ප්‍රශ්නය විසඳෙනවා.

***සභා මේසය මත තබන ලද ඇමුණුම් :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புக்கள் :*
*Annexes tabled :*

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - අගෝස්තු**

ඇමුණුම -2

DP/AL/2008/RS/1

මගේ අංකය : 6/8/1/උ.පෙ./2008
පාසල් විභාග සංවිධාන සහ ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
පැලවත්ත, බත්තරමුල්ල.
2009 ජනවාරි මස 02 දින.

සියලු ම විදුහල්පතිවරුන් වෙත,

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය-2008 අගෝස්තු**

උක්ත විභාගය සඳහා ඔබ පාසලින් ඉදිරිපත් වූ අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල ලේඛනය මේ සමඟ එවා ඇත. මෙම ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් නැවත නිකුත් කරන නොලබන බැවින් සුරක්ෂිතව තබා ගත යුතු ය. විදුහල්පති හැර අයදුම්කරුවන් විසින් හෝ ඔවුන් උදෙසා වෙනත් අයෙකු විසින් හෝ ප්‍රතිඵල සම්බන්ධයෙන් කරනු ලබන විමසීම්වලට මෙම දෙපාර්තමේන්තුවෙන් පිළිතුරු සපයනු නො ලැබේ. ප්‍රතිඵල නැවත සමීක්ෂණයෙන් පසු එක් එක් අයදුම්කරුවන් වෙත නිකුත් කිරීම සඳහා වූ කේවල ප්‍රතිඵල සටහන් එවනු ලැබේ.

02. ප්‍රතිඵල ලේඛනය සහ සංකේත

2.1 ප්‍රතිඵල ලේඛනයේ 1, 2, 3 අංක සහිත තීරුවල විෂයය, මාධ්‍යය හා ශ්‍රේණිය පිළිවෙලින් දක්වා ඇති අතර, එම විෂයයන් සම්බන්ධයෙන් පාසල පදනම් කරගත් ඇගයීම (S.B.A) යටතේ නිපුණතා මට්ටම ද මෙහි දක්වා ඇත.

2.2 4 වන අංකය සහිත තීරුවෙන් සමත් වූ විෂයයන් ගණන දක්වයි.

2.3 5 වන අංකය සහිත තීරුවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීම දක්වා ඇත.
Y– අවම සුදුසුකම් ලබා ඇත. N- අවම සුදුසුකම් ලබා නොමැත.

2.4 6 වන අංකය සහිත තීරුවෙන් විෂය ධාරාව දක්වා ඇත.

2.5 7 වන අංකය සහිත තීරුවෙන් සාමාන්‍ය "Z" ලකුණ දක්වා ඇති අතර "M" සංකේතයෙන් දක්වන්නේ සෘණ අගයයි.
**මෙම "Z" ලකුණ නැවත සමීක්ෂණයෙන් පසු වෙනස් විය හැකිය.**

2.6 8 වන අංකය සහිත තීරු දෙකින් මුල් තීරුව දිස්ත්‍රික් කුසලතාව සහ ඊළඟ තීරුව දිවයිනේ කුසලතාව ද දක්වයි.

2.7 9 වන අංකය සහිත තීරුවෙන් සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සඳහා වූ ප්‍රතිඵලයෙහි ශ්‍රේණිය දක්වා ඇත.

2.8 10 වන අංකය සහිත තීරුවෙන් දක්වා ඇත්තේ සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලබා ගත් ලකුණු ප්‍රමාණයයි. එය ප්‍රතිශතයක් වශයෙන් දැක්වේ.

2.9 11, 12 අංකය සහිත තීරුවල පිළිවෙලින් කේවල ව්‍යාපෘති සහ කණ්ඩායම් ව්‍යාපෘති සඳහා ලබා ගත් නිපුණතා මට්ටම සඳහන් වේ.

2.10 **සංකේත පිළිබඳ විස්තර**

**2.10. 1 ලිඛිත විභාගය හා ප්‍රායෝගික පරීක්ෂණ ශ්‍රේණි**

| | |
|---|---|
| A – විශිෂ්ට සාමාර්ථ්‍යය | X - ප්‍රතිඵල තීරණය කර නැත |
| B - අධි සම්මාන සාමාර්ථ්‍යය | + - පෙනී නොසිටි |
| C - සම්මාන සාමාර්ථ්‍යය | N - අදාළ විෂයයයේ ප්‍රතිඵල අවලංගු කර ඇත. |
| S - සාමාන්‍ය සාමාර්ථ්‍යය | RESULT WITHHELD- ප්‍රතිඵල අත්හිටුවා ඇත. |
| F - අසමර්ථතාව | |

**2.10.2 පාසල පදනම් කර ගත් ඇගයීම් (S.B.A) සහ කේවල ව්‍යාපෘති, කණ්ඩායම් ව්‍යාපෘති/නිපුණතා මට්ටම්**

| | |
|---|---|
| 1 - විශිෂ්ට මට්ටමේ නිපුණතාව | 4 - ආසන්න නිපුණතාව |
| 2 - ඉහළ මට්ටමේ නිපුණතාව | 5 - නිපුණතා මට්ටමට ළඟා නොවූ |
| 3 - සම්මාන මට්ටමේ නිපුණතාව | + - පෙනී නොසිටි |

3. විභාග ප්‍රතිඵල ලේඛනය සුපරීක්ෂාකාරී ව කියවා බලා අදාළ අයදුම්කරුවන්ගේ නම්වල හෝ වෙනත් සංශෝධනයක් හෝ අවශ්‍ය නම්, ඒ බව 2009.01.31 දිනට පෙර මෙම දෙපාර්තමේන්තුවට දන්වන්න. ඉහත සඳහන් දිනට පසුව කරන ඉල්ලීම් ගැන ක්‍රියා කරනු නොලැබේ. එවැනි **සංශෝධන ඔබ මුලින්ම ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයට අනුකූල වන්නේ නම් ඔබගේ ඉල්ලීම සමඟ අයදුම්කරුගේ ප්‍රතිඵල ද ඉදිරිපත් කළ යුතුය.** මෙම ප්‍රතිඵල ලේඛනයේ ඇති විස්තර යතුරු ලියනය කර හෝ අත් අකුරෙන් ලියා හෝ අයදුම්කරුවන්ට දැන්වීමට කටයුතු යෙදීමේ දී ඇතිවන දෝෂ වැළැක්වීම සඳහා මෙම පිටපත හෝ එහි ඡායා පිටපතක් හෝ අයදුම්කරුවන්ට පෞද්ගලික ව නිරීක්ෂණය කර ගැනීමට අවස්ථාවක් සලසන්නේ නම් මැනවි.

04. **සන්දේශන**

**පාසල් ප්‍රධානීන් අදාළ අයදුම්කරුවන්ට ප්‍රතිඵල සටහන් නිකුත් කිරීමට පෙර, මේ විභාගයේ ප්‍රතිඵල සම්බන්ධයෙන් විමසීමක් කරන්නේ නම්, එය මෙම දෙපාර්තමේන්තුවට වහාම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙම ප්‍රතිඵල සම්බන්ධයෙන් ඔබ මගින් කරනු ලබන ඉල්ලීම් භාර ගනු නොලබන බැවින් එවැනි ඉල්ලීම් ඔබ විසින් ම ඉදිරිපත් කළ යුතුය.**

05. **නීත්‍යානුකූල සහතික පත්‍ර ලැබෙන තුරු තම ශිෂ්‍යයන්ගේ ප්‍රතිඵල සහතික කර ලියවිලි නිකුත් කිරීමට පාඨශාලා ප්‍රධානීන්ට බලය තිබේ.** එවැනි ලියවිලි ශිෂ්‍යයන්ගේ සමර්ථතාව ඔප්පු කිරීමේ ප්‍රාථමික සාක්ෂ්‍යයක් වශයෙන් භාර ගැනීමට සියලුම රජයේ දෙපාර්තමේන්තු ද, විශ්ව විද්‍යාලයන් හා වෙනත් ආයතන ද එකඟ වී ඇත. ශිෂ්‍යයකුට රැකියාවක් ලබා ගැනීම සඳහා සේවා යෝජකයාට හෝ කිසියම් ආයතනයකට හෝ ඇතුළත්වීම පිණිස එහි ප්‍රධානියාට හෝ ප්‍රතිඵල ඇතුළත් ලියවිල්ලක් නිකුත් කිරීමේ දී එය ලැබිය යුතු අයට ඒවා කෙළින් ම යවන්නටත් අතරමග දී වෙනස් කරන්නට නොහැකිවන සේ පිළිවෙලක් යොදා ගැනීමත් මැනවි. ලියවිලි ශිෂ්‍යයන් අතට නොදී එක එල්ලේම ලැබිය යුත්තාට ම යැවීමෙන්, ඒවා අනිසි ලෙස භාවිත කිරීම වළක්වන්නට පුළුවන. මේ ලියවිලිවල විභාගයේ නම, වර්ෂය, මාසය, විභාග අංකය හා ශිෂ්‍යයාගේ සම්පූර්ණ නමත් සඳහන් කළ යුතුය. සමත් වූ විෂයයන් හා ඒවායින් ලැබූ ශ්‍රේණිය ද ලියවිලිවල සඳහන් කළ හොත් අපේක්ෂකයනට ප්‍රයෝජනවත් වනු ඇත. සංකේත යොදා ගත හොත් ඒවායෙන් අඟවන ශ්‍රේණි ද සඳහන් කළ යුතු ය. **මෙම ලියවිලිවල පාසල් ප්‍රධානීන් විසින් ම අත්සන් තැබිය යුතුයි. එසේ නොවුනහොත් එවැනි ලියවිලි ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.**

06. මෙම ප්‍රතිඵල ලැයිස්තුවෙන් නිවේදනය කරනු ලබන විභාග ප්‍රතිඵල, විභාග දෙපාර්තමේන්තුව මඟින් යථා කාලයේදී නිකුත් කරනු ලබන සහතික පත්‍රවලින් හෝ වෙනයම් ලේඛනයකින් හෝ සනාථ වන තුරු අස්ථිර බව සැළකිය යුතු ය.

07. **මෙම විභාගයේ විෂය අංක 12 සාමාන්‍ය පොදු පරීක්ෂණය සහ විෂය අංක 13 සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයන් හැර අනෙකුත් විෂයයන්ගේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා වන ඉල්ලුම් පත්‍ර 2009.01.23 වන දින දක්වා පමණක් භාර ගනු ලැබේ. ඒ සඳහා ඉල්ලුම් පත්‍රය මේ සමඟ එවන අතර, පුවත් පත් දැන්වීමක් මඟින් ද පළ කරනු ඇත. සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලකුණු 30කට වඩා අඩු වීම හේතුවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලැබූ අයදුම්කරුවන්ට ඒ විෂය සඳහා පමණක් විදුහල්පති මඟින් අභියාචනා ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.**

**පාසල් අයදුම්කරුවන්ගේ නැවත සමීක්ෂණය සඳහා වන ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ විදුහල්පති මඟින් පමණකි. පෞද්ගලිකව ඉදිරිපත් කරන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**පාසල් අයදුම්කරුවන්ගේ නැවත සමීක්ෂණය සඳහා වන මුදල් ගෙවා සම්පූර්ණ කරන ලද සියලුම ඉල්ලුම් පත් විදුහල්පති විසින් ලබාගෙන උපලේඛන ගත කොට එම උපලේඛනයේ පිටපතක් සමඟ එක් කවරයක බහා තැ. පෙ. 1503, කොළඹ** යන ලිපිනයට එවිය යුතුය. මේ පිළිබඳව ප්‍රතිඵල නිකුත් කරන අවස්ථාවේදී ම සියලුම අයදුම්කරුවන් දැනුවත් කළ යුතුය.

08. විභාග ප්‍රතිඵල www.doenets.lk යන දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කෙරේ.

විමසීම් : තැපැල් ලිපිනය :

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පාසල් විභාග සංවිධාන ශාඛාව,
තැ.පෙ. 1503, කොළඹ

දුරකථන අංක : 011-2784208, 011-2784537
Fax : 0112784422

අනුර එදිරිසිංහ
විභාග කොමසාරිස් ජනරාල්

138 - D

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்/ DEPT. OF EXAMINATIONS, SRI LANKA

සම්පූර්ණ නම සහ ලිපිනය / முழுப்பெயரும் முகவரியும் / FULL NAME AND ADDRESS

PREM NAZEER FATHIMA LANOOTH

240, MANNAR ROAD,
PUTTALAM.

## ප්‍රතිඵල සටහන / பெறுபேற்று அட்டவணை / RESULTS SCHEDULE

අ.පො.ස. (උ.පෙ.) විභාගය - අගෝස්තු
க.பொ.த. (உ.தர)ப் பரீட்சை - ஆகஸ்ட்
G. C. E. (A. L.) Examination - AUGUST } 2008

මධ්‍යස්ථාන අංකය / பரீட்சை நிலைய எண் / Centre No.: 1093

විභාග අංකය / சுட்டெண் / Index No.: 8478350

අයදුම්කරුගේ සම්පූර්ණ නම / பரீட்சார்த்தியின் முழுப்பெயர் / Full name of Candidate

PREM NAZEER FATHIMA LANOOTH

| විෂය අංකය සහ මාධ්‍යය / பாட எண்ணும் மொழிமூலமும் / Subject No. and Medium | 23T | 24 | 72 |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | S | F | F |

| සාමාර්ථතා / சித்திகள் / Passes A | B | C | S | එකතුව / தொகை / TOTAL |
|---|---|---|---|---|
| 0 | 0 | 0 | 1 | 1 |

| (12) සාමාන්‍ය පොදු පරීක්ෂණය / பொதுச் சாதாரண பரீட்சை / Common General Test. | ලකුණු / புள்ளி / Marks |
|---|---|
| | 035 |

| (13) සාමාන්‍ය ඉංග්‍රීසි / பொது ஆங்கிலம் / General English | ශ්‍රේණිය / தரம் / Grade |
|---|---|
| | F |

දිනය / திகதி / Date } 2009/01/03

ANURA EDIRISINGHE
විභාග කොමසාරිස් ජනරාල්
பரீட்சை ஆணையாளர் நாயகம்
Commissioner General of Examinations

**වැදගත්/முக்கியம்/ Important :**

ඔබ වෙත ලැබී ඇති ප්‍රතිඵල සටහන පිළිබඳ නාම සංශෝධන හෝ වෙනත් සංශෝධන වේනොත් මෙම ප්‍රතිඵල ලේඛනය ලැබී මසක් තුළ මා වෙත ලි. ප. තැ. දැන්විය යුතුය. නම සංශෝධන කරනු ලබන්නේ අයදුම් පත්‍රයේ සඳහන් පරිදිය. එසේ නොමැති ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙහි සඳහන් සාමාන්‍ය Z ලකුණ නැවත සමීක්ෂණයෙන් පසු වෙනස්විය හැකිය.

உங்களுக்கு கிடைக்கப் பெற்ற பெறுபேறு சம்பந்தமாக பெயர் மாற்றமோ அல்லது வேறு திருத்தங்களோ இருப்பின் இப்பெறுபேறு கிடைத்து ஒரு மாதத்திற்குள் எனக்கு பதிவுத்தபால் மூலம் அறிவிக்க வேண்டும். பெயர்மாற்றம் விண்ணப்பப்படிவத்தில் உள்ளவாறு மாத்திரமே மேற்கொள்ளப்படும். அவற்றுக்கு அமையாத முறைப்பாடுகள் நிராகரிக்கப்படும். இங்கே குறிக்கப்பட்டுள்ள சராசரி Z புள்ளி விடைத்தாள் மீள்பரிசீலனையின் பின் மாற்றமடையலாம்.

Any amendments to be made to names or any other information in this result schedule should be informed, by registered post within one month of the receipt of same. Amendments of names will be made strictly according to the information provided in the application and requests seeking amendments outside of the information therein will not be entertained. The Average Z score stated below is subject to change after rescrutiny.

| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා ඇත්ද යන වග. / பல்கலைக்கழக அனுமதிக்காக விண்ணப்பப் படிவம் அனுப்புவதற்கு தகைமை பெறப்பட்டுள்ளதா? / Provisionally qualified to apply for admission to University | විෂය ධාරාව / பாடநெறி / Stream | සාමාන්‍ය Z ලකුණු / சராசரி Z புள்ளி / Average z Score | * කුසලතාව / நிலை / RANK: දිස්ත්‍රික් / மாவட்டம் / District | දිවයිනේ / தீவு / Island |
|---|---|---|---|---|
| NO | *** | ******* | ****** | ****** |

* තාවකාලිකව දක්වා ඇති කුසලතාවයන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අදාළ නොවේ.
* தற்காலிகமாகக் காட்டப்பட்டுள்ள மட்டநிலைகள் பல்கலைக்கழக அனுமதிக்குச் செல்லுபடியாகாது.
* Provisional ranks are not valid for University admission.

අ.පි.බ. / ம.ப பா./ P.T.O.

අයදුම්කරුවකුගේ සමර්ථතාව - අසමර්ථතාව සම්බන්ධ ව ප්‍රාථමික සාක්ෂියක් වශයෙන් මෙම ප්‍රතිඵල සටහන පිළිගත හැකිය; පසුව මෙම ප්‍රතිඵල සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් ගෙන් විමසා සනාථ කර ගත යුතු ය.

ஒரு விண்ணப்பதாரியின் சித்தி, சித்தியின்மை சம்பந்தமான அறிவித்தலாக இந்தப் பெறுபேற்று உறுதி அட்டவணையை ஏற்றுகொள்ளலாம். மேற்படி பெறுபேற்றைப் பரீட்சை ஆணையாளர் நாயகத்திடம் விசாரித்து உறுதி செய்தல் வேண்டும்.

A = විශිෂ්ඨ සාමාර්ථය, B = අධි සම්මාන සාමාර්ථය, C = සම්මාන සාමාර්ථය, S = සාමාන්‍ය සාමාර්ථය, F = අසමර්ථතාව, + = නොපැමිණියේය, X = තීරණය කර නැත, N = අදාළ විෂයේ ප්‍රතිඵල අවලංගු කර ඇත. මෙහි ඇති දැ වෙනස් කිරීම පිළිබඳ වගකිව යුත්තේ අයදුම්කරුම ය. එසේ නීති විරෝධී ලෙස ක්‍රියාකරන අයදුම්කරුවන්ට දඬුවම් පමුණුවනු ලැබේ. මෙය විභාග කොමසාරිස් ජනරාල් සතු ය. ඉල්ලුම් කළ විටෙක ආපසු එවිය යුතු ය.

A= விசேட சித்தி, B= அதிதிறமைச் சித்தி, C= திறமைச் சித்தி, S= சாதாரண சித்தி, F= சித்தியின்மை, += தோற்றவில்லை, X= தீர்மானிக்கப்படவில்லை, N= உரிய பாடத்தின் பெறுபேறு இரத்து செய்யப்பட்டுள்ளது பெறுபேறு நிறுத்தி வைக்கப்பட்டுள்ளது. இதில் மாற்றங்கள் செய்யப்பட்டிருப்பின் அவற்றுக்குப் பரீட்சார்த்தியே பொறுப்பாளியாவார். நியாயயீனமாக நடப்பவர்களுக்குத் தண்டனை விதிக்கப்படும். இவ்வட்டவணை பரீட்சை ஆணையாளரின் சொத்தாகும். அவர் கேட்கும் பொழுது இதனைக் கொடுத்தல் வேண்டும்.

A = Distinction, B = Very Good Pass, C = Credit, S = Ord. Pass, F = Failure, += Absent, X = Not finalised.
N = Results of the subject nullified

භාෂා මාධ්‍යය :- ඒ ඒ විෂයය අංකය ඉදිරියේ S/T/E වශයෙන් දැක්වෙන්නේ අයදුම්කරු එම විෂයයට පෙනී සිටි භාෂා මාධ්‍යයයි. S = සිංහල T = දෙමළ E = ඉංග්‍රීසි

மொழி மூலம் ; அந்தந்தப் பாட எண்ணுக்கு எதிரே S/T/E என்று காட்டப்பட்டிருப்பது விண்ணப்பதாரி அப்பாடத்துக்குத் தோற்றிய மொழி மூலமாகும். S = சிங்களம் T = தமிழ் E = ஆங்கிலம்

Medium :- S/T/E placed with each subject number indicates the medium in which the candidate sat for the respective subject S = Sinhala , T = Tamil, E = English.

**විෂය ලේඛනය හා විෂය අංකය** / *பாட அட்டவணையும் பாட எண்களும்*/ List of Subjects and Subject Numbers.

01. භෞතික විද්‍යාව/பௌதிகவியல்/Physics
02. රසායන විද්‍යාව/இரசாயனவியல்/ Chemistry
07. ගණිතය/கணிதம்/Mathematics
08. කෘෂි විද්‍යාව/விவசாய விஞ்ஞானம்/ Agricultural Science
09. ජීව විද්‍යාව/உயிரியல்/ Biology
10. සංයුක්ත ගණිතය/இணைந்த கணிதம்/ Combined Mathematics
11. උසස් ගණිතය/உயர் கணிதம்/ Higher Mathematics
*12. සාමාන්‍ය පොදු පරීක්ෂණය/பொதுச் சாதாரண பரீட்சை/ Common General Test
**13. සාමාන්‍ය ඉංග්‍රීසි / பொது ஆங்கிலம் / General English
21. ආර්ථික විද්‍යාව/பொருளியல்/ Economics
22. භූගෝල විද්‍යාව/புவியியல்/ Geography
23. දේශපාලන විද්‍යාවේ මූලිකාංග/அரசியல் மூலத்துவங்கள்/ Elements of Political Science
24. තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය/அளவையியலும் விஞ்ஞான முறையும்/ Logic and Scientific Method
25. ඉතිහාසය/ வரலாறு/ History
28. ගෘහ ආර්ථික විද්‍යාව/மனைப் பொருளியல்/Home Economics
29. ව්‍යාපාර අධ්‍යයනය/வணிகக்கல்வி/ Business Studies (Old)
30. ගිණුම්කරණය/கணக்கீடு/ Accounting (Old)
31. ව්‍යාපාර සංඛ්‍යානය/வணிகப் புள்ளிவிபரவியல்/ Business Statistics
32. ව්‍යාපාර අධ්‍යයනය/வணிகக்கல்வி/ Business Studies (New)
33. ගිණුම්කරණය/கணக்கீடு/ Accounting (New)
41. බුද්ධ ධර්මය/பௌத்த சமயம்/ Buddhism
42. හින්දු ධර්මය/இந்துசமயம்/ Hinduism
43. ක්‍රිස්තු ධර්මය/கிறிஸ்தவம்/ Christianity
44. ඉස්ලාම්/இஸ்லாம்/ Islam
45. බෞද්ධ ශිෂ්ටාචාරය/பௌத்த நாகரிகம்/ Buddhist Civilization
46. හින්දු ශිෂ්ටාචාරය/இந்து நாகரிகம்/Hindu Civilization
47. ඉස්ලාම් ශිෂ්ටාචාරය/இஸ்லாமிய நாகரிகம்/ Islamic Civilization
48. ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය/கிரேக்க உரோம நாகரிகம் / Greek & Roman Civilization
51. චිත්‍ර කලාව/சித்திரக்கலை/ Art
52. නර්තනය/நாட்டியம்/ Dancing
53. නැටුම් (භරත)/நாட்டியம் (பரதம்)/ Dancing (Bharata)
54. පෙරදිග සංගීතය /சங்கீதம் (கீழைத்தேயம்)/Music (Oriental)
55. සංගීතය (කර්ණාට)/சங்கீதம் (கர்நாடகம்)/Music (Carnatic)
56. සංගීතය (බටහිර)/சங்கீதம் (மேலைத்தேயம்)/Music (Western)
57. නාට්‍ය සහ රංග කලාව (සිංහල)
58. நாடகமும் அரங்கியலும் (தமிழ்)
59. Drama and Theatre (English)
71. සිංහල/சிங்களம்/ Sinhala
72. දෙමළ/தமிழ்/ Tamil
73. ඉංග්‍රී/ஆங்கிலம்/ English
74. පාලි/பாளி/ Pali
75. සංස්කෘත/சமஸ்கிருதம்/ Sanskrit
76. ලතින්/இலத்தீன்/ Latin
77. ග්‍රීක්/கிரேக்கம்/ Greek
78. අරාබි/அரபு/ Arabic
79. මැලේ/மலாய்/Malay
80. පර්සියන්/பேர்சிய மொழி/ Persian
81. ප්‍රංශ/பிரெஞ்சு/ French
82. ජර්මන්/ஜேர்மன்/ German
83. රුසියන්/ருசியன்/ Russian
84. හින්දි/ஹிந்தி/ Hindi
85. උර්දු/உருது/ Urdu
86. චීන/சீனமொழி/ Chinese
87. ජපන්/யப்பானிய மொழி/ Japanese

* - විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා පමණි/பல்கலைக்கழக அனுமதிக்காக மாத்திரம்/ Only for university admission

** - විශ්ව විද්‍යාල ප්‍රවේශයට අදාළ නොවේ/பல்கலைக்கழக அனுமதிக்குரியதல்ல/ Not applicalble for university admission

සැලකිය යුතුයි :

මෙම විභාගය සම්බන්ධයෙන් දේශීය විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් භාවිතා කරනු ලබන්නේ සම්මත පරිමාණයට පරිවර්තනය කරන ලද Z ලකුණු වල සාමාන්‍යයයි Z ලකුණු වල සාමාන්‍යය - 4.0000 සිට + 4.0000 දක්වා පරාසය තුළ ව්‍යාප්තවේ. මෙම ලේඛණයේ "M" වශයෙන් සඳහන් වන්නේ සෘණ අගයයි.

கவனிக்க :

இந்தப் பரீட்சை சம்பந்தமாக தேசிய பல்கலைக்கழக அனுமதிக்கான பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு பயன்படுத்திக் கொள்வது நியம அளவுத்திட்டத்திற்கு மாற்றப்பட்ட Z புள்ளிகளின் சராசரியாகும். Z)புள்ளிகளின் சராசரி -4.0000 தொடக்கம் +4.0000 வரையான வீச்சுககு உட்பட்டதாகும். இந்த அட்டவணையில் உள்ள "M" என்ற எழுத்து குறிப்பது மறைப் பெறுமானத்தை ஆகும்.

Note :

The average of Z scores converted into a standard scale is used by the University Grants Commission for the admission of students to Sri Lanka Universities. The average of Z scores varies in the range of - 4.0000 to + 4.0000. The letter "M" on this schedule denotes the minus value.

වි. මු. 32971 - (09. 01. 02)

ඇමුණුම 3 138-F

ආදර්ශ අයදුම්පත (සෙ.මී.30 x 20)

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2008
ප්‍රතිඵල නැවත සමීක්ෂණය

1. I. ඉල්ලුම්කරුගේ නම : පූජ්‍ය.................................................................... හිමි/මයා/මිය/මෙනවිය
(මුලකුරු සමග)

II. පෞද්ගලික ලිපිනය : ........................................................................................................

2. I. විභාග අංකය II. මධ්‍යස්ථාන අංකය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

| | | | |
|---|---|---|---|
| | | | |

3. ඔබ පාසල් අයදුම්කරුවෙක් ද ?
(අනවශ්‍ය වචනය කපා හරින්න)

| ඔව් | නැත |
|---|---|

4. විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම: ...........................................................................

5. නැවත සමීක්ෂණය කළයුතු විෂයය :
(එක් විෂයයක් සඳහා එක් ඉල්ලුම් පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ යුතුය)

i. ☐ ii. විෂයය අංකය ☐

iii. ලැබූ ශ්‍රේණිය ☐ iv. මාධ්‍යය ☐

6. ............................................ දිනැති කුවිතාන්සි අංක: ................................................ යටතේ
................................. තැපැල් / උප තැපැල් කාර්යාලයට රුපියල් දෙසියය (200/-) ක් ගෙවන ලද බව සහතික කරමි.

සැ: යු: තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සියේ මුල් පිටපත නොගැලවෙන පරිදි, මෙහි පසු පිටෙහි හොඳින් අලවන්න. එහි ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගන්න. කුවිතාන්සියේ මුල් පිටපත අලවා නොමැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. අයදුම්කරුගේ ප්‍රකාශය :

මා විසින් සපයා ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවට ප්‍රකාශ කරමි. යම් අසත්‍ය තොරතුරක් සපයා තිබේ නම්, මෙම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබීමට ද, නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන වෙනසක දී ලකුණු සහ ශ්‍රේණියේ අඩුවීමක් හෝ වැඩිවීමක් භාර ගැනීමට ද, නැවත සමීක්ෂණය පිළිබඳ නිතිරීති වලින් බැඳී සිටීමට ද එකඟ වන බව ප්‍රකාශ කරමි.

දිනය :............................ ................................................
අයදුම්කරුගේ අත්සන

8. පාසල් අයදුම්කරුවන් සඳහා විදුහල්පතිගේ සහතිකය :

ඉහත නම සඳහන් අයදුම්කරු මාගේ විද්‍යාලයේ ශිෂ්‍යයකු / ශිෂ්‍යාවක බවත්, මෙහි දක්වා ඇති විභාග අංකය, මධ්‍යස්ථාන අංකය, විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම, විෂයය අංකය හා විෂයය ලැබූ ශ්‍රේණිය සහ මාධ්‍යය ප්‍රතිඵල ලේඛනය අනුව නිවැරදි බවටත්, මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත මෙම අයදුම් පතේ පසුපිටෙහි අලවා ඇති බවටත් සහතික කරමි.

විදුහලේ නම සහ ලිපිනය : ........................................................... ...........................................
දිනය : ........................................................... විදුහල්පතිගේ අත්සන
නිල මුද්‍රාව

සැ.යු: පෞද්ගලික අයදුම්කරුවන් 01 සිට 07 දක්වා ඡේද පමණක් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුවේ.

පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
பாடசாலைப் பரீட்சைகள் ஒழுங்கமைப்பும் பெறுபேறும்
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்த, பத்தரமுல்ல.

දුරකථන / தொலைபேசி: 011-2784208, 011-2784422, 011-2784537
ෆැක්ස් / பெக்ஸ்: 011-2784422

Website : www.doenets.lk
E-mail : exams@doenets.lk

මගේ අංකය / எனது இல: 6/8
ඔබේ අංකය / உமது இல:
දිනය / திகதி: 2009.06.29

සියලුම විදුහල්පතිවරුන් වෙත,

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2008 අගෝස්තු
විභාගයේ ප්‍රතිඵල

නැවත සමීක්ෂණයෙන් පසු ප්‍රතිඵල වෙනස් වීම් මුල් ප්‍රතිඵල ලේඛනයට ඇතුළත් කිරීමේ දී ඇතැම් විදුහල්පතිවරුන් මාගේ උපදෙස් පරිදි ක්‍රියා නොකිරීම හේතුවෙන් අවස්ථා කිහිපයකදී ගැටලු පැන නැගී තිබූ බැවින්, මුල් ප්‍රතිඵල ලේඛනයේ සංශෝධන ඇතුළත් කිරීම වෙනුවට සංශෝධිත පරිගණක ප්‍රතිඵල ලේඛනයක් ඔබ වෙත එවීමට මෙවර කටයුතු යොදා ඇත.

02. එම සංශෝධිත ප්‍රතිඵල ලේඛනය සමග සියුන් වෙත ලබා දිය යුතු කෝවල ප්‍රතිඵල ලේඛන පිටපත් ද මේ සමඟ එවන අතර කෝවල ප්‍රතිඵල ලේඛන පිටපත්වල පසුපිට ඔබ විසින් ම අත්සන් තබා, ඔබේ නිල මුද්‍රාව යොදා සහතික කර අදාළ සියුන් වෙත කඩිනමින් ලබා දිය යුතු බව දන්වමි.

03. ඔබ වෙත එවා ඇති 2009 ජනවාරි 02 දිනැති අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල ලේඛනය මේ සමඟ ඇති DP/AL/RS/2008 කවරයේ බහා වහාම මා වෙත එවන්න. එය මා වෙත නොඑවා, ඔබ ළඟ තබා ගැනීම වරදක් බව ද වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි.

අනුර එදිරිසිංහ
විභාග කොමසාරිස් ජනරාල්

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු ඇමතිතුමාම දැන් කිව්වා-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ආයෙත්. දැන් නම් ඔන්න බරපතළ විවාදයක්.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - சுகாதார நலத்துறை, போசணை அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Healthcare and Nutrition and Leader of the House of Parliament)
දැන් අපි අනෙක් කටයුතුවලට බහිමු.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද තිබෙන්නේ ශෝක ප්‍රකාශ යෝජනායි. හිටපු අමාත්‍ය අභාවප්‍රාප්ත ගරු අමරසිරි දොඩන්ගොඩ මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව, ගරු සභානායකතුමා.

## ශෝක ප්‍රකාශය : ගරු අමරසිරි දොඩන්ගොඩ මහතා
### அனுதாபத் தீர்மானம் : மாண்புமிகு அமரசிறி தொடங்கொட
### VOTE OF CONDOLENCE : HON. AMARASIRI DODANGODA

[පූ. භා. 10.27]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
අසූව දශකයේදී දකුණු පළාතේ, බද්දේගම ආසනයේ ජනතාව නියෝජනය කරමින්ද, තවත් වසර ගණනාවක් ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාව නියෝජනය කරමින්ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා අමාත්‍යවරයකු වශයෙන් සුවිශේෂ මෙහෙයක් ඉටු කළ, ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසය වෙනස් මඟකට යොමු කළ උදාර රුහුණු පුත්‍රයකු වූ අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා 2009 මැයි මස 30 වන දින අභාවප්‍රාප්ත වූ බැවින් ඒ පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමටයි මා මේ අවස්ථාවේ නැඟී සිටියේ.

ගඟබඩ පත්තුවේ බද්දේගම, දොඩන්ගොඩ, ගිනිමැල්ලගහ, පී.එච්.ඩී. විලියම් අප්පුහාමි මහතාගේ සහ පුණ්‍යවතී ගුණසේකර මැතිනියගේ නව දෙනකුගෙන් යුත් දරු පවුලේ හතර වැනියා වශයෙන් ගාර්දිහේවාවසම් දොඩන්ගොඩගේ අමරසිරි මහතා 1942 ඔක්තෝබර් මස 18 වන දින උපත ලැබීය. නීතිඥ මාලනි මාලා මාඉටිපේ මහත්මිය සමඟ අතිනත ගත් එතුමා දරු දෙදෙනකුගේ දයාබර පියාණන් විණි.

ගිනිමැල්ලගහ විද්‍යානන්ද විද්‍යාලයෙන් සහ ගාල්ල ශ්‍රී රතනසාර මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ද, ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙන් ද්විතීය අධ්‍යාපනය ද ලැබූ එතුමා පාසල් සමයේදී විවාද කණ්ඩායම් තුළ කැපී පෙනෙන දක්ෂතා දක්වමින් ගුරු සිත් දිනා ගනිමින් ඉතා ජනප්‍රිය සිසුවෙක් විය.

අධ්‍යාපනය ලබමින් සිටියදී පාසලේ පොදු කාර්යයන්හි දී එතුමා පෙරමුණ ගෙන ක්‍රියා කළේය. ප්‍රදේශයේ සමාජමය කටයුතුවලදී ද අමරසිරි මහතා පෙරමුණ ගනිමින් ක්‍රියා කළ බව ගනේගම දොඩන්ගොඩ මාර්ගය ඇතුළු මාර්ග සැකසීමෙන් පෙනී යයි. සිසු දරුවකු වශයෙන් පැරකුම් ශ්‍රමදාන සමිතිය පිහිටුවා ගනිමින් කළ උදාර සේවාව නිසාවෙන්ම බද්දේගම මාර්ග සංවර්ධනයේ නියමුවා වශයෙන් ඔහුව හැඳින් වූ බව ප්‍රදේශයේ ජනතාව අදත් කෘතවේදීව සඳහන් කරති.

අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පිවිසුණු අමරසිරි මහතා එහිදී චීන කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධතා දක්වමින් ක්‍රියා කළේය. එවකට අග්‍රාමාත්‍ය ධුරය දැරූ ඩඩ්ලි සේනානායක මැතිතුමා ශිෂ්‍යයන් ඇමතූ රැස්වීමකදී ඉතාම විචක්ෂණශීලීව හා තර්කාන්විතව දේශපාලනය පිළිබඳව ප්‍රශ්න අසමින් අගමැතිතුමා අපහසුතාවට පත් කිරීමට තරම් සමත් බුද්ධියක් හා දැනුමක් එතුමා සතුව පැවති බව පෙන්නුම් කළේය. යුක්තිය හා සාධාරණත්වය රජ කරවන සමාජයක් අපේක්ෂාවෙන් දොඩන්ගොඩ මහතාගේ සටන් භූමිකාව ප්‍රදර්ශනය වූ ප්‍රථම අවස්ථාව මෙය විණි.

1963 දී ශාස්ත්‍රවේදී උපාධිය හිමි කර ගත් එතුමාට තවලම මහා විද්‍යාලයට ගුරු පත්වීමක් ලැබුණත්, එය භාර නොගෙන පිරිවෙන් ගුරුවරයකු වශයෙන් ගාල්ල, විද්‍යාලෝක පිරිවෙන තුළින් විශාල භික්ෂු පිරිසකට අධ්‍යාපනය ලබා දෙමින්, නැණස පෑදීමට දායක විය. දේශපාලන විද්‍යාව සහ ආර්ථික විද්‍යාව යන විෂයයන් ශිෂ්‍යයනට ඉගැන්වීමේ දී විශ්වවිද්‍යාලය තුළින් ලද පන්නරය හේතුවෙන් තම ගෝල බාලයනට දේශපාලන විද්‍යාව පමණක් නොව නිවැරදි දේශපාලන ගමන් මඟ කුමක්දැයි තෝරා බේරා දෙන්නට ද එතුමා සමත් විය. ඉන් පසු අධ්‍යාපන පරිපාලන සේවයට එක් වූ දොඩන්ගොඩ මහතා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පළ කළ "අකුර" පුවත් පතේ උපදේශක කර්තෘවරයෙකු ලෙස ද කටයුතු කළේය.

එතුමා 60 වන දශකයේ අග සහ 70 වන දශකයේ මුල ඇති වූ සමාජ අරගලකාරී ව්‍යාපාරයන්ට ක්‍රියාකාරීව මැදිහත් විය. 1967 වර්ෂයේ දී බද්දේගම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මධ්‍ය සංවිධානයේ ලේකම් ධුරයට පත් වූ අමරසිරි මහතා "ගිනි පුපුර" හා "ජන වේගය" වැනි සංවිධානයන්හි උද්‍යෝගිමත් සාමාජිකයකු ලෙස සමාජ විරෝධී ක්‍රියාකාරකම්වලට එරෙහිව නැඟී සිටිමින් වාමාංශික දේශපාලනයේ නියැලුණේය. පසුව "ජන වේගය" සංවිධානයේ ප්‍රධාන ලේකම් ධුරයට පත් වූ දොඩන්ගොඩ මහතා දේශපාලනය හා සමාජ අවබෝධය මතු පරම්පරාවට ලබා දුන් නායකයෙක් විය.

රැඩිකල් මතවාදී අදහස් දැරූ එතුමා 1971 ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරිකයකු නොවුවද ප්‍රශ්න කිරීමට පොලීසිය මඟින් රඳවා ගෙන තිබුණි. මේ කාලයේ තමන් සතුව පැවති අලුත්ම මෝටර් රථය කිසියම් පිරිසක් සොරා ගත්තෙන් එය සොයා ගැනීමට වාහනයේ වටිනාකමට වඩා වැඩි මුදලක් වියදම් කළේය.

පසුව වාහනය සොයා ගත්තද එය පොලීසියේ දිරා යාමට ඉඩ හැරි එතුමා පැවසුවේ "මට අවශ්‍ය වුණේ වාහනය සොරා ගත්තේ කවුද, කුමකටද යන්න දැන ගැනීමටයි. එය මා සතුව තිබියදී වැඩියෙන් පාවිච්චි කළේ ගමේ ලෙඩුන් රෝහලට ගෙන යනවා වාගේ දේවල්වලටයි" කියලායි. මෙම කරුණ තුළින් ද පැහැදිලි වනුයේ තරුණ කාලයේ සිටම ජනතාව වෙනුවෙන්ම කැපවූ සැබෑ මානව හිතවාදී අදහස් එතුමා තුළ පැවති බවයි.

පූර්ණ කාලීන දේශපාලනඥයකු වශයෙන් 1977 මහ මැතිවරණයේදී එක්සත් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වශයෙන් අක්මීමන ආසනයට තරග වැදුණු අමරසිරි මහතා මේ කාර්යයන් අතරතුර නීති විද්‍යාලයට ද පිවිස ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු ලෙස සමාජ අසාධාරණයන්ට එරෙහිව විවිධ අරගලවලට මැදිහත් වෙමින් සහ දේශපාලන කටයුතු කෙරෙහි ද උනන්දු වෙමින් ක්‍රියා කළේය. නීති උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් 1979 වසරේ දී දොඩන්ගොඩ මහතා දිවුරුම් දුන්නේය.

1977 දී බලයට පත් වූ එක්සත් ජාතික පක්ෂය ජනතාවට සිදු කළ දැඩි පීඩාවන්ට එරෙහිව ක්‍රියා කරමින් 80 දශකයේ මුල් භාගයේ දී ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රබල නායකයකු බවට පත් වූ

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

අතර, එම කාල වකවානුව තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අභිවෘද්ධිය වෙනුවෙන්ද සුවිශේෂී මෙහෙවරක් ඉටු කිරීම හේතුවෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් එතුමාට බද්දේගම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායක ධුරය 1980 දී පිරිනමනු ලැබුවාය.

එක්සත් ජාතික පක්ෂ රජය යටතේ දැඩි පීඩාවට පත් ජනතාව 1983 පැවති බද්දේගම අතුරු මැතිවරණයේදී තම නියෝජිතයා වශයෙන් තෝරා ගනු ලැබුයේ මේ ජනතා හිතවාදියායි. ඒ අනුව අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා පළමු වරට මෙම උත්තරීතර සභාවට පැමිණ විපක්ෂයේ අසුන් ගත්තේය. සමස්ත ශ්‍රී ලංකාවේම අවධානය යොමු වූ මෙම මැතිවරණයෙන් ජය ලැබූ එතුමා අයුක්තිය, අසාධාරණය වෙනුවෙන් නැගූ හඬ පොදු ජනතාවට විශාල ශක්තියක් විණි. භීෂණ සමයේ දී මහජන නියෝජිතයන්ට මරණ තර්ජන ඇති වුවද ඒ කිසිවකිනුත් නොසැලුණු එතුමා සිය යුතුකම හා වගකීම මැනවින් ඉටු කරලීමට සමත් විය.

1989 වර්ෂයේ පැවති මහ මැතිවරණයේදී ගාල්ල දිස්ත්‍රික් නායකයා ලෙස තරග වැදුණු දොඩන්ගොඩ මහතා මනාප හැට අටදහසක් පමණ ලබා දිස්ත්‍රික්කයේ පළමු වැනියා වශයෙන් මෙම සභාවට පැමිණ විපක්ෂ මන්ත්‍රීවරයකු වශයෙන්ම යළිත් අසුන් ගෙන වෙල්ලස්සේ ඉඩම් කොල්ලය, හිඟුරාණ සීනි කම්හල් සටන, ධීවර හා කම්කරු වෘත්තීය අරගල වෙනුවෙන් ක්‍රියාකාරී මෙහෙවරක් ඉටු කළේය.

1993 පැවති දකුණු පළාත් සභා මැතිවරණයේ දී පොදුජන එක්සත් පෙරමුණු කණ්ඩායමේ නායකයා වශයෙන් සටනට පිවිසුණු අමරසිරි දොඩන්ගොඩ මහතා එහිදී ඡන්ද 1,36,000ක් පමණ ලබා ගනිමින් දකුණු පළාත් සභාවේ බලය සියතට ගත්තේ වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ද සහයෝගය ලබා ගනිමිනි. එම සුවිශේෂී ජයග්‍රහණය අකර්මණ්‍ය කිරීමට සූදානම් වූ එවකට සිටි පාලකයෝ ආණ්ඩුකාර නිවසේ දොරගුළු දමා ආණ්ඩුකාරවරයා සඟවා තිබියදී එහි ඇතුළු වී සාධාරණත්වයේ නාමයෙන් දිවුරුම් දීම සමස්ත ශ්‍රී ලංකාවේම දේශපාලන ගමන් මාර්ගය වෙනස් කරලීමට සමත් වූ සන්ධිස්ථානයක් විය,

එවකට පැවති රජයේ දහහත් අවුරුදු අඳුරු පාලනය නිමාවට පත් කරලීමේ පළමු වෙඩි මුරය තැබීමක් විය.

එදා මහ ඇමති ධුරයේ කටයුතු භාර ගනිමින් එතුමා කියා සිටියේ "මේ ඇමතිකම දොඩන්ගොඩට ලැබුණාට මම දොඩම්ගොඩ බදා ගත් මිනිසෙක් නොව, දොඩම්ගොඩ බෙදා දෙන මිනිසෙක්" බවයි. වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම එය එසේම සිදු විණ. ඒ තරමට සාධාරණ අයිතිවාසිකම් සියලු තරාතිරම්වල ජන කොටස්වලට ලබා දීමේ ජනතාවාදී දේශපාලනයේ එතුමා නියැලුණේ තමන් වෙත කිසිවක් පොදි ගසා නොගනිමිනි. එවන් උදාර පරහිතකාමී පුද්ගලයකු වූ නිසාම ජනතා සිත් සතන් තුළ සැම දා එක ලෙස ජීවත් වීමට අමරසිරි දොඩන්ගොඩ මහතාට හැකි විණ.

ප්‍රැන්සිස්කුකරණය නමින් එදා ප්‍රකට වූ සිද්ධිය මඟින් පළාත් සභා අය වැය පරාජය කිරීමට කටයුතු සැලැස් වීමෙන් හා පොදු මහජනතාව ලැබූ ජයග්‍රහණය වළකා ලීමට පාලක පක්ෂය යෙදූ උපාය හේතුවෙන් නැවත 1994 වර්ෂයේ දී පළාත් සභා මැතිවරණයක් පැවැත් වීමට සිදු විණ. එම පළාත් සභා මැතිවරණයෙන් ඊටත් වැඩි ජයග්‍රහණයක් ලබමින් දකුණු පළාත් සභාවේ මහ ඇමති ධුරයට පත් වූ එතුමාගේ ඒ සුවිශේෂී ජයග්‍රහණය ගලන ගඟ කිසි සේත්ම ආපසු නොගලන බවට කදිම නිදසුනක් සැපයූවා සේම, එය සිරිලක පුරාම ප්‍රගතිශීලි බලවේගයන්ගේ විජයග්‍රහණයට ද හේතු විණ.

අක්‍රියව පැවති දකුණු පළාත් සභාව තුළින් ග්‍රාමීය පාසල් දියුණු කිරීමටත්, විභාග සඳහා පෙනී සිටින දරුවන්ගේ දැනුම අධ්‍යාපන සම්මන්ත්‍රණ මඟින් වැඩිදියුණු කිරීමටත්, සාධාරණ පදනමක් යටතේ ගුරු මාරු සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කිරීමටත්, කලාප අධ්‍යාපන කාර්යාල ගණනාවක් අලුතින් ඇති කිරීමටත්, නොමිලේ වෛද්‍ය සායන පවත්වමින් සෞඛ්‍ය සේවා සැපයීමටත්, මන්ද පෝෂිත ගැබිනි මවුවරුන් සඳහා සහන වැඩ පිළිවෙළක් සැකසීමටත්, තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුසලතා වැඩිදියුණු කිරීමට ක්‍රීඩා පාසල් බිහි කරලීමටත්, ගොඩ බිමට කරදිය ගලා ඒම වැළැක්වීම සඳහා පොම්ප සවි කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කිරීමටත් හැකියාව ලැබුණේ, දොඩන්ගොඩ මහතාගේ දැඩි කැපවීම නිසාවෙන්ම බව සඳහන් කළ හැකිය.

නැවත 1994 වසරේ පැවති මහ මැතිවරණයේ දී ගාල්ල දිස්ත්‍රික්කයට පොදුජන එක්සත් පෙරමුණ යටතේ තරග වැදුණු එතුමා මනාප 1,76,000ක් ලබා ගනිමින් තුන් වන වරටත් මෙම සභාවට පැමිණියේය. මෙතෙක් ගාල්ල දිස්ත්‍රික්කයෙන් එතරම් මනාප සංඛ්‍යාවක් වෙනත් කිසිදු අපේක්ෂකයකු ලබා නොමැති බව සනිටුහන් කළ යුත්තේ එතුමාට දක්වන ගෞරවයක් වශයෙනි. එම රජයේ ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන, සමුපකාර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ දොඩන්ගොඩ මහතා එම වසරේදීම සිදු කළ අමාත්‍ය මණ්ඩල සංශෝධනයේදී සමුපකාර, පළාත් සභා හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දුන්නේය.

1997 දී වෘත්තීය පුහුණු හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ එතුමාට දිවයින පුරා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඇති කරමින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබා දීමේ ජාතික මෙහෙවරක යෙදීමට හැකියාව ලැබිණි.

2000 වසරේ පැවැති මහා මැතිවරණයෙන් ද ජයග්‍රහණය ලැබූ දොඩන්ගොඩ මහතා වෘත්තීය පුහුණු අමාත්‍යවරයා වශයෙන් යළිත් තම රාජකාරි ඇරඹුවේය. 2001 වර්ෂයේදී එතුමා මානව සම්පත් සංවර්ධන සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් පත් කරනු ලැබිණි. එම වසරේදීම පැවැති මැතිවරණයෙන්ද නැවත වරක් ජයග්‍රහණය ලැබූවද, එක්සත් ජාතික පක්ෂ රජයක් බලයට පත් වීම හේතුවෙන් විපක්ෂ මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කිරීමට එතුමාට සිදු විණි. මහජන ප්‍රසාදය ඉතා ඉහළින් දිනා ගත් අතිඋදාර රුහුණු පුත්‍රයකු වූ අමරසිරි දොඩන්ගොඩ මහතා 2004 වසරේ දී පැවැති මහා මැතිවරණයෙන්ද නැවත වරක් විශිෂ්ට ලෙස ජයග්‍රහණය ලබා, මෙම උත්තරීතර සභාවට පැමිණ, එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දුන්නේය.

මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයට පත් වීමෙන් පසු නව කැබිනට් මණ්ඩලය දිවුරුම් දීමේ අවස්ථාවට අසනීප තත්ත්වය හේතුවෙන් එතුමා සහභාගි නොවීය. එහෙත් අතිගරු ජනාධිපතිතුමා ප්‍රතිපත්ති ගරුක දේශපාලනඥයකු වූ අමරසිරි දොඩන්ගොඩ මහතාගේ නිවසට ගොස් සුව දුක් විමසීමෙන් අනතුරුව, දොඩන්ගොඩ මහතා ජනාධිපතිතුමා ඉදිරියේ අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දුන්නේය. අසනීප තත්ත්වය කෙසේ වෙතත් මිය යන තෙක්ම තමන් වෙත පැවැරුණු එම තනතුරේ වගකීම නොපිරිහෙළා ඉටු කිරීමට එතුමා සමත් විය.

අඩ සිය වසකට වැඩි කාලයක් මේ රටේ සමාජ සාධාරණත්වය, යහ පාලනය හා ජාතික ආර්ථිකයේ උන්නතිය වනුවෙන් කැප වී ක්‍රියා කළ ශ්‍රී ලාංකීය ප්‍රගතිශීලි වාමාංශික දේශපාලන කරළියේ නොනැසෙන නාමයක් තැබූ අදීන සහ පරිණත දේශපාලනඥයකු වූ එතුමා දේශපාලනයේ යෙදෙන ආධුනිකයන් රැසකට ආදර්ශවත් මාර්ගෝපදේශකයකු විය. වසර විසිහයක් අඛණ්ඩව මෙම පාර්ලිමේන්තුව නියෝජනය කළ අපරාජිත දේශපාලනඥයකු වූ එතුමා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අන්තර්ජාතික පාර්ලිමේන්තු සංගමයේ සමුළුවලට සහභාගි වීම වැනි රාජ්‍ය තාන්ත්‍රික විදේශ චාරිකා ගණනාවක ද නියැලුණේය.

නිහතමානීත්වයේ ප්‍රතිමූර්තියක් බඳු වූ දොඩන්ගොඩ මහතා දකුණු පළාත් සභාව තුළත්, පාර්ලිමේන්තුව තුළත් උදාර ජනතා මෙහෙවරක් ඉටු කළේය. සාමාන්‍ය මිනිසුන් සමඟින් නිරතුරුව

කටයුතු කළ එතුමා අවංකත්වයෙන් ද ප්‍රමුඛස්ථානයක් ඉසිලූ අතර, කිසි දිනක වංචාවකට හෝ දූෂණ චෝදනාවකට ලක් නොවෙමින් සත්පුරුෂ දේශපාලනයේ නියැලුණු අතිඋදාර පුද්ගලයකු වශයෙන් හැඳින්විය හැක. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උපසභාපතිවරයකු වශයෙන් පක්ෂයේ අභිවෘද්ධිය වෙනුවෙන් නිබඳවම කැප වූ එතුමා විශ්වාසවන්ත දේශපාලනඥයන් අතර හිණි පෙත්තෙහිම සිටි පුද්ගලයෙකි.

සුළු ජාතිකයන් වෙනම ජාතීන් වශයෙන් නොසලකා ප්‍රධාන ජාතියට ලැබෙන සියලු අයිතිවාසිකම් නොබෙදුණු ශ්‍රී ලංකාවක් තුළ ඔවුන්ට ද බෙදා දිය යුතු යයි අදහස් කළ අමරසිරි දොඩන්ගොඩ මහතාට ඒකීය ශ්‍රී ලංකාවක් සඳහා අඩිතාලම වැටී ඇති මෙවන් මොහොතක එම සතුට භුක්ති විඳීමට ඉඩ ප්‍රස්තාවක් නොලැබිණ. කලක් අසනීප තත්ත්වයෙන් පසු වූ අමරසිරි දොඩන්ගොඩ නම් වූ මානව හිතවාදියා, පිබිදෙන දේශයේ ජාතිය වෙනුවෙන් තවත් මෙහෙවර රැසක් ඉටු කිරීමට හැකියාව තිබියදීත් කාගේත් නෙතට කඳුළක් එක් කරමින් 2009 මැයි මස 30 වන දින සදාකාලිකව අප අතරින් වෙන් විණ.

ගරු කථානායකතුමනි, දේශපාලන මතවාද පසෙකලා ජනතාව උදෙසා සැම විටම තම සේවය කැප කළ සැබෑ මානව හිතවාදියකු වූ හිටපු අමාත්‍ය අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාගේ අභාවය ගාල්ල ප්‍රදේශයට පමණක් නොව මුළුමහත් ශ්‍රී ලංකාවටම දැරිය නොහැකි පාඩුවකි. වසර ගණනාවක් තිස්සේ මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අමරසිරි දොඩන්ගොඩ මැතිතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනය කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාව ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි.

[පූ. භා. 10.42]

**ගරු දි. මු. ජයරත්න මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி. எம். ஜயரத்ன - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. D. M. Jayaratne - Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ඉදිරිපත් කරපු සම්පූර්ණ කරුණු පිළිගන්නා අතර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන කාලයේ ඉඳන්ම මා දේශපාලනය කරද්දී ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා මාත් එක්ක ඉතාම මිත්‍රශීලීව ක්‍රියා කරපු, ඉතාම දක්ෂ ශිෂ්‍යයකුය කියන එක මා ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමාගේ දේශපාලන ක්‍රියාදාමයන් අපේ නව දේශපාලන ක්ෂේත්‍රයට ඉතාම ආදර්ශයක් කියලා ප්‍රකාශ කරන්න පුළුවන්. තමන්ගේ විරුද්ධ දේශපාලන පාක්ෂිකයන් සම්බන්ධයෙන් වුණත් ඔවුන්ට තමන්ගේ ශක්තිය තුළින්, දේශපාලන දර්ශනය තුළින් ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළක් තිබුණා නම් එයට බොහොම කරුණාවෙන්, මෛත්‍රියෙන්, කිසිම අගතියක් නැතුව, කිසිදු භේදයකින් තොරව උදවු කරපු ශ්‍රේෂ්ඨ දේශපාලනඥයකුය කියලාත් ප්‍රකාශ කරන්න පුළුවන්. අවසාන කාලයේදී බොහෝ සෙයින් අසනීප තත්ත්වයෙන් සිටි නිසා සැහෙන වැඩ කොටසක් කරන්න අපහසු වුණත් රෝද පුටුවේ ඉඳ ගෙන එතුමා මේ පාර්ලිමේන්තුවට ආපු බව ඔබතුමා දන්නවා ගරු කථානායකතුමනි. එහෙම ආපු හුඟක් අවස්ථාවල අපි කිව්වා, "මෙහෙම මහන්සි වෙන්න එපා" කියලා. "නැහැ, නැහැ, මට වැඩ කරන්න පුළුවන් අවසානය දක්වා මේ වැඩ කරනවා" කියලා එතුමා කිව්වා. ඒ විධියට එතුමා කැබිනට් මණ්ඩලයට ගියා. එතුමා තමන්ගේ දුක් දොම්නස් ඒ කිසිම දෙයක් කල්පනා කරන්නේ නැතුව ජනතාව වෙනුවෙන් ක්‍රියා කරපු ශ්‍රේෂ්ඨ නායකයෙක්. ගරු කථානායකතුමනි, මම දීර්ඝ වශයෙන් ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු කථානායකතුමනි, එතුමා සම්බන්ධයෙන් කවි කිහිපයක් කියන්න මා ඔබතුමාගෙන් අවසර පතනවා.

| | |
|---|---|
| ගුණයෙන් පිරි හදවත ඔබෙ සිතන | විට |
| මගෙ හදවත දුක් සයුරේ ගිලෙන | විට |
| අදහා ගත නොහැක සිදු වූ විපත | පට |
| උපදින්ට සිරිලකේ සසර සැරි සරණ | විට |
| වැඩ කළා සිරිලකට අභිමානයෙන් යුතු | ව |
| සලකලා දුප්පතුන් දිනවන්න ගුණවත් | ව |
| පිරිහෙළා අසමඟිය සමඟියට පය තැබු | ව |
| කල්බලා වැඩ කළේ ඔබයි එය දැනුවත් | ව |
| එක්වාදහස් නවසිය හතළිස් දෙකේ | සොඳ |
| දහවෙනි මාසෙ දහඅටවෙනි දිනේ | අද |
| උපන් කුමරු අමරසිරි යැයි නම් | ලද |
| වැඩුණේ මව්පියන්ගේ ආදරය | මැද |
| බද්දේගම රතන සාර | විදුහලෙනුත් |
| ගාලුපුරේ රිච්මන්ඩ් යන | විදුහලෙනුත් |
| ඉගෙනුම දක්ෂ අන්දමටම ලබා | ගත් |
| රුහුණු පුතුට ගුරු දෙගුරුන් | සලකත් |
| නීති හදාරන්නට හිත ගිය | ඔහුට |
| හැකිවිය ඇතුළු වන්නට නීති | විදුහලට |
| නීතිය හදාරා දක්ෂම සිසු | ලෙසට |
| නීතියෙ පිහිට ලැබදුනි දුප්පත් | දනට |
| පේරාදෙණිය සරසවියට ඇතුළත් | ව |
| සිසු සැමගේ ආදරබර මිතුරෙක් | ව |
| දෙස් පාලනේ කරමින් මා හා එක් | ව |
| වැජඹුණි සරසවියෙ නැණවත් සිසුවෙක් | ව |
| අතුරු මැතිවරණෙ බද්දේගම | අසුනේ |
| ජනතා අසිරිවාදෙන් එය දිනා | ගැනේ |
| සේවය කළේ රෑ දාවල් | නොබලානේ |
| අමතක නොවෙයි ජනතාවට කෙළෙහි | ගුනේ |
| පළාත් සභාවේ දකුණේ අනු | තුනේ |
| සැමදෙන වඩා හිදුවයි මහමැති | අසුනේ |
| අමරසිරි ඇමති දකුණට පුන්සඳ | නේ |
| අමතක නොවෙයි විරුවානම් මේ | රුහුනේ |
| මහත් දුකක් ඇතිවෙයි පට ඔබ | නැතිදා |
| බුද්ධිය තුළින් සේවය කළ අප | මැතිදා |
| නැවතත් උපදින්න සිරිලක තුළ | නිබදා |
| කළගුණ දත් දනන් සැමවිට නමදී | සදා |
| දෙස් පාලනේ දින දින පහළට | යනවා |
| ඔබ වැනි දනන් එය නැඟුමට වෙර | දැරුවා |
| මෙරට දනට එය අමතක නොම | වේවා |
| නිවන් දකිනතුරු බට සැප සම්පත් | ඒවා |
| වෙරදා කම්කරුන් සමඟින් ඔබ කළ | සේවේ |
| සැමදා සමරන්නේ ඔවුනුන් ලැබුව | සුවේ |
| පරදා ධනපතින් ඔබ දුන් සතුටු | මැවේ |
| හැරදා ගියෙන් ඒ හැම දෙන අද | දුක් වේ |
| ඔබ මැතිනිය දරුවන් සහ | නෑදෑයින් |
| හිත මිතුරන් අප වැනි අය මැති | සබයෙන් |
| දුක්වන්නේ හදවත තුළ ඇති | බැතියෙන් |
| මැතිඳුනි නිවන් සුව ලැබේවා ඔබට | නිතින් |

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමාට මූලාසනයට පැමිණෙන ලෙස ආරාධනා කරනවා. ඊළඟට ගරු ජිනදාස කිතුලගොඩ මැතිතුමා ශෝකය ප්‍රකාශ කරනවා.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු පියංකර ජයරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு பியங்கர ஜயரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. PIYANKARA JAYARATNE] *took the Chair.*

[පූ. භා. 10.47]

**ගරු ජිනදාස කිතුලගොඩ මහතා**
(மாண்புமிகு ஜினதாஸ கிதுலகொட)
(The Hon. Jinadasa Kitulagoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, ඒ වාගේම අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාගේ අභාවප්‍රාප්ත වීම නිමිත්තෙන් ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී මටත් අදහස් දක්වන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මතකයේ හැටියට 1970 දශකයේ මුල භාගයේ විතර ඉඳලා ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා සමඟ ඉතාම සමීප සම්බන්ධතාවක් තිබුණු කෙනකු හැටියට අද මේ වෙලාවේ එතුමා පිළිබඳව කථා කරන්න මට අවස්ථාව ලැබීම පිළිබඳවයි මගේ කැමැත්ත පළ කළේ.

අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා එදා සිටම ඉතාම සරල ජීවිතයක් ගත කරපු, ඉතාම නිහතමානී ගති පැවතුම් තිබුණු, ඉතා උසස් මිනිසකු හැටියට හඳුන්වන්න මා කැමැතියි. මොකද, අපි ඇසුරු කරපු පසු ගිය කාලය පුරාම අපි නිරන්තරයෙන් දේශපාලන කරුණු කාරණා ගැන සාකච්ඡා කළා. ඒ වාගේම රටේ සාමාන්‍ය සිදුවීම් පිළිබඳව සාකච්ඡා කළා. විවිධ දේවල් ගැන විවිධ මාතෘකා ඔස්සේ සාකච්ඡා කළා. මේ හැම තැනකදීම පීඩිත මිනිසුන් වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයකු හැටියට තමයි මා එතුමාව දැක්කේ. එතුමාගේ මේ සරල ජීවිතයම ඒකට හොඳ උදාහරණයක්.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මුලින්ම තේරී පත් වුණාට පස්සේ එතුමා කලින් පාවිච්චි කළ පරණ ජීප් එකෙන් ගාල්ලට එනවා. බද්දේගම, ගිනිමැල්ලගහ ඉඳන් එතුමා මේ පරණ ජීප් එකෙන් ගාල්ලට එනවා. එහෙම ඇවිත් ඒ ජීප් එක තමන් වැඩ කරපු විද්‍යාලෝක පිරිවෙනේ නවත්වලා එතැන් සිට ස්ටේෂන් එකට ඇවිල්ලා කෝච්චියේ නැඟිලා තමයි පාර්ලිමේන්තුවට ආවේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත් වුණත් එතුමා තමන්ගේ ඒ නිහතමානීකම, ඒ තිබෙන වාම් ජීවිත ලක්ෂණ අත් හැරියේ නැහැ. එතුමා ඒවා ඉතා හොඳින් ආරක්ෂා කර ගත්තාය කියන කාරණාව මා මෙතැනදී මතක් කරන්න ඕනෑ.

එතුමා ගුරුවරයකු හැටියට කටයුතු කරන විට ගෝලයන් එක්ක තිබුණේ ගුරු-ගෝල සම්බන්ධතාවක් නොවෙයි. ගුරු-ගෝල සම්බන්ධතාවට වඩා බොහොම සමීප සම්බන්ධතාවක් තමයි තිබුණේ. එතුමාගේ ශිෂ්‍යයකු හැටියට හිටියා හිටපු විගණන අධිකාරිවරයකු වන පියසේන වික්‍රම ජයලත් මහත්මයා. ඔහුත්, එතුමාත් එක කාමරයේ ඉඳ ගෙන තමයි නීති උපාධියට පාඩම් කළේ. ඒ පාඩම් කරන විට මේ දෙන්නාගේ කිසි වෙනසක් තිබුණේ නැහැ. දෙන්නා යාළුවන් වාගේ තමයි ඇසුරු කළේ. හැබැයි පියසේන මහත්මයා එතුමාට, "සර්" කියලා කථා කරනවා. දොඩන්ගොඩ මැතිතුමා එයාට "කලු මහත්තයා" කියනවා. ඒ වාගෙයි හිටියේ. තමන්ගේ ගෝලයා කියා එහෙම දුරස්භාවයක්, පරස්පරතාවක් - ඒ මොකුත් - තිබුණේ නැහැ. හරිම නිහතමානී විධියට තමයි ඒ දෙදෙනා ඇසුරු කළේ. අපි එක්ක වුණත් එහෙමයි. ඒ කාලේ එතුමාත් මන්ත්‍රීවරයෙක් නොවෙයි. මාත් මන්ත්‍රීවරයෙක් නොවෙයි. නමුත් අපි අතර ඉතාම සමීප සම්බන්ධතාවක් තමයි තිබුණේ.

දේශපාලනිකව ගත්තාම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඉතාමත්ම ප්‍රගතිශීලී පිලේ හිටපු පුද්ගලයෙක්. ප්‍රගතිශීලී පිලේ දුප්පත් මිනිස්සු වෙනුවෙන්, පීඩාවට පත් වෙච්ච මිනිස්සු වෙනුවෙන් කටයුතු කරපු පුද්ගලයෙක්. මට මතකයි, මේ පසු ගිය කාලයේ අසනීපයෙන් ඉන්න අවස්ථාවේ හම්බ වුණු අවස්ථාවක එතුමා කියපු කථාවක්. කුල පීඩනයට පත් වුණු එක්තරා ගම්මානයක් ගැන එතුමා කිව්වා. ඒ වන විටත් ඒ අයගේ ගම හඳුන්වන්නේ ඒ කුලය නියෝජනය කරන නමින්. එතුමා කිව්වා, "මට මේක වෙනස් කරන්න ඕනෑ වුණා" කියා. "මේක වෙනස් කරන්න කොහොමද මා කටයුතු කරන්න ඕනෑ" කියා එතුමා කල්පනා කළා. එතුමාගේ ගෙදර රන් තැඹිලි ගහක් තිබුණා. ඒ රන් තැඹිලි ගහේ ගෙඩි ටික පැහුණාට පස්සේ පැළ කරලා අර හැම ගෙදරකටම එක පැළය බැගින් බෙදා දීලා ඒ ප්‍රදේශයට "රන් තැඹිලි උද්‍යානය" කියලා නමක් තිබ්බා. සමාජ අසාධාරණයට පත් වෙච්ච අය මොහොතකට හරි ඒ අසාධාරණයෙන් මුදලා තියා ගන්න එතුමා කටයුතු කරපු ආකාරය මේ උදාහරණයෙන් ඉතාම හොඳින් පැහැදිලි වනවා. ඒ වාගේම එතුමා කියුබානු මිත්‍ර සංගමයේ සභාපති හැටියට ලෝකයේ සමාජවාදී කඳවුර නියෝජනය කරපු කෙනෙක්.

ඒ වාගේම 1994 දී දකුණු පළාත් සභාවේ මහ ඇමතිවරයා හැටියට එතුමා බහු ජාතික සමාගම්වලට එරෙහිව විශාල අරගලයක් කළ බව මා මතක් කරන්න ඕනෑ. කොකා කෝලා බීම දකුණු පළාතේ වර්ජනය කරනවා කියලා එතුමා කිව්වා. ඒක සාර්ථක වන්න නැතිව ඇති. එවැනි ක්‍රියා මාර්ගයක් රට පුරා සාර්ථක කර ගන්න බැහැ කියා අපි දන්නවා. නමුත් මේ සම්බන්ධයෙන් එතුමාගේ තිබුණු උනන්දුව අපට හොඳට පැහැදිලි වුණා. අපි බහු ජාතික සමාගම් නඩත්තු කරන්නේ නැතිව, බහු ජාතික සමාගම් පෝෂණය කරන්නේ නැතිව, බෙලි මල් එහෙම නැත්නම් එළ කිරි වාගේ ගමේ නිපද වන පෝෂ්‍යදායී ආහාර වර්ගවලට පුරුදු වන්න, පුරුදු කරන්න අවශ්‍යයි කියන සංකල්පයක එතුමා සිටියා.

එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වාමාංශය නියෝජනය කරපු මන්ත්‍රීවරයකු හැටියට සලකන්න පුළුවන්කම තිබෙනවා. මට මතක හැටියට 1976 දී පමණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වාමාංශික මන්ත්‍රීවරු එතැනින් ඉවත් වුණා. එතකොට එතුමා මන්ත්‍රීවරයෙක් නොවෙයි. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ක්‍රියාකාරිකයෙක්; සංවිධායකයෙක්. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වාමාංශය නියෝජනය කරපු ටෙනිසන් එදිරිසූරිය මන්ත්‍රීතුමා, නන්ද එල්ලාවල මන්ත්‍රීතුමා, ටී.බී. සුබසිංහ ඇමතිතුමා වැනි අය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවෙන්, සමගි පෙරමුණු ආණ්ඩුවෙන් ඉවත් වෙලා වෙනම දේශපාලන සංවිධානයක් පිහිටෙව්වා. මගේ මතකයේ හැටියට ඒ දේශපාලන සංවිධානය මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයයි; පීඩීපී. එතකොට මේක පිහිටෙව්වේ ඇයි? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වඩා ප්‍රගතිශීලී, ජනතාවට සමීප, ඒ වාගේම සමාජවාදයට යෑමේ අරමුණ ඇතිව ඒ පක්ෂය පිහිටු වන කොට ඒ පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා හැටියට පත් වුණේ දොඩන්ගොඩ මැතිතුමායි. එදා සිටම-

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා (ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியகலாநிதி) ராஜித சேனாரத்ன - நிர்மாணத்துறை, பொறியியல் சேவைகள் அமைச்சர்)
(The Hon (Dr.) Rajitha Senaratne-Minister of Construction and Engineering Services)

නැහැ, නන්ද එල්ලාවල මැතිතුමා තමයි ප්‍රධාන ලේකම්. නියෝජ්‍ය ලේකම් දොඩන්ගොඩ මැතිතුමා.

**ගරු ජිනදාස කිතුලගොඩ මහතා**
(மாண்புமிகு ஜினதாஸ கிதுலகொட)
(The Hon. Jinadasa Kitulagoda)

එතුමා නියෝජ්‍ය ලේකම්. ඔබතුමාට බොහොම ස්තුතියි මාව නිවැරදි කිරීම සම්බන්ධයෙන්. මගේ මතකය අනුවයි මා එහෙම කිව්වේ.

**ගරු ඩිව් ගුණසේකර මහතා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - அரசியலமைப்பு அலுவல்கள், தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Dew Gunasekara -Minister of Constitutional Affairs and National Integration)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ජිනදාස කිතුලගොඩ මහතා**
(மாண்புமிகு ஜினதாஸ கிதுலகொட)
(The Hon. Jinadasa Kitulagoda)
ඩිව් ගුණසේකර ඇමතිතුමාත් සිටියා. හරි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි අනික් කාරණාව, මාක්ස්වාදී දර්ශනය අනුව සමාජවාදය පිළිගත් කෙනෙක් තමයි මේ දොඩන්ගොඩ මැතිතුමා. සමාජවාදයෙන් තමයි මේ රටේ ප්‍රශ්න විසඳන්න පුළුවන්කම තිබෙන්නේ. මේ රටේ විතරක් නොවෙයි, ලෝකයේ ඕනෑම තැනක, ඕනෑම රටක ප්‍රශ්න විසඳන්න පුළුවන්කම තිබෙන්නේ සමාජවාදය යටතේ. එතුමා හිටපු තැන සම්බන්ධයෙන් අපි විවිධ වාද විවාද කළා. ඒ වන කොට අර කිව්වා වාගේ ජන වේගය කණ්ඩායමේ වැඩ කරන කාලයේ දේශපාලන කරුණු කාරණා සම්බන්ධයෙන් අපිත් එක්ක සාකච්ඡා කරන කොට සමාජවාදයට යන උපාය මාර්ගය පිළිබඳව විතරයි එතුමාටයි, මටයි එකඟ වන්න බැරිකම තිබුණේ. මා කිව්වා, සමාජවාදයට යන්නේ සමාජවාදී විප්ලවය මඟින් කියලා. එතුමා සඳහන් කළේ සමාජවාදයට යන්නේ ධනේෂ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය මඟින් කියලායි. එතුමා තෝරා ගත්ත මාර්ගයේ එතුමා ගියා. මා තෝරා ගත්ත මාර්ගයේ අද මම යනවා. අපි දෙදෙනාට එකඟ වන්න බැරි වුණේ මේ කාරණාවේදී විතරයි. අනික් හැම කාරණාවකදීම අපි දෙදෙනාට එකඟ වන්න පුළුවන්කම තිබුණා.

ඒ මොන තත්ත්වයන් තිබුණත් සමාජවාදය ගැන එතුමාට තිබුණු විශ්වාසය බරපතළ විශ්වාසයක්. අවසාන මොහොත වන තුරුත් සමාජවාදය පිළිබඳව බරපතළ ලෙස විශ්වාස කරපු කෙනෙක් එතුමා. එතුමා අසනීපයෙන් සිටියදී අපි සාකච්ඡා කරනවා. රටේ ආර්ථික තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරනවා. මේ ආර්ථික විසඳුම් කොහොමද ලබා දෙන්නේ කියලා සාකච්ඡා කරනවා. ලෝක පරිමාණයෙන් ලෝකයේ ආර්ථික තත්ත්වය ගැන, ගෝලීයකරණය යටතේ සිද්ධ වන්නේ මොකක්ද යන කරුණු කාරණා වාද විවාදවලට භාජන කරනවා. ඒ අවස්ථාවන්වල පිළිගත් දෙයක් තමයි, මේ ධනේෂ්වර ක්‍රමයට තව දුරටත් ඉදිරියට යන්න බැහැ, අද මේ මොහොත වන විට ඉදිරියට යන්න බැරුව මුළු ලෝකයේම ධනේශ්වර ක්‍රමය ඇද වැටෙමින් තිබෙනවාය කියන එක.

"ලෝක ආර්ථික අවපාතය සම්බන්ධයෙන් කේන්ලා, ඩේවිඩ් රිකාඩෝලා, ඇඩම් ස්මිත්ලා ආර්ථික න්‍යායන් ඉදිරිපත් කළා. ඒ ආර්ථික න්‍යායන් තමයි අද මේ විධියට අසාර්ථකභාවයට පත් වෙලා තිබෙන්නේ. මේ අසාර්ථකභාවයට පත් වුණු ආර්ථික න්‍යායන් -මේවා අපේ රටටත් අදාළයි. අපේ රටේ ඇතැම් දේශපාලන පක්ෂවලටත් අදාළයි.- ඔළුවේ තියා ගෙන, කර තියා ගෙන, කරපින්නා ගෙන ගිය අයට අද මේ සම්බන්ධයෙන් කථා කර ගන්න බැරුව ඉන්න තත්ත්වයක් තිබෙනවා" කියලා තමයි ඒ සාකච්ඡාවලදී එතුමා කිව්වේ. අද ඇමෙරිකාව ඇතුළු ධනේශ්වර ලෝකයම ගත්තත් එහෙමයි. ඇමෙරිකාවේ බැංකු කඩා ගෙන වැටිලා තිබෙනවා. ඒ වාගේම රක්ෂණ සමාගම් කඩා ගෙන වැටිලා තිබෙනවා. උකස් ආයතන කඩා ගෙන වැටිලා තිබෙනවා. විශාලතම කර්මාන්තශාලාවක් හැටියට තිබුණු ජෙනරල් මෝටර්ස් කර්මාන්තශාලාව කඩා වැටිලා. මේක තමයි ධනේශ්වර ආර්ථිකයේ කඩා වැටීම. එංගලන්තයේත් එහෙමයි. අනෙකුත් යුරෝපා රටවලත් එහෙමයි. ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය කියන මේ හැම රටකම එහෙමයි. ජපානය, කැනඩාව වාගේ පෙරදිග රටවල පවා ධනේශ්වර අර්ථ ක්‍රම තිබුණා නම් අද ඒවා පසු බෑමට ලක් වෙලා තිබෙනවා. එතුමා මේ සම්බන්ධයෙන් කිව්වේ මොකක්ද? එතුමා මේ සම්බන්ධයෙන් ඉතා පැහැදිලිව කිව්වා, "සමාජවාදී රටවල තිබෙන්නේ සැලසුම් සහගත ආර්ථිකයක්. සැලසුම් සහගත ආර්ථිකයට මේ ආපදාවට මුහුණ දෙන්න පුළුවන්. නමුත් ධනේශ්වර රටවල ඇති සැලසුම් සහගත නොවන ආර්ථික ක්‍රමයන් යටතේ ඒ ගොල්ලන්ට ඔළුව උස්සා ගන්න බැහැ" කියලා. එතුමා තුළින් මෙන්න මෙවැනි විශේෂ තත්ත්වයන් අපි දැක්කා.

එදා මැයි මාසයේ 19 වැනි දා ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අලුත් සැසි වාරය ආරම්භ කළ අවස්ථාව මට මතකයි. ඒ උත්සවය අවසාන වෙලා මමත්, මගේ පාසල් මිත්‍රයෙක් වන අමරසිංහ කුරගල්ආර මහත්මයාත් අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා බලන්න කොළඹ ජාතික රෝහලට ගියා. ඒ වෙලාවේ එතුමාට අපිව දැකලා හඳුනා ගන්න බැහැ. හැබැයි මේ අසවල් අය කිව්වාට පස්සේ, "හා, ඇත්තද? මගේ පරණම යහළුවෝ දෙන්නෙක් නේ මේ" කිව්වා. එහෙම තමයි එතුමා කථා කළේ. ඒ වන විටත් එතුමා උතුරේ යුද්ධය සම්බන්ධයෙන් රේඩියෝ එකේ කියන තොරතුරුවලට හොඳට ඇහුම් කන් දෙමින් හිටියේ. එතුමා තුළින් මම දැක්ක වැදගත්ම ලක්ෂණයක් තිබෙනවා. එතුමා වතාවන් දෙකකදී අසනීප වුණා; paralyse වුණා. එහෙම paralyse වුණත් ඒ වතාවන් දෙකේම එතුමා කිව්ව කථාවක් තමයි "මම කොහොම හරි මේක හදා ගන්නවා" කියන එක. ආත්ම විශ්වාසය අතින් ඉතා හොඳම හොඳ ආදර්ශවත් තැනක එතුමා හිටියා. කායිකව දුර්වලයි. හැබැයි ඔළුව දුර්වල වුණේ නැහැ. මොළය හොඳට වැඩ කළා. අඩුම තරමින් සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර අධ්‍යාපන ක්‍රමය රටේ ස්ථාපිත කරන්න ඕනෑය කියන තැන එතුමා හිටියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ කරුණු කාරණා සියල්ලම සැලකිල්ලට ගත්තාට පස්සේ මෙතුමාගේ වියෝව මුළු රටටම පාඩුවක් හැටියට මා දකිනවා.

මේ මොහොතේ දොඩන්ගොඩ මැතිනියට, ඒ දූ දරුවන්ට, ඒ ඥාතිවරුන් ඇතුළු සියලු දෙනාටම අපි හැම දෙනාගේම ශෝකය පළ කරමින්, එතුමාට අපේ ප්‍රණාමය පුද කරමින් මගේ වචන කිහිපය අවසාන කරනවා.

[පූ. භා. 11.03]

**ගරු ඩිව් ගුණසේකර මහතා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - அரசியலமைப்பு அலுவல்கள், தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Dew Gunasekara -Minister of Constitutional Affairs and National Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාගේ අභාවය නිමිත්තෙන් ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන මේ අවස්ථාවේ, සභානායකතුමා ඉදිරිපත් කළ සවිස්තර වාර්තාවේ අඩංගු කරුණුවලට මුළුමනින්ම මාගේ එකඟත්වය පළමුවෙන්ම පළ කරමින්, දොඩන්ගොඩ ඇමතිතුමාගේ පවුලේ අය වෙත ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ සාතිශය ශෝකය ප්‍රකාශ කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මාර්ගයෙන් ඒ පණිවුඩය යවන්නය කියා ප්‍රථමයෙන්ම මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම අප පක්ෂයේ ආචාරය, ගෞරවය, උපහාරය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

ගරු අමරසිරි දොඩන්ගොඩ හිටපු ඇමතිතුමා අපේ පෞද්ගලික මිත්‍රයෙක්. ඒ වාගේම පාර්ලිමේන්තුවේ සම කාලීන මන්ත්‍රීවරයෙක්. අසූව දසකයේ විපක්ෂයේ මන්ත්‍රීන් සංඛ්‍යාව 9ට බැහැලා තිබුණ අවස්ථාවේදී වසර ගණනාවක් එතුමා සමඟ කිට්ටුවෙන් වැඩ කරන්නට අපට අවස්ථාව ලැබුණා. පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉතාම දුර්වල විපක්ෂයක් තිබුණු අවස්ථාවක අතිදක්ෂ ලෙස එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයකු

[ගරු ඩිව් ගුණසේකර මහතා]

වශයෙන් කටයුතු මෙහෙයවූවා. ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කළ වාර්ෂික වාර්තාවක්වත් විවාදයකින් තොරව සම්මත කරන්නට ඉඩ නොදෙන තරමට ප්‍රබල ලෙස එදා ඒ 9 දෙනා කටයුතු කළා. මට මතකයි, ඒ දිනවල දොඩන්ගොඩ මැතිතුමා හැම විවාදයකටම සහභාගි වුණා. කලින් සූදානම් වෙලා ඇවිල්ලා තමයි එතුමා කතාවක් කළේ. එතුමාගේ කතාවල පර්යේෂණාත්මක ස්වභාවයක් තිබුණා. ඉතා ගැඹුරින් අධ්‍යයනය කරලා තමයි එතුමා කරුණු ඉදිරිපත් කළේ. ඒ වාගේම ආණ්ඩු දෙකකදී සහෝදර ඇමතිවරයකු විධියට එතුමා සමඟ කටයුතු කරන්න මට අවස්ථාව ලැබුණා. 1977 පාර්ලිමේන්තු මැතිවරණයේදී බද්දේගම ආසනයට තරග කළ අවස්ථාවේදී මා ඔහු සමඟ එක පෙරමුණක සිටියා. ඒ මැතිවරණයේදී මා කංගල්ල ආසනයට තරග කළා. ඒ නිසා ඒ වකවානුව තුළ අප අතර අන්‍යෝන්‍ය වශයෙන් සහෝදර සම්බන්ධකම් වඩාත්ම වර්ධනය වුණා; දියුණු වුණා. එතුමා ශිෂ්‍ය අවධියේ සිටම වමේ දේශපාලනයට සම්බන්ධ වෙලා සිටියා. විවිධ අවස්ථාවල, විවිධ පක්ෂවල ක්‍රියාකාරියෙක් වුණත් මූලික වශයෙන් ඔහු තුළ තිබුණු දේශපාලන ස්ථාවරය අවසන් ගමන් යන තෙක්ම නොවෙනස්ව තිබුණා. අපි පක්ෂ දෙකක සාමාජිකයන් වුණත් දේශපාලන ක්ෂේත්‍රයේ අර්බුද මතු වුණු හැම අවස්ථාවකම එකට එකතු වෙලා කතා කරන ස්වභාවයක් අප අතර තිබුණා. ඒ වාගේම ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ ඇති වන වර්ධනයන් පිළිබඳව, ප්‍රවණතාවන් පිළිබඳව ඉතාමත්ම තියුණු ලෙස, තීක්ෂණ ලෙස ගැඹුරින් අධ්‍යයනය කරමින් ජාතික දේශපාලනයට ඒවා අදාළ කර ගත් ආකාරය අප දුටුවා. විශේෂයෙන්ම එතුමා සමාජවාදී රටවල් සමඟ සමීප සම්බන්ධකම් පැවැත්වූවා. කියුබානු මිත්‍ර සංගමයේ සභාපතිවරයා වශයෙන් වසර ගණනාවක් කටයුතු කළා. ඔහු ඒ තුළින් තමන්ගේ අදහස් වඩවඩාත් පෝෂණය කර ගත්තා. විශ්වවිද්‍යාලයේ සිටි අවදියේදී කොමියුනිස්ට්වාදියෙක් විධියට තමයි එතුමා දේශපාලනයට ප්‍රවිෂ්ට වුණේ. ඒ අවස්ථාවේ පටන් අවසන් ගමන් යන තෙක්ම තමන්ගේ අදහස් කාලීනව පෝෂණය කරමින් ලෝකයේ ඇති වන වෙනස්කම් හරියට අධ්‍යයනය කරමින්, විවිධ උපාය මාර්ග, විවිධ උපක්‍රම පිළිබඳව ඒ ඒ රටවලට ගැළපෙන ආකාරයට ඒවා වෙනස් වන ආකාරය පිළිබඳව අධ්‍යයනය කරමින් ඔහු තමන්ගේ දේශපාලන ජීවිතය සකස් කර ගත් ආකාරය අප දුටුවා. මට මතක් වෙනවා, 1993 දී ඔහු පළාත් සභාවට තරග කළ අවස්ථාව. තම පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉවත් වෙලා තමයි පළාත් සභාවට තරග කළේ. එතැනදී එතුමා ලොකු පරිත්‍යාගයක් කළා. දහහත් අවුරුද්දක පාලනය වෙනස් කර ලීමට පළමු වන වෙඩි මුරය පත්තු කළ ඒ දකුණු පළාත් සභා මැතිවරණය අවස්ථාව මට මතකයි. එතුමා මහ ඇමති තනතුරට තරග කරන්නට ඉදිරිපත් කරපු වෙලාවේදී ගාල්ලේ මහා දැවැන්ත රැළියක් පැවැත්වූවා. අපේ ජනාධිපතිතුමාත් එහි ප්‍රධාන කථිකයෙක් වශයෙන් සිටියා. මටත් භාග්‍යය ලැබුණා, එදා ඒ රැළියේදී කතා කරන්න.

එම පළාත් සභා මැතිවරණයෙන් අප විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගත්තා. එපමණක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂ රජය පරාජය කරන්නට බැහැයි කියන මතයක් රට තුළ මුල් බැස ගෙන තිබුණු අවස්ථාවක ලබා ගත් එම ජයග්‍රහණයෙන් තමයි ඒ මතය නැති කරන්න අපට පුළුවන් වුණේ. එයට නායකත්වය දෙන්නට තමන්ගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයත් පැත්තකට දමලා ඇවිල්ලා කටයුතු කළා. ඒ ලබා ගත් ප්‍රසාදය නිසාම තමයි, ඊළඟ අවස්ථාවේ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරග කොට විශිෂ්ටම ජයග්‍රහණයක් ලබා ගන්නට ඔහුට පුළුවන් වුණේ කියලා මා හිතනවා.

ශිෂ්‍ය ජීවිතයේ ඉඳලාම එතුමා ඉතාම නිහතමානියි. බොහොම සරල ජීවිතයක් ගත කළේ. ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු වුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයේ ඉහළම තලයේ ඇමතිවරයකු බවට පත් වුණත් එතුමා මුල් අවස්ථාවේ විධියටම ඉතාම නිහතමානී, සරල ජීවිතයක් ගත කළා. තමන් නිවැරැදි යයි අවබෝධ කරගත් එම දර්ශනය, න්‍යායික පැත්තේ ඉඳලා ප්‍රායෝගිකත්වයට ගෙන ඒමේදීත් එතුමා බොහොම දක්ෂ විධියට ඒවා සංකලනය කර ගනිමින් තමන්ගේ වැඩ කටයුතු කරගෙන ගියා. එතුමා පවතින යථාර්ථය තේරුම් ගෙන කටයුතු කළ ඇමතිවරයෙක්. ඒ නිසා ඔහු කිසි ලෙසකින් මනෝ මූලව තමන්ගේ ප්‍රශ්නවලට යට වන්නට ඉඩ දුන්නේ නැහැ. හැම වෙලාවකම ප්‍රශ්නයක් පිළිබඳව වාස්තවික කරුණු තේරුම් අරගෙන, ඒ අනුව කටයුතු කිරීමට එතුමා පෙලඹුණා. යම් අර්බුදයක් ඇති වූ අවස්ථාවකදී එතුමා තිගැස්සුණේ නැහැ. පක්ෂය තුළ අභ්‍යන්තර අර්බුද පැන නැඟුණු අවස්ථාවලදීත්, විශේෂයෙන්ම පක්ෂයෙන් පිටත සිටින අප සමඟත් ඒ සම්බන්ධව නිරන්තරයෙන්ම කථා කරමින්, ඒ සඳහා යම් උපක්‍රම පාවිච්චි කිරීම පිළිබඳව අදහස්, උපදෙස් ලබා ගැනීමේ පුරුද්දක් එතුමාට තිබුණා. එතුමාගේ ශිෂ්‍ය ජීවිතයේ සිට වසර 40ක කාලයක් තිස්සේ ඉතා සමීපව මා එතුමා ඇසුරු කළා. දොඩන්ගොඩ මැතිතුමාගේ අවසාන කාලයේ එතුමා සිටියේ අධිකරණ ඇමතිවරයා විධියට රෝගාතුරවයි. මා හිතන විධියට එතුමා රෝගාතුර වුණේත්, එතුමාගේ සෞඛ්‍ය පිළිබඳව එතුමා සැලකිල්ලක් නොදක්වපු නිසයි. එතුමා පැය 24ම වැඩ කළා. ඒ නිසාම එතුමා රෝගාතුර තත්ත්වයට පත් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දිගින් දිගටම කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මේ අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් අපේ ආචාරය, ගෞරවය එතුමාට පිරිනමන අතර, අපේ සාතිශය ශෝකය එතුමාගේ පවුලේ අයට දන්වා යවන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි. මීළඟට ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මන්ත්‍රීතුමා.

[පූ.ප. 11.11]

**ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මහතා**
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! நீதி, சட்ட மறுசீரமைப்பு அமைச்சராக இருந்து கடந்த மே மாதம் 30ஆம் திகதி அமரராகிவிட்ட கௌரவ அமரசிறி தொடங்கொட அவர்களுடைய மறைவையொட்டிய இந்த அனுதாபப் பிரேரணையிலே ஒருசில வார்த்தைகளைப் பகிர்ந்துகொள்வதற்கு எனக்குச் சந்தர்ப்பமளித்தமைக்கு எனது நன்றியைக் கூறிக்கொள்கின்றேன். எங்களுடைய மூத்த பாராளுமன்ற உறுப்பினர்களால் இன்றைய அமர்வுக்குச் சமுகமளிக்க முடியாதிருந்தாலும், இந்த அனுதாபப் பிரேரணைவேளையில் இந்த நிகழ்வில் கலந்துகொண்டு, சில வார்த்தைகளைக் கூறவேண்டிய பொறுப்பும் கடமைப்பாடும் எங்களுக்கு இருக்கின்றது.

அவரைப்பற்றி விபரமாக அறியக்கூடிய பல சந்தர்ப்பங்கள் எங்களுக்குக் கிடைத்திருந்தாலும், நாங்கள் பாராளுமன்றத்துக்கு வந்ததன்பிறகுதான் அவரோடு ஓரளவு நெருங்கிப் பழகினோம். அதற்கும் மேலதிகமாக, இந்தச் சபையிலே அவரோடு மிக நெருங்கிப் பழகிய அமைச்சர்களும் உறுப்பினர்களும் ஆற்றிய உரையிலிருந்து அவரைப்பற்றிய பல விடயங்களை நாங்கள் அறிந்துகொண்டோம். 1942ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் 18ஆம் திகதி பிறந்த இவர், 2009ஆம் ஆண்டு மே மாதம் 30ஆம் திகதி 67ஆவது வயதில் தன்னுடைய வாழ்க்கை வட்டத்தை முடித்துக்கொண்டார். இருந்தாலும்கூட, அந்தக் கால எல்லையில் அவர் ஆற்றிய சேவை அளப்பரியது. மனிதன் பிறந்து எத்தனை ஆண்டுகள் வாழ்ந்தான் என்பது முக்கியமல்ல! தான் பிறந்து வளர்ந்த அந்தக் கால எல்லைக்குள் அவன் என்ன சாதித்தான்? எதை இந்த உலகத்துக்கு விட்டுச் சென்றான்? என்பதுதான் முக்கியம். அந்த வகையிலே, மறைந்த அமைச்சர் அவர்கள் தன்னுடைய குறுகியகால வாழ்க்கை வட்டத்தில் தான் சார்ந்த மக்களுக்காகவும் இந்த நாட்டுக்காகவும் நிறையவே சாதித்திருக்கிறார் என்பதிலே மாறுபட்ட கருத்துக்களுக்கு இடமில்லை.

இவர் ஆரம்பத்தில் ஆசிரியப் பணியாற்றியது மட்டுமல்ல, பின்னர் சட்டத்தரணியாக, மாகாண சபை உறுப்பினராக, பாராளுமன்ற உறுப்பினராக, அமைச்சராக எனப் பல்வேறு பதவிகளையும் வகித்து மகத்தான சேவை செய்திருக்கிறார். பலர் ஜனாதிபதி அவர்களை நாடிச் சென்று அமைச்சுப் பொறுப்புக்களைப் பெறுகின்ற காலகட்டத்திலே, ஜனாதிபதி அவர்கள் தாமாகவே இவரை நாடிப் பொறுப்புள்ள அமைச்சுப் பதவியை வழங்கினாரென்றால், அந்தச் சேவகனுடைய கனதி எப்படியானதென்பது எங்களுக்குத் தெளிவாக விளங்குகின்றது. பொதுத் தேர்தல்களிலே இவர் பெற்ற வாக்குகளும் அவருடைய இறுதி மரியாதையிலே கலந்துகொண்ட மக்கள் தொகையும் மக்கள் மத்தியில் இவர் எவ்வளவுதூரம் அன்பையும் நன்மதிப்பையும் பெற்றிருந்தார் என்பதை இந்த நாட்டுக்குப் புடம்போட்டுக் காட்டியிருக்கின்றன.

அமரர் அமரசிறி தொடங்கொட அவர்களைப் பொறுத்தளவிலே, அவர் மிகவும் அடக்க ஒடுக்கமாக, அமைதியாக இருந்து அதேவேளையிலே தன்னிடத்தில் ஒப்படைக்கப்பட்ட பொறுப்பை மிகவும் காத்திரமாகச் செய்து வந்தவரென்பது அப்பட்டமான ஓர் உண்மையாகும். அவர் பாராளுமன்ற அமர்வுகளுக்கு வரும்பொழுது ஓடிச்சென்று அவரை அணுகி அவருடைய சுகத்தை விசாரிப்பது என்னுடைய ஒரு பழக்கமாக இருந்தது. அவரோடு ஒருசில விநாடிகள் உரையாடினாலும்கூட அவருடைய உள்ளத்து அன்பையும் மனித நேயத்தையும் எங்களால் புரிந்துகொள்ளக்கூடியதாக இருந்தது. இப்படிப்பட்ட ஒரு நற்பிரசையை, ஒரு சேவையாளனை இந்தப் பாராளுமன்றமும் இந்த நாட்டு மக்களும் குறிப்பாக தென் மாகாண மக்களும் இழந்திருக்கின்றார்கள். அவரது மறைவு அனைவருக்கும் பெரும் கவலையைத் தருகின்ற ஒரு விடயமாக இருக்கின்றது. அவரைப் பிரிந்து துயருறுகின்ற அவருடைய குடும்பத்தவருக்கும் மற்றும் தென் மாகாண, காலி மாவட்ட மக்கள் உட்பட இந்நாட்டு மக்கள் அனைவருக்கும் எங்களுடைய தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பிலே ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக்கொள்கிறேன். அத்துடன், அவருடைய குடும்பத்தாருக்கும் உறவினருக்கும் நல்ல தெம்பையும் சுகத்தையும் பலத்தையும் கொடுக்கவும் அவருடைய ஆன்மா சாந்தியடையவும் இறைவனைப் பிரார்த்திப்பதோடு, எங்களுடைய இந்த அனுதாபச் செய்திகளை அன்னாருடைய குடும்பத்தாருக்குத் தெரியப்படுத்த வேண்டும் என்றும் உங்களிடம் வேண்டி, விடைபெறுகின்றேன். நன்றி.

[පූ. භා. 11.17]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හිතවත් අමරසිරි දොඩන්ගොඩ අමාත්‍යතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද කරුණු අප ඒ ආකාරයෙන්ම ඒ විධියටම ස්ථිර කරන්නට කැමැතියි. එක්සත් ජාතික පක්ෂය හැටියට අපි මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා, මා ආශ්‍රය කරපු කාල සීමාව තුළ, ඉතාමත්ම නිහතමානී ඇමතිවරයෙක් හැටියට එතුමා වැඩ කටයුතු කළ බව. මම හිතන්නේ ඒක ඇමතිවරු හැටියට අපි හැම දෙනාටම ආඩම්බරයක්. ඒ නිහතමානීත්වය තුළ එතුමා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් දේශපාලන භේදයෙන් තොරව ඉෂ්ට කළා. මෙය එතුමාගේ ගුණ සිහිපත් කරන වෙලාවේ අපි මතක් කළ යුතු විශේෂතම කාරණයක්. අප දන්නවා, විශේෂයෙන්ම එතුමා සමාජවාදී වැඩ පිළිවෙළක නායකයෙක්. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී මූලිකත්වය ගෙන වැඩ කරපු නායකයෙක්. එතුමාගේ වැඩ පිළිවෙළේදී දේශීය නිෂ්පාදනය රජයන්ට සහ මේ රටට හඳුන්වලා දෙන්න එතුමා බොහෝ දුරට වැඩ කටයුතු කළා. දේශීයත්වය පිළිබඳව එතුමා තුළ තිබුණු හැඟීම් මම හිතන්නේ අද මේ රජයත් පිළිගෙන තිබෙනවා. ඒක තමයි එතුමාට කරන ගෞරවය.

එතුමා බාර ගත් මේ අධිකරණ අමාත්‍යාංශය බොහෝ ප්‍රශ්න තිබුණු අමාත්‍යාංශයක්. ඒ අමාත්‍යාංශය කාගේවත් දෝෂාරෝපණයකට ලක් නොවී ඉතාමත්ම නිහතමානී, ක්‍රියාශීලී ඇමතිවරයෙක් හැටියට පාලනය කරපු ආකාරය අපට මතකයි. මට මතකයි එතුමා සමාදාන විනිශ්චයකාරකම් ලබා දෙන වෙලාවේ අපි හැම කෙනකුටම අවස්ථාවක් දුන්නා, ඒ සඳහා නම් යෝජනා කරන්න. ඒ අනුව එතුමා ඉතාමත්ම නිහතමානීව, ඒ වාගේම පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කරමින් පක්ෂග්‍රාහී නොවී කටයුතු කරපු හැටි අපට මතක් වෙනවා. එතුමා සමඟ කතා කරන කොට අපි දැක්කා, -පාර්ලිමේන්තුවේ කරපු කථාවලදීත් අපි දැක්කා.- වාමාංශික ව්‍යාපාරයත්, ඒ ඉදිරි වැඩ පිළිවෙළත් ගැන එතුමා නිතරම කථා කළා. මෑත කාලයේදී එතුමා වෙනත් දේශපාලන දර්ශනයකට -පොදු පෙරමුණේ දේශපාලන දර්ශනයට; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන දර්ශනයට- නැඹුරු වෙලා එතුමා එතුමාගේ ප්‍රතිපත්තිවල වෙනසක් නොකර ඒ කටයුතු ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කළා. ඒක තමයි ඉතාම වැදගත් කාර්යය වන්නේ. තමන්ගේ මූලික ප්‍රතිපත්තිවල වෙනසක් නොකර මේ රට වෙනුවෙන් එකට එක්කහු වෙලා අපට වැඩ කරන්න පුළුවන්ය කියන ඒ ආදර්ශ පාඨය එතුමා ක්‍රියාවෙන් ඔප්පු කළා. ඒ නිසා මම හිතනවා, අද අපි දීර්ඝ වශයෙන් කථා කළ යුතු නැහැයි කියලා. ගරු සභානායකතුමා ඉදිරිපත් කරපු මේ ශෝක යෝජනාව -එතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කිරීම- එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අපත් අනුමත කරන අතර එතුමාගේ පවුලේ සාමාජිකයන්ට අපගේ ශෝකය දන්වා යවන්නය කියා ඉල්ලීමක් කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

[පූ. භා. 11.21]

**ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண - விஞ்ஞான, தொழில்நுட்பவியல் அமைச்சர்)
(The Hon. (Prof.) Tissa Vitharana - Minister of Science and Technology)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ වාමාංශික ව්‍යාපාරයට ප්‍රගතිශීලී ව්‍යාපාරයට දකුණු පළාතෙන් නායකත්වය දුන් අමරසිරි දොඩන්ගොඩ ඇමතිතුමාගේ අභාවය සම්බන්ධව ශෝකය පළ කරන්නේ අපේ හදවතේ වේදනාවක් ඇතුවයි. මුලින්ම මම පෞද්ගලිකවත්, ලංකා සමසමාජ පක්ෂය වෙනුවෙනුත් එතුමාගේ අභාවය ගැන අපේ බලවත් ශෝකය පළ කරමින් එතුමාගේ සියලු ඥාතීන්ට අපේ බලවත් කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

අවසන් කාලයේදී දොඩන්ගොඩ ඇමතිතුමාගේ සෞඛ්‍ය තත්ත්වය අයහපත් ආකාරයට හැරිලා තිබුණ නිසා එතුමා කැබිනට් මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණෙන හැම අවස්ථාවකදීම මාගේ පුරුද්දක් හැටියට එතුමා සමඟ කථා කරලා, -මම වෛද්‍යවරයෙක් නිසා- ඒ ගැන විමසලා තමයි කැබිනට් මණ්ඩල සාකච්ඡාවලට පිවිසුණේ. නමුත් ඒ අවස්ථාවේදී පවා එතුමාම යම් දේශපාලන ප්‍රශ්න මතු කළා; පළාතේ අවශ්‍යතාවන් ගැන කථා කළා. එතුමා බද්දේගම, විද්‍යා මධ්‍යස්ථානයක් පිහිටු වීම ගැන මගෙන් ඉල්ලීමක් කරලා අපි පුළුවන් ඉක්මනට ඒක ක්‍රියාත්මක කළා. ගමට තාක්ෂණය ලබා දීමෙන් පසුව ව්‍යවසායකයන් බිහි වීම කොයි තරම් දුරට කෙරී ගෙන යනවාද, කෙරෙන්නේ නැද්ද යන ප්‍රශ්න ගැන නිතරම මගෙන් විමසමින් එහි ප්‍රගතිය සොයා බැලුවා. ඒ වාගේම අපේ සමසමාජ පක්ෂයේ ඒ පළාතේ සංවිධායක හැටියට කටයුතු කරන බද්දේගම සමිත හිමි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ගැනත් නිතරම අදහස් ඉදිරිපත් කරමින් උන්වහන්සේ සමඟ සම්බන්ධ වෙලා දේශපාලනය කරන්නයි කියලා එතුමා උපදෙස් දුන්නා. ඒ අනුව අපි කටයුතු කළා. ඒ එක්කම ගමේ ජනතාවගේ අවශ්‍යතා, දුප්පත් ජනතාවගේ අවශ්‍යතා එතුමා නිතරම ඉදිරිපත් කළා. මට මතකයි, යම් අවස්ථාවක මම ඇහැව්වා, උසාවියට ගියාම දුප්පත් ජනතාව කොයි තරම් වියදම් දරනවාද, නඩු දිග් ගැහෙනවාද, අපහසු තත්ත්වවලට මුහුණ දෙනවා නේද කියලා. එතුමා කිව්වා, "ඔව්, ඒ ගැන යමක් කරන්න මම කටයුතු කරනවා. විවිධ පියවර ගන්නවා" කියලා ඒ වුවමනාවෙන් එය සඳහන් කළා.

[ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා]

මේ අවස්ථාවේදී අපට සිහිපත් කරන්න තිබෙන්නේ එතුමා ආදර්ශවත් ඇමති කෙනෙක් විධියටයි. එතුමා නිහතමානීව, අවංකව ජනතාවගේ නියෝජිතයකු හැටියට සිටියා. ලෙඩ දුක් වෙලා හිටියත් ජනතාව මුණ ගැහිලා, ප්‍රශ්න ගැන කල්පනා කරලා ක්‍රියා කරන්න ඉදිරිපත් වුණ පුද්ගලයකු ගැනයි අපි කථා කරන්නේ. එතුමා ඒ දේශපාලනය මුළු ජීවිතයේම ඒ ආකාරයට ගෙන ගිය බව කලින් කරපු කථාවලින් හොඳටම පැහැදිලි වෙලා තිබෙනවා. මම ඒ ගැන විස්තර සහිතව කථා කරන්න යන්නේ නැහැ. නමුත් අපට මේ කාලයේ වුණත් සම්බන්ධ වෙලා සාකච්ඡා කරන්න තව හේතුවක් තිබුණා.

එතුමා අවුරුදු ගණනාවක සිට මැරෙන තුරුම ශ්‍රී ලංකා කියුබානු මිත්‍රත්ව සංගමයේ සභාපති හැටියට කටයුතු කළා. ඒ එක්කම පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා කියුබානු මිත්‍රත්ව සංගමයේ සභාපති හැටියට මාත් මේ කාලයේදී කටයුතු කරලා තිබෙනවා. කියුබාව ගැන, කියුබාවේ ඒ ජනතාවගේ සටන ගැන, සමාජවාදයේ ධජය අධිරාජ්‍යවාදී දොරකඩේම ලෙළ දෙවන, නොයෙකුත් බාධා ප්‍රශ්නවලට මුහුණ දෙන ඒ රටේ බාධක හරහාත් සංවර්ධනයක් ඇති කිරීම ගැන අපි කථා වුණා. කියුබාව සම්බන්ධව සම්පූර්ණයෙන්ම වැරදි මතයක් මාධ්‍ය හරහා අප රට තුළ පැතිර ගිහින් තිබුණා. ඒවා අපි නිවැරදි කළ යුතුයි. මොන ආකාරයටද එය කළ යුත්තේ කියන එක ගැන අපි අදහස් හුවමාරු කර ගත්තා. කියුබාව ආර්ථික අමාරුකම් හරහා ලබා ගත් ජයග්‍රහණ ගැන අපි කථා කළා. මා කියුබාවට ගිය අවස්ථාවක ඒ රටේ ඇති වී තිබුණු ප්‍රගතිය පිළිබඳව එතුමාට වාර්තා කළා මට මතකයි. මා විද්‍යා හා තාක්ෂණ ඇමතිවරයා හැටියට කියුබාවට ගිය අවස්ථාවේ දී ජීව තාක්ෂණය සම්බන්ධව කියුබාවේ ඇති වී තිබුණු ප්‍රගතිය ගැන මා පුදුමයට පත් වුණා. මුලින්ම සෝවියට් දේශයේ ආර්ථිකය කඩා වැටෙන කොට කියුබාවේ ආණ්ඩුවට සිදු වුණා, ආර්ථිකය නැවත ගොඩ නඟා ගන්නට මාවතක් සොයන්න. අධ්‍යාපනයට මුල් තැන දීලා කටයුතු කරන, නොමිලේ අධ්‍යාපනය ලබා දී උපාධිධාරින් බිහි කරන, විද්‍යාඥයන් බිහි කරන රටක් හැටියට එහි ප්‍රයෝජනය ලබා ගැනීමේ අරමුණින් ජීව තාක්ෂණය දියුණු කිරීම සඳහා ඩොලර් බිලියනයක් අමාරුවෙන් වුවත් වෙන් කර ගෙන ආයෝජනය කර තිබුණා. ඒ අනුව කියුබාව ජීව තාක්ෂණය සම්බන්ධයෙන් ලෝකයේ ප්‍රධාන රටක් හැටියට දැන් මතු වෙලා තිබෙනවා. අනිවාර්යයෙන්ම ලතින් ඇමෙරිකානු රටවල්වල නායකත්වය ගන්නට පුළුවන් රටක් බවට පත් වෙලා තිබෙනවා. ජීව තාක්ෂණය තුළින් කර්මාන්තකරණය ඇති කරලා තිබෙනවා. ඒ කර්මාන්තකරණය තුළින් පසු ගිය වර්ෂයේ ඩොලර් මිලියන 400ක ශුද්ධ ලාභයක් ලබා ගැනීමට ඒ රටට පුළුවන්කම ලැබිලා තිබුණා. ඒ ගැන මා අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාට වාර්තා කළා. එතුමා ඒ ගැන ඉතාම සතුට පළ කරලා, "අපි කවුරුත් සන්තෝෂ වන්නට ඕනෑ. අපටත් ලංකාවේ කරන්න තිබෙන්නේ මේකයි" කියලා මට සඳහන් කළා. ඉතින් ඒ ආකාරයට සමාජවාදී දර්ශනයක් ඇතිව කටයුතු කරන රටක් ගැන අපේ පොදු හැඟීමක් තිබීම නිසා අපේ රටවල් දෙක අතර මිත්‍රත්වය ශක්තිමත් වුණා පමණක් නොවෙයි එය අප දෙපළටම ආදර්ශයක් වුණා. එතුමා දිගටම අප රටේ ඉතිහාසයේ ප්‍රගතිශීලී දේශපාලනයේ යෙදුණු පුද්ගලයෙක්. ඒ වාගේම සමසමාජ, කොමියුනිස්ට් සහ අනෙකුත් වමේ පක්ෂ එක්කත් මිත්‍ර සම්බන්ධයක් ඇතිව නිතරම කටයුතු කරපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන පෙළේ දේශපාලනඥයකු හැටියට මා එතුමාට ගරු කරනවා.

ඒ දර්ශනය පදනම් කර ගෙන එතුමා 1983 වර්ෂයේ සිට බද්දේගම ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ කටයුතු කළාට, 1993 වර්ෂයේ දී කැමැත්තෙන්ම පළාත් සභාවේ ප්‍රධාන ඇමති හැටියට ඒ වගකීම භාර ගන්නට ඉදිරිපත් වුණා. අද රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය දිහා බැලුවාම ඒක ඉතාම වැදගත් පියවරක් කියලා පිළිගන්නට ඕනෑ. එතුමා ගත් ඒ පියවර පදනම් කර ගෙන තමයි කලින් අප රට දකුණට ගමන් කරලා තිබුණු එක ආපසු වෙනත් අතකට හරවන්නට එතුමාට පුළුවන් වුණේ. ඒ තුළින් අපේ රට තුළ ප්‍රගතිශීලී බලවේග මතු වන්නට දොඩන්ගොඩ ඇමතිතුමා රුකුලක් දුන්නාය කියන එක අපි කවුරුත් පිළිගත යුතුයි. ඒ වාගේම එතුමා දේශීය වෛද්‍ය අමාත්‍ය ධුරය දරද්දී දේශීය වෛද්‍ය අංශය දියුණු කිරීමට වැදගත් සේවයක් කළා. ඒ වෛද්‍යවරුන්ගේ වැටුප් විෂමතාවලට විසඳුම් ලබා දීමට එතුමා කටයුතු කළා. ඒ වාගේම සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කරන්නත් එතුමා කටයුතු කළා. වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍ය ධුරය දරන විට ඒ අංශය දියුණු කිරීමටත් එතුමා කටයුතු කළා. තාක්ෂණ විශ්වවිද්‍යාලයක් ඇති කිරීමටත් ඒ කාලයේදී එතුමා පදනම දැමුවා.

මේ ආකාරයට අප රටට වැදගත් සේවයක් කළ, ඒ වාගේම බද්දේගම ඇතුළු දකුණු පළාතේ ජනතාවට විශාල සේවයක් කළ නායකයෙක් හැටියට එතුමාට අපි ගරු කරනවා. මේ අවස්ථාවේදී අපි එතුමා සිහිපත් කරන ගමන් සම සමාජ පක්ෂයේ බලවත් ශෝකය එතුමාගේ පවුලේ ඥාතීන් සියලු දෙනාට පිරිනමන ලෙස මම නැවත වරක් ඉල්ලීමක් කරමින්, එතුමාගේ සංසාර ගමන සැපවත් එකක් වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

[පූ. භා. 11.34]

**ගරු ටී. බී. ඒකනායක මහතා (මහාමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - நெடுஞ்சாலைகள் அமைச்சர்)
(The Hon. T. B. Ekanayake - Minister of Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1942 දී දක්ෂිණ ලංකාවේ බද්දේගම මැතිවරණ කොට්ඨාසයේ උපන් අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා වමේ දේශපාලනයේ පන්නරයේ ශක්තියත් එක්ක රටට විශාල සේවයක් කළා. එතුමා විශේෂයෙන් ගමේ පාසලේත්, ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයේත් අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාල අධ්‍යාපනයත්, නීති විද්‍යාලයේ අධ්‍යාපනයත් ලබා පිරිවෙන් අධ්‍යාපනය තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රයට මහඟු සේවාවක් කළා. ඒ කාලය තුළ විශේෂයෙන්ම වමේ හැඟීම නිසාම එතුමා "ජන වේගය" සංවිධානය එක්ක සාකච්ඡා පවත්වන්න, "ගිනි පුපුර" නමැති සංවිධානය ක්‍රියාත්මක කරන්න කටයුතු කළා. එතුමා රැඩිකල්වාදී දේශපාලන ප්‍රවේශයක් සඳහා දකුණේ විතරක් නොවෙයි, වෙනත් ප්‍රදේශවලටත් ගිහිල්ලා සාකච්ඡා කරන්නට යෙදුණා. ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙක් නොවුණත් එතුමා දැරූ යම් යම් වමේ අදහස් නිසා, ඒ වාගේම මාක්ස්වාදී අදහස් නිසා, ඒ වාගේම ඒ පිළිබඳව වූ විවාද හා සාකච්ඡා නිසා 1971 අප්‍රේල් කැරැල්ලේදී අත් අඩංගුවට පත් වුණා.

දේශපාලන න්‍යායාත්මක අරගලයක යෙදෙන්නට උපතින්ම ලැබූ ශක්තියක් තිබුණු දේශපාලනඥයෙක් තමයි ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා. එතුමා මේ සියලු ප්‍රවාහයන් එක්ක ඉඳලා 1977 මහ මැතිවරණයේදී එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් බෙදිලා ආව වයඹ පළාතේ සුබසිංහ මැතිතුමා, රත්නපුරේ නන්ද එල්ලාවල මැතිතුමා, කැකිරාවේ ජිනදාස මැතිතුමා ඇතුළු කණ්ඩායමත් එක්ක එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී පක්ෂයෙන් තරග කළා. එසේ තරග කළත් එතුමාට ජයග්‍රහණය කරන්න බැරි වුණා. ලංකාවේ පළමු වන ජනමත විචාරණයේදී, එනම් කළගෙඩි-ලාම්පු සෙල්ලමේදී එක්සත් ජාතික පක්ෂයේ පරාජය වුණු ආසනවලට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා අතුරු මැතිවරණ පවත්වන්න තීන්දු කළා. ඒ යටතේ ආණ්ඩුවේ සියලු බලය යොදා පැවැත් වූ බද්දේගම අතුරු මැතිවරණයේදී මෙතුමාට ජයග්‍රහණය ලබා පාර්ලිමේන්තුවට එන්න අවකාශය ලැබුණා. ඒ අවකාශයේදී පාර්ලිමේන්තුවට පැමිණි ගරු මන්ත්‍රීවරුන් අට දෙනාට අයත් වුණු එතුමාට ඒ පැවති දැවැන්ත රජයත් එක්ක විවාදාත්මකව, තර්කානුකූලව පාර්ලිමේන්තු සම්ප්‍රදායන් ගරු කරමින් වැඩ කරන්නට ශක්තිය තිබුණා. අනතුරුව 1994 මැතිවරණයේදීත් බද්දේගම මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරමින් අතිවිශිෂ්ට ඡන්ද ප්‍රමාණයක් ලබා ගෙන ගාල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට ප්‍රවේශ වීමට එතුමාට හැකියාව ලැබුණා. ඒ කාලය තුළ පාර්ලිමේන්තුවේ **හැන්සාඩ්** වාර්තා කියවා බැලුවාම අපට දැක ගන්නට පුළුවන්, එතුමාගේ හැම කතාවකම අලුත් තර්ක, අලුත් අදහස්, සංඛ්‍යා ලේඛන, න්‍යායාත්මක ප්‍රවේශයන් අන්තර්ගත වෙලා තිබෙන ආකාරය. ඒ නිසා දකුණේ විතරක්

නොව, රට පුරාම ජනතාව තුළ එතුමා ඉතාමත් දක්ෂ, නිහතමානී, ඒ වාගේම කාර්යක්ෂම, අවංක දේශපාලනඥයකුය කියන හැඟීමක් ගොඩ නැඟී තිබුණා. පසුව එළැඹුණු දකුණු පළාත් සභා මැතිවරණයේදී පක්ෂයේ ඉල්ලීම මත එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස් වී පළමු වන වතාවට පළාත් සභා මහ ඇමති ධුරයට තරග කරමින් ඉතාමත් දක්ෂ විධියට මැතිවරණ ව්‍යාපාරයේ යෙදුණා. දකුණු පළාත ශක්තිමත් කරන්නේ කෙසේද, දකුණු පළාතේ දියුණුවට කළ යුතු වැඩ පිළිවෙළ කෙසේද, බෙන්තර පාලමෙන් එහාට කොකා කෝලා බෝතලයක්, ස්ප්‍රයිට් බෝතලයක්, එහෙම නැත්නම් පෙප්සි කෝලා බෝතලයක් ගෙන යන්නේ නැතිව දකුණේ දොඩම්වලින්, දකුණේ පළතුරුවලින් බීම වර්ග නිෂ්පාදනය කර දකුණේ ජනතාවට ලබා දෙන්නේ කෙසේද, දේශීයත්වය මත ජාතික ව්‍යාපාර ගොඩ නඟන්නේ කෙසේද යනුවෙන් ඉතා ව්‍යක්ත කතා ඒ මැතිවරණයේදී සනිටුහන් වුණා. ඒ නිසා එතුමා ඡන්ද එක්ලක්ෂ තිස්දහසක් ලබා ගෙන ඒ දකුණු පළාත් සභා මැතිවරණයේදී ජයග්‍රහණය කළා. අවුරුදු 17ක් පුරා පැවති එක්සත් ජාතික පක්ෂ රජය තුළ, පළමු වන ජයග්‍රහණය විධියට එම ජයග්‍රහණය එතුමා ලබා ගත්තත් ඒ වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේ තිබුණු වැඩ පිළිවෙළක් අනුව, ඒ ජන මතය ලබා ගත්ත ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාට ආණ්ඩුකාරවරයා ඉදිරියේ දිවුරුම් දෙන්න අවකාශය ලැබුණේ නැහැ. ඒ අවකාශය ලැබුණේ නැති වුණාම දින ගණනාවක් ගාල්ල ප්‍රදේශයේ ප්‍රගතිශීලී ජනතාව ආණ්ඩුකාර කාර්යාලයට ගියා. නමුත් ආණ්ඩුකාර කාර්යාලයේ දොරවල් වහලා තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දොඩන්ගොඩ මැතිතුමා මිය ගිය දවසේ අතිගරු ජනාධිපතිතුමා මට කතා කරලා මේ සිද්ධිය ගැන කිව්වා. ඒ අවසාන දවසේ ආණ්ඩුකාර කාර්යාලය ඉදිරිපිට ජනතාව පිරිලා ඉන්න වෙලාවේ, වර්තමාන ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා නීතිඥවරයෙක් විධියට ඇඹිලිපිටිය උසාවියට යන්න ලෑස්ති වෙලා සිටි බව කිව්වා. ඒ අවස්ථාවේදී, ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා එතුමාට දුරකතනයෙන් කතා කරලා - බල කිරීමකින් තොරව - අද එන්නේ නැද්ද කියලා එතුමාගෙන් අසා තිබෙනවා. ඒ වාගේම, දිවංගත චණ්ඩි මල්ලීත් - අප කියන්නේ චණ්ඩි මල්ලී කියලා - කතා කරලා කියා තිබෙනවා, "අද මෙහෙම සිද්ධියක් තිබෙනවා, ඔබතුමා ආවොත් තමයි මේක විසඳෙන්නේ" කියලා. පසුව එතුමා ඒ නඩුව වෙනත් කෙනකුට භාර දීලා වහාම ගාල්ලට ආවායින් පස්සේ මේකේ අයුක්තිය දැකලා තුවක්කු එල්ල කර ගෙන හිටපු පොලිස් නිලධාරීන් එතුමා ඇතුළු කණ්ඩායම යන කොට ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයක් විධියට තුවක්කු පහත් කර ගත්තාය කියලා අතිගරු ජනාධිපතිතුමාම මං එක්ක කිව්වා. ඒ අවස්ථාවේදී ආණ්ඩුකාරවරයා ඔහුගේ වත්තේ නිවාසයේයි ඉඳලා තිබෙන්නේ. ඔහුත් එක්ක ගෙන ඇවිල්ලා, ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දොර තල්ලු කරලා ඇතුළට ගිහිල්ලා ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාට දිවුරුම් දෙන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. එතුමා දිවුරුම් දෙන්න පැමිණ තිබෙන්නේ ආදරණීය මෑණියන් එක්කයි. ඒ ගැන අප සන්තෝෂ වනවා. ඒ කටයුත්තේ ඉතාමත් ශක්තිමත් ස්වභාවය ඒකයි.

දේශීය වෛද්‍ය ඇමතිවරයා විධියට දේශීය වෛද්‍ය විද්‍යාව වාගේම විවිධ කාර්යයන් ශක්තිමත් කරන්න දොඩන්ගොඩ මැතිතුමාට අවකාශය ලැබුණා වාගේම, වෘත්තීය පුහුණු හා කාර්මික අධ්‍යාපනය ශක්තිමත් කරන්න, අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ඒ කටයුතු අලුත් ප්‍රවේශයකට ගෙනෙන්න, ඒ වාගේම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතුවලදී ඉතාමත් මැනවින් රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයක් ගොඩ නඟන්න, අලුත් සැලසුම් ක්‍රියාත්මක කරන්න එතුමාට අවකාශය ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම වර්තමාන අතිගරු ජනාධිපතිතුමාට "හෙල්පින් හම්බන්තොට" කියලා අපහාස කරද්දී, කැබිනට් එකේ හිටපු ඇමතිවරයකු විධියට ඒකට විරුද්ධව, ඍජුව, කොන්දක් තියා ගෙන ගිහිල්ලා විශේෂයෙන් සීනිගම දේවාලයේ පොල් ගහන්න නායකත්වය දැරුවේ එතුමායි. එදා එතුමා කිව්ව කථාවක් මට මතක් වනවා. "මට ජනාධිපති වන්න බැහැ. හැබැයි දකුණෙන් නායකයෙක් බිහි වනවා. ඒ, මහින්ද රාජපක්ෂ. ඒ නිසා ඔහුට මේ වාගේ දෝෂාරෝපණ කරන අය හංග වේවා"යි කියලා එදා ඉස්සෙල්ලාම පොල් ගෙඩිය අර ගෙන ගැහුවේ එතුමායි. එතුමා ඒ වාගේ කොන්දක් තිබුණු, ඍජු බවක් තිබුණු, ශක්තියක් තිබුණු නායකයෙක්. ඒ වාගේම වයඹ පළාත් සභා මැතිවරණයේදී එතුමා යාපහුව මැතිවරණ කොට්ඨාසයේ රැඳිලා අපත් එක්ක දේශපාලනය කළා. යාපහුව ගල නැංගා; බැස්සා. අපත් එක්ක සරල විධියට ගමේ කොළ මැල්ලුමක් කාලා හිටපු නිහතමානී නායකයෙක් වන එතුමාගේ දේශපාලන බුද්ධිමත්භාවය, අවංකභාවය පිළිබඳව කියන්න කතන්දර රාශියක් තිබුණත්, ඊට කාලය නොමැති වීම පිළිබඳව කනගාටු වෙමින්, වයඹ පළාත වෙනුවෙනුත්, සත් කෝරළය දිශාව වෙනුවෙනුත් එතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව අත් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා.

[පූ. භා. 11.44]

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා (ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியகலாநிதி) ராஜித சேனாரத்ன - நிர்மாணத்துறை, பொறியியல் சேவைகள் அமைச்சர்)
(The Hon (Dr.) Rajitha Senaratne-Minister of Construction and Engineering Services)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අප ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා ගැන කථා කරනවාය කියන්නේ, 70 දශකයේ ඉඳලා මේ රටේ තිබුණු දේශපාලනය ගැන කථා කිරීමක්. කථාවක් තිබෙනවා, "විමුක්තිකාමියකුගේ මරණ පොළේ කථා කරන්නේ විමුක්තිකාමියාගේ වැඩ පිළිවෙළ ගැන නොවෙයි, ඒ යුගයේ විමුක්තිකාමියා ඉදිරිපත් වූ වැඩ පිළිවෙළ ගැනයි" කියා. 70 දශකයේ ආරම්භය මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයේ "කුමක්ද හරි" කියන එක පිළිබඳව මහා විශාල දෘෂ්ටි සංවාදයක් තිබුණු යුගයක්. සමාජවාදය ලෝකයේ පැතිරෙමින්, සමාජවාදය රටින් රට ජයග්‍රහණය කරලා, චීන මහා විප්ලවයත් සමඟ ලෝකයෙන් තුනෙන් දෙකක් සමාජවාදයට නතු වෙලා තිබුණු යුගයක තමයි අපත්, දොඩන්ගොඩලාත් දේශපාලනය ආරම්භ කළේ. අපේ රටේ මාක්ස්වාදී නායකයන්, වාමාංශික නායකයන් උගන්වපු ඒ මාක්ස්වාදී න්‍යාය ධර්ම අහලා, ඔවුන්ගේ ගෝල පරපුර විධියටයි, දෙ වැනි පරපුර විධියටයි අපි දේශපාලනයට ආවේ.

ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා දේශපාලන ක්ෂේත්‍රයේ මුලින්ම හිටපු ව්‍යාපාරය තමයි "ගිනි පුපුර" ව්‍යාපාරය. ඒ කාලයේ එහි නායකයා කල්‍යානන්ද තිරාණගම මහත්මයායි. මාක්ස්වාදය පිළිබඳව විශාල බුද්ධියක් තිබුණු කල්‍යානන්ද තිරාණගම මහතා එහි නායකත්වය දැරුවා. එදා 1971 කැරැල්ල වෙලාවේදී ඒ "ගිනි පුපුර" කණ්ඩායමේ ඔක්කෝම අත් අඩංගුවට ගත්තා, ඔවුනුත් ජනතා විමුක්ති පෙරමුණේ කොටස්කරුවන්ය කියලා. එදා සමසමාජ පක්ෂයයේ හිටපු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් ඒ ව්‍යාපාරයේ හිටියා. ඒ ව්‍යාපාරයේ හිටියා ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා. ඒ වාගේ කට්ටිය එදා "ගිනි පුපුර" ව්‍යාපාරයට නායකත්වය දුන්නා.

1971 දී ජනතා විමුක්ති පෙරමුණ ඇති කරපු කැරැල්ල කඩා ගෙන වැටුණාට පස්සේ "නැවත මෙතැනින් කොතැනටද සමාජවාදය?" කියන සංවාදය ඇති වුණා. 1972 සැප්තැම්බර් මාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සමිති සම්මේලනය මහනුවර බෞද්ධ මන්දිරයේදී කැඳෙව්වා. තවම මට ඒ ගැන මතකයි. ඒක දවස් දෙකක සම්මේලනයක්. ඒ සම්මේලනයට මමත් සහභාගි වුණා, විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගම් නායකයකු විධියට, එදා අන්තර් විශ්වවිද්‍යාල බල මණ්ඩලයේ ප්‍රධාන ලේකම්වරයා විධියට. එහිදී තමයි අප ඔක්කෝම එක තැනකදී හම්බ වුණේ. මොකද, ඒ වන කොට දේශපාලනය තහනම් කරලායි තිබුණේ. දේශපාලන රැස්වීම් නැහැ. මැතිනිය රැස්වීම්වලට

[ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා]

ගමන් කළේ ගුවන් යානයකින්. කැලැ ශුද්ධ කරලායි ඒ ගුවන් යානා - චොපර් - බැස්ස වුයේ. ඒ තරම් තත්ත්වයක් තිබුණු වෙලාවක තමයි ඒ සම්මේලනය පැවැත් වුණේ. එදා ඒ සම්මේලනයට පැමිණියා, කුමාර් රූපසිංහ, සුනේත්‍රා බණ්ඩාරනායක, චන්ද්‍රිකා බණ්ඩාරනායක කියන අය. ඔවුන් ඉතාම කුලුපගව අපත් එක්ක, ඒ තරුණ නායකයන් එක්ක කථා කළා. මට තවම මතකයි, ගරු මර්වින් සිල්වා මැතිතුමා තමයි එදා බෙලිඅත්ත ආසනයෙන් - මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ තරුණ සමිති නායකයා විධියට - තරුණ සම්මේලනය නියෝජනය කරලා ආවේ. එදා තමයි මා එතුමාත් එක්ක මිත්‍ර වුණේ. ඒ 1972 සැප්තැම්බර් මාසයේ. ඒක අවසන් වෙලා පළමු වන විවෘත දේශපාලන රැළිය බෝගම්බර තමයි තිබුණේ. ඒ 1971 කැරැල්ලෙන් පසුව. එදා කුමාර් රූපසිංහ මහත්මයා මගේ කථාව අහ ගෙන ඉඳලා මට ආරාධනා කරලා තිබුණා. කරුණාජීව මහත්මයා, - මහජන බැංකුවේ වර්තමාන සභාපතිවරයා - එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාලක ලේකම් මගෙන් ඇහුවා, කුමාර් රූපසිංහ මහත්මයා කථා කරන්න කැමැතියි, කථා කරනවාද කියා. අපි එහෙමයි එදා මිනිස්සු ගැන කල්පනා කරලා තීන්දු ගත්තේ. මම කිව්වා, කැමැතියි කියා. එතැනදී එතුමා කිව්වා, "මම ලංකාවට එන කොට තීන්දුවක් අරන් තිබුණා, දේශපාලනයෙන් අයින් වෙන්න. මොකද, රාජිත මම එංගලන්තයේ Workers Press කියන මාක්ස්වාදී කණ්ඩායමක් එක්ක දේශපාලනය කළේ. - එතුමාත්, සුනේත්‍රා රූපසිංහ, මහාචාර්ය සේනක බණ්ඩාරනායක වාගේ අය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ සෙවල දේශපාලන පක්ෂයක්. ඒක නිසා මේකේ මට කරන්න දේශපාලනයක් නැහැ කියා තමයි මා හිතා ගෙන ආවේ. නමුත් ඔයාගේ කථාව ඇහුවාට පස්සේ ඒකට ලැබුණ ප්‍රතිචාරය දැක්කාම මට හිතෙනවා, මේ පක්ෂයේ යම් ගමනක් අපිට යන්න පුළුවන්. අපි එකට වැඩ කරමු"යි කියලා.

මේක තමයි "ජන වේගය" කණ්ඩායමේ ආරම්භය. ලේබර් පක්ෂයේ ඒ වන කොට militant කණ්ඩායමක් තිබුණා, Ted Grant සහ Tony Benn කියන මහා වාමාංශික militant මන්ත්‍රීවරු දෙදෙනාගේ නායකත්වයෙන්; වයෝවෘද්ධ Tony Benn කියන මන්ත්‍රීවරයාගේ සහ Ted Grant කියන තරුණ මන්ත්‍රීවරයාගේ නායකත්වයෙන්. මේ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ අපි militant කණ්ඩායමක් හදමුය කියා මා යෝජනා කළා. ඒ අනුව කොළඹට කැඳෙව්වා. ඒකට දකුණෙන් සම්බන්ධ වුණ ප්‍රධානම පුද්ගලයා තමයි, අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා. එදා 1973 වන කොට අපි මේ රටේ විශාල ආන්දෝලනයකට ලක් වුණා, "බණ්ඩාරනායක මැතිනියගේ බැණාගේ නායකත්වයෙන් ජනවේගය කල්ලියක්, දූලා පුත්තු ඔක්කොම එතැන" කියලා. ඒ අනුව ජයන්ත වීරසේකර මාවතේ, ගුණරත්න ගොඩනැඟිල්ලේ හතර වන තට්ටුව අරගෙන කැස්ත්‍රෝගේ පින්තූර ගහ ගෙන අපි වැඩ පටන් අර ගත්තා. මේකේ හතර වන තට්ටුව නොනැග්ග වාමාංශික නායකයෙක් ඒ කාලයේ හිටියේ නැහැ.

1971 දී ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල ආවා. 1974, 1975 වන කොට නායකයෝ නිදහස් වුණා. සියලුම නායකයෝ අපිත් එක්ක එක්කාසු වුණා. 1971 කැරැල්ලට සම්බන්ධ වු ධර්මසිරි ජයකොඩි, කරුණාසේන ජයලත්, ජනතා විමුක්ති පෙරමුණේ "රතු කැකුළු" කියන තරුණ පුවත් පතේ කර්තෘවරයා විධියට හිටපු වර්තමාන ලේක් හවුස් සභාපති බන්දුල පද්මකුමාරගේ මල්ලි කුමුදු කුසුම්කුමාර මේ ඔක්කොම ඇවිත් අපි "ජන වේගය" සති පතා පුවත් පත ආරම්භ කළා. ඒ වන කොට මම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉඳ ගෙන මුළු කන්ද උඩ රටටම "ජන වේගය" පුවත් පත බෙදීම භාර ගත්තා. මේ විධියට විශාල කැප වීමකින් අපි මේ දේශපාලන ව්‍යාපාරය ගොඩ නැඟුවා. හැම සතියකම දවස් දෙකක් මම පේරාදෙණිය ඉඳලා එනවා. අමරසිරි දොඩන්ගොඩ සහෝදරයා බද්දේගම ඉඳලා එනවා. එක දවසක් අපි පත්තර නවනවා, අනෙක් දවස මධ්‍යම කාරක සභාව. මධ්‍යම කාරක සභාවෙන් තමයි සියලු දේශපාලන තීන්දු ගත්තේ. ඒ අනුව "ජන වේගය" පිළිබඳව නොයෙකුත් මන්ත්‍රීවරු කථා කළා. මේ සභාවේ හිටපු දි.මු. ජයරත්න මැතිතුමා අපිත් එක්ක බොහොම සම්බන්ධ වෙලා තමයි "ජන වේගය" කණ්ඩායමේ හිටියේ. මේකට තරුණ රැඩිකල් වාමාංශික මත දරපු උදවිය හිටියා. අපේ පියසේන ගමගේ මැතිතුමායි, මමයි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නායකයෝ විධියට හිටියා. එතුමා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කළේ. එතුමාගේ මැතිවරණ ව්‍යාපාරයට කර උර දීලා මම තමයි කථිකයා විධියට කථා කළේ. දේශපාලනයේ යෙදෙමින් එතුමන්ලා අපි ඔක්කොම ජන වේගයේ - අපේ දේශපාලනයේ - එක තැනක තමයි හිටියේ. ඒකට විශාල විරෝධයක්, විශාල භයක් එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට තිබුණා.

නිහාල් ඩයස් කියන්නේ 1971 කැරැල්ලේ හිටපු එක් නායකයෙක්; අත් අඩංගුවට පත් වෙලා ඉඳලා ආපු හොඳ මාක්ස්වාදී නායකයෙක්. නිහාල් ඩයස්, සුමිත් දෙවිනුවර කියලා තරුණ නායකයෝ කල්ලියක් හිටියා. ඒ කණ්ඩායම් ඔක්කොම ඇවිත් ජන වේගයට එකතු වුණා. ඒ එක්කම ධර්මසේකර අත් අඩංගුවට ගත්තා. ඒ කාලයේ අපි දොඩන්ගොඩලා වැලිකඩ හිර ගෙදරට ගිහින් 1971 කැරැල්ලේ නායකයින්ට පත්තර බෙදුවා. ඒ අනුව අපි බොහෝ අයව මේ ව්‍යාපාරයට ගත්තා. මේ විධියට ගිහින් 1976 වන කොට ආණ්ඩුව ඇතුළත විශාල අර්බුදයක් ඇති වුණා; මතවාදී අරගලයක් ඇති වුණා. මේ මතවාදී අරගලය තමයි ආණ්ඩුව කොහේටද යන්නේ කියන එක. ඒ නිසා වමට යන්න අපි බලාපොරොත්තු වුණා. 1976 දී මේ රටේ මහා වැඩ වර්ජනයක් ඇති වුණා. මේ වැඩ වර්ජනයට "ජන වේගය" කණ්ඩායම නායකත්වය දුන්නා. මේ වන කොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතිවලින් තුන් කාලක් අපේ නායකත්වය යටතේයි තිබුණේ. ලක්ෂ ගණනක් කම්කරුවෝ අපිත් එක්ක හිටියා. අපි වෙනම මධ්‍යස්ථානයක් හදලා එතැනදි හම්බ වෙලා වෘත්තිය සමිති රැස්වීම් පැවැත්වුවා. මහා වැඩ වර්ජනය කඩාකප්පල් කරන විට අපි තීන්දුවකට ආවා. දොඩන්ගොඩ එතකොට පදිංචි වෙලා හිටියේ බම්බලපිටියේ ලයන්ස් හෝටලයේ පිටුපස තිබුණු කාමරයකයි. එතැන දී තමයි අපේ සියලු රහස් සාකච්ඡා අපි පැවැත්වූයේ. ඒ 1976 මහා වැඩ වර්ජනයේ දී CID වාර්තා තිබුණා, අපේ කණ්ඩායම - මේ "ජන වේගය" කණ්ඩායම - [බාධා කිරීමක්] මට පොඩ්ඩක් වෙලාව දෙන්න. ඒ කණ්ඩායම තමයි මේකේ පිටුපස ඉන්න ධාවක බලවේගය කියලා ඒ අනුව තීන්දු කළා අපේ වෘත්තිය සමිති නායකයා - ප්‍රවාහන සමිතියේ නායකයා වන අශෝක හෙට්ටිආරච්චි - අත් අඩංගුවට ගන්න. අපි තීන්දු කළා, "නැහැ, අපි භාර දෙන්නේ නැහැ" කියලා. එයාව එදා හංගලා තියා ගත්තේ අමරසිරි දොඩන්ගොඩ ඒ කාමරයේයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ඇමතිතුමා, තව කථිකයන් රාශියක් ඉන්නවා. ප.ව. 12.25ට අපි ශෝක ප්‍රකාශ යෝජනාව අවසන් කරන්නත් ඕනෑ.

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்தியகலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon (Dr.) Rajitha Senaratne)

එහෙම නම් තව දවසකට යමු. මේක ශෝක යෝජනාවක් නේ. මනුස්සයෙක් ගැන කථා කරන්නේ නැතිව කොහොමද? මේකටවත් වෙලාව නැද්ද? මේ වාගේ මිනිසුන් ගැන කථා කරන්න ඕනෑ. මේ වාගේ මිනිසුන් දශක තුන හතරකට එක් කෙනායි බිහි වන්නේ. අමරසිරි දොඩන්ගොඩ මහත්මයා ගැන විනාඩි දහයෙන් කථා කරලා අවසන් කරන්න බැහැ. එතුමා 1970 ගණන්වල ඉඳලා 2009 වන තුරු දේශපාලනය කළා. ඉතින් කොහොමද, මේ විනාඩි දහයෙන් එතුමා ගැන කථා කරන්නේ?

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

එතුමාගේ කථාව ඉතාම සාධාරණයි. එතුමාට වෙලාව දෙන්න.

**ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியகலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon (Dr.) Rajitha Senaratne)

දොඩන්ගොඩ මැතිතුමා එක්ක පාර්ලිමේන්තුවේ හිටපු සගයන්ගෙන් මම තමයි පැරණිම මිත්‍රයා. මටත් පසුව තමයි එතුමාට දි.මු. ජයරත්න මහත්මයා හම්බ වුණේ. මා ඒකත් කියන්න ඕනෑ.

එතුමා ආපු දේශපාලන ගමනක් තිබෙනවා. ඒක දේශපාලන ව්‍යාපාරයක්; එදා මේ රටේ ගමන් කරපු දේශපාලන මතවාදයක්. 1976 මහා වැඩ වර්ජනය අවසානයේ දී අපි කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටියා ඇති වාමාංශික පෙරමුණක් අපි හදන්න ඕනෑය කියා. ඒක හදන්න ඕනෑය කියලා ඒක ගැන විශාල සංවාදයක් ඇතුළේ ඇති වුණා. මොකද, මේකේ සංවාදය තිබුණේ බණ්ඩාරනායක පවුලත් එක්කමයි. එතුමාගේ බෑණා, එතුමාගේ දුව මෙතැන ඉන්නේ. මේ සංවාදය තුළ අපි හැම දාම මධ්‍යම කාරක සභා රැස්වීම් එතැන පවත්වලා ඒක ඉවර වෙලා නැවත පහළ තිබෙන ලයිට් කණුව යට දී අපේ මධ්‍යම කාරක සභා රැස්වීම පවත්වනවා. දොඩන්ගොඩලා, අපි ඒ විධියේ තරුණ කණ්ඩායමක් හිටියා. ඒකට මහාචාර්ය ෂන්මුගරත්නම් - මේ වාගේ බුද්ධිමත් කට්ටිය - අපි ඔක්කොම සම්බන්ධ වෙලා හිටියා. මේ අය නොයෙකුත් අංශවලින් මාක්ස්වාදය හැදෑරූ අයයි. ඒ විධියට කරලා අවසානයේදී මේ අර්බුදය විශාල වශයෙන් ආවා. 1976 වසරේ මැයි දිනය දා අපි "ජන වේගය" යටතේ ඉතා සාර්ථක මැයි පෙළපාළියක් වෙනමම පැවැත්වුවා. නන්ද එල්ලාවල - ඒ කණ්ඩායම - ඒකේ ගමන් ගත්තා. ටෙනිසන් එදිරිසූරියලා, කැකිරාවේ ජිනදාසලා - මේ වාගේ වාමාංශික කට්ටිය - දි.මු. ජයරත්න, නන්දිමිත්‍ර ඒකනායකත් මේකට සහභාගි වුණා. ඒක මහා දැවැන්ත පෙළපාළියක්. ඒ දැවැන්ත පෙළපාළියේ දී දාස මුදලාලිලාට, මේ ඔක්කොම ව්‍යාපාරික ප්‍රජාවට විරුද්ධව අපි සටන් පාඨ කිව්වා. අන්න එදා තමයි විශාලම අර්බුදය ඇති වුණේ. එදා කුමාර් රූපසිංහත් ආවේ නැතිව නන්ද එල්ලාවල නව නායකත්වයට අරගෙන අපි, දොඩන්ගොඩලා මේ ගමන ආවා. ආවාට පසුව විශාල අර්බුදයක් ඇති වුණා. මොකද, ඊට පහුව දාම බණ්ඩාරනායක මැතිනිය කුමාර් රූපසිංහගේ පක්ෂයේ සාමාජිකත්වය තහනම් කළා. තහනම් කරලා "ජන වේගය" කණ්ඩායම අන්තවාදී කණ්ඩායමක් විධියට හැඳින්වුවා. ඒ අනුව එතැනදී කල්‍යානන්ද තිරාණගම කියන පුද්ගලයා න්‍යායික සූත්‍රය මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කරලා "ජාතික ධනේශ්වර පන්තියේ ප්‍රගතිශීලී කාර්ය භාරය අවසන්ව ඇත" කියන දේශපාලන ලියවිල්ල ඉදිරිපත් කළා. ඊට පසුව රංජිත් ගුරුගේ කියන පුද්ගලයා මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළා, "ජාතික ධනේශ්වර පන්තියේ ප්‍රගතිශීලී කාර්ය භාරය අවසන් වී නොමැත" කියා. මේ අනුව අපේ විශාල සංවාදයක් තිබුණා. ඒ සංවාදය තුළ විශාල බහුතර කණ්ඩායමක් ජන වේගයෙන් ඉවත් වුණා. ඉවත් වෙලා අපි ශ්‍රී ලංකා මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය හැදුවා. ඒකේ සභාපති ධුරය ගත්තා - ඉවත් වෙලා ආවා - එදා හිටපු විද්‍යා හා කම්කරු අමාත්‍ය ටී.බී. සුබසිංහ මහත්මයා. එතුමා සභාපති ධුරයේ තියා ගෙන, නන්ද එල්ලාවල මහ ලේකම්වරයා විධියට පත් කර ගත්තා. දොඩන්ගොඩ නියෝජ්‍ය ලේකම්වරයා බවට පත් වුණා. මම තරුණ සමිති නායකයා බවට පත් වුණා. අනික් අය ටෙනිසන් එදිරිසූරිය, ඒ.එම්. ජිනදාස, ගාමිණී ආරියතිලක කියන මන්ත්‍රීවරු. ඒ වන විට ලංකාවේ හදිසි නීතිය. කිසිම පත්තරේක මේක ගැන වාර්තාවක් නැහැ. මොකද, අර ප්‍රවෘත්ති බලධාරියා කපනවා. "ඇත්ත" පත්තරයේ විතරක් මන්ත්‍රීවරුන්ගේ පින්තූර ටික පමණක් දැම්මා. එහෙම තමයි ලංකාවේ මිනිසුන් දැන ගත්තේ ආණ්ඩුවේ වෙනස. මොකද, ආණ්ඩුව යටතේ තමයි එදා සියලුම පුවත් පත්, රේඩියෝ තිබුණේ. ඒ නිසා කවුරුත් දන්නේ නැහැ. පින්තූර ටිකක් විතරක් තිබෙනවා. මිනිස්සු හිතා ගත්තා, මොකක් හෝ ගෝරියක් කියලා. මේ විධියට අපි එළියට බැස්සා. ඒ එළියට බැසීම තුළ, ආණ්ඩුවේ බහුතරය අඩු වීම තුළ හදිසි නීතිය නැති වුණා. අපි ගත් ක්‍රියාමාර්ගය නිසා ධර්මසේකරලා වාගේ දේශපාලන සිරකරුවන් නිදහස් වුණා. විත්තිකරුවන් හැරෙන්න අනිකුත් සියලුම දේශපාලන සිරකරුවන් නිදහස් වුණා. ඒ නිදහස් වුණු සියලු දෙනාම අපිව සොයා ගෙන ආවා. මේක තමයි අලුතින් හැදෙන පක්ෂය. අපි ලංකා සමසමාජ පක්ෂයත් එක්ක කථා කළා. ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය එන්න බැහැයි කියද්දී අපි ගිහින් බොහොම අමාරුවෙන් එම පක්ෂය සම්බන්ධ කර ගත්තා. එතකොට වාසුදේව නානායක්කාරලා හදා තිබුණා, වාම සමසමාජය. මේ සියලුම පක්ෂත් සම්බන්ධ කර ගෙන, අමරසිරි දොඩන්ගොඩ මැතිතුමන්ලා, අපි 1977 දී ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමාගේ නායකත්වයෙන් සමාජවාදී එක්සත් පෙරමුණ හැදුවා.

ඊට පසුව දොඩන්ගොඩ මැතිතුමා පළමු වන වතාවට අක්මීමන ආසනයට තරග කළා, මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන්. ඒ කාලයේ එතුමාගේ රැස්වීම් අමතන්න මා යනවා. ඒ මැතිවරණයේදී - මුළු ලංකාවෙන්ම - මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ආසන සංඛ්‍යාව බින්දුවට වැටුණා. ඊට පසුව පළමු වන රැළිය බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් හයිඩ් පාර්ක් පිටියේ දී පැවැත් වුණු බව මට තවම මතකයි. පරාජයෙන් පසුව පැවැත් වූ පළමු වන දේශපාලන රැළිය ඒක තමයි. එහිදී සියලු දෙනාටම ගහලා එළෙව්වා. මමයි, දොඩන්ගොඩ මැතිතුමායි එකටයි ඒ රැස්වීම බැලුවේ. එතැනදී දොඩන්ගොඩ මැතිතුමා නැවත වෙනස් වනවා මට පෙනුණා. එතුමා කිව්වා, "මේ විධියට හරි යන්නේ නැහැ රාජිත, එක්සත් ජාතික පක්ෂයට විරුද්ධව, මේ ඒකාධිපති ක්‍රමයට විරුද්ධව අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක එකතු වෙලා වැඩ කරන්න ඕනෑ" යි කියලා. එතුමා සහ අපි මත දෙකක සිටියත් එතුමා ඒ ගමන ගියා.

ඊට පසුව එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බද්දේගම සංවිධායක ධුරයට පත් වුණා. මේ වාගේ කීර්තිමත් ඉතිහාසයක් එතුමාට තිබුණා. ඒ කිසිදු සටනක දී එතුමා පසු බැවේ නැහැ. මොකද, ඒ කාලයේ වාමාංශික පෙරමුණ හදන්නය කියලා අමරසිරි දොඩන්ගොඩ මහත්මයා ගිහින් කුමාර් රූපසිංහට කිව්ව බව මට මතකයි. "ඔබතුමා ලංකාවේ මේ වාමාංශික බලවේගය හදනවා නම් මං ජීවිත කාලයම අව්‍යාජකව, පූර්ණ කාලීනයකු විධියට මේකට කැප වනවා" යි කියලා එතුමා කිව්වා. නමුත් ඒවා සිද්ධ වුණේ නැහැ. ඒ නිසා එතුමා නැවත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගියා. අපේ කණ්ඩායම විසුරුණා.

1982 දී නැවත මමත්, එතුමාත් එකම වේදිකාවේ කොබ්බෑකඩුව මහත්මයාට වැඩ කළා. එහිදීත් නැවත පැරදුණා. මේ විධියට ගියාම 1982 ජනාධිපතිවරණයෙන් පසුව ලාම්පු-කළගෙඩි සෙල්ලම ආවා. ඒකෙන් බද්දේගම ආසනය ජයග්‍රහණය කළා. ඇත්තටම ඒ මැතිවරණයට නායකත්වය දුන්නේ දොඩන්ගොඩ මැතිතුමායි. ඒ කාලයේ පියසේන ගමගේ මැතිතුමා හිනිදුම ආසනයේ රැස්වීම් සංවිධානය කළා. අපි, දොඩන්ගොඩ මැතිතුමන්ලා ගිහින් ඒ රැස්වීම්වල කථා කරනවා.

එදා ඒ ජනමත විචාරණයෙන් පැරදුණු ආසනවලට අතුරු මැතිවරණ පැවැත්වුවා. ඒ අතුරු මැතිවරණයට දොඩන්ගොඩ මහත්මයා ඉදිරිපත් වුණා. ඒ මැතිවරණයේදී එතුමා වෙනුවෙන් කථා කරන්න මමත් ගියා. එතකොට මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නොසිටියත්, දොඩන්ගොඩ මැතිතුමා වෙනුවෙන් අපිත් එක්ක හිටපු අපේ පැරණි මිත්‍රයෝ සියලු දෙනාම එහි ගියා. සල්ලි එකතු කරලා. සල්ලිත් අරගෙන ගිහින් ඒ මැතිවරණයේදී එතුමාට වැඩ කළා. එතුමා ජයග්‍රහණය කළා. රිචර්ඩ් පතිරණ මැතිතුමා අක්මීමන ආසනයෙන් තරග කරලා ජයග්‍රහණය කළා.

දොඩන්ගොඩ මැතිතුමා දිවුරුම් දෙන දවසේ පාර්ලිමේන්තුවට එන්න අපි කිහිප දෙනෙක්ම ගියා කියලා මට තවම මතකයි. එතුමා ආවේ ලයන්ස් හෝටලයේ කාමරයක ඉඳලා. එදා තමයි, මට ඉස්සෙල්ලාම රිචර්ඩ් පතිරණ මැතිතුමා හමු වුණේ. එතුමාත් ඒ කාමරයට ආවා. ඒ දෙදෙනාම ඇඳ ගෙන හිටපු නිල් පාට ෂර්ට් ගලවලා ජාතික ඇඳුම ඇඳ ගෙන, එතැන ඉඳලා තමයි අපිත් එක්ක පාර්ලිමේන්තුවට ආවේ, දිවුරුම් දෙන්න. එදා එතුමා පළමු වන වරට මන්ත්‍රීවරයකු වශයෙන් දිවුරුම් දුන්නා. එතැන ඉඳලා එතුමාගේ දේශපාලන චාරිකාව පිළිබඳව මේ ගරු සභාවේ සිටින බොහෝ අය දන්නවා.

අද මා වැඩියෙන්ම ආවේ එතුමා පිළිබඳව නොදන්නා කාලයේ ඒ ගමන ඒම සඳහා එතුමා කටයුතු කළ ආකාරය පිළිබඳව කියන්න

[ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මහතා]

මට අවශ්‍ය වූ නිසායි. දැන් කාලයේ වාගේ තනතුරුවලටවත් එහෙම නැතිව ධනය හම්බ කරන්නවත්, තැනක් ගන්නවත් දේශපාලනයට ආපු මිනිහෙක් නොවෙයි, අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා. ඒ කාලයේ දේශපාලනයට ආවේ මතවාදයක් හරහායි. ඒ කාලයේ විශාල දෘෂ්ටි අරගලයක් තිබුණා, ධනවාදය ද, සමාජවාදය ද කියලා. ඒ සමාජවාදී කෝණයෙන් බලලා, අපේ කාලයේ මේ වාගේ ආණ්ඩුවක් ලංකාවේ හදන්න හම්බ වන්නේ නැහැ; නමුත් අපේ දරුවන්ගේ කාලයේ මෙවැනි ආණ්ඩුවක් හම්බ වනවා; ඒ නිසා අපි පාර්ලිමේන්තු ක්‍රම ප්‍රතික්ෂේප කරමින්, පාර්ලිමේන්තුව වේදිකාවක් විධියට පාවිච්චි කරනවාය කියා තමයි අපි ඒ කාලයේ දේශපාලන ගමන ආවේ. ඒ පරපුරේ කෙනකු විධියට හිටපු දොඩන්ගොඩ මැතිතුමා මහ ඇමති ධුරයට පත් වෙලා දීර්ඝ ගමනක් ආවා. කොච්චර කාලයක් අපි දෙදෙනා දෙපැත්තේ හිටියත් අපි දෙදෙනාගේ මිත්‍රත්වය නැති වුණේ නැහැ. හැම අවුරුද්දකම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට එතුමා සහභාගි වුණා. හැම අවුරුද්දේම එතුමාගේ කථාව හදන්නට මම උපකාර කළා. එතුමා ඒ පොත්, සෞඛ්‍ය වාර්තා අරගෙන මගේ ගෙදර එනවා. ඇවිල්ලා මට දවස් දෙක තුනක කාලයක් දෙනවා. ඊට පස්සේ අපි රෑට එකතු වෙලා කථා කරනවා.

එතුමා ශ්‍රාවස්තියේ ඉන්න කොට ෂර්ට් එකයි සරමයි ඇඳ ගෙන, සෙරෙප්පු දෙකක්වත් පයේ නැතිව ශ්‍රාවස්තියේ ඉඳලා නොරිස් කැනල්වල තිබුණු මගේ ගෙදරට රෑට එනවා. එහෙම ආවාම අපි දෙන්නා බීම පොඩ්ඩක් එහෙම අර ගෙන කථා කර කර ඉන්නවා. බීම ටිකක් ගත්තාම අපි දෙන්නාගේ කථාව උළු හෙල්ලෙන තරමට යනවා. මොකද? එතකොට මම මහජන පක්ෂයේ; එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. අපි විශාල වශයෙන් මතවාදීව වෙනස්. මගේ නෝනා කුස්සියේ ඉඳලා ඇවිල්ලා, මට පැත්තකට අඬ ගහලා කියනවා, "මොකක්ද මේ. ගෙදරට ආපු මනුස්සයාට කථා කරන්නේ ඔහොමද?" කියලා. එහෙත් අපි දෙන්නාගේ ඒ කථාව දේශපාලනයට විතරයි සීමා වුණේ. මිත්‍රත්වය හැම දාම එහෙමම තිබුණා. ඊට පසුව දා හමු වුණාම අපි හිනා වෙලා කථා කරලා ඒ මිත්‍රත්වය දිගටම පවත්වා ගෙන ගියා. ඒ මොන වාද තිබුණත් එතුමා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට යන්නේ මාත් එක්ක කථා කර ගෙනයි.

එතුමා කළ දෙයක් මට තවමත් මතකයි. එදා මහවැලිය විවෘත කරන්නට මහ රැජින එන වෙලාවේ ඒකට විරුද්ධව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් සහ වමේ පක්ෂ සියල්ලම විශාල ආන්දෝලනයක් කළා. මේ අධිරාජ්‍යවාදී රැජිනව ගේන්න එපා කිව්වා. දොඩන්ගොඩ මාව හම්බ වන්න ආවා. ඇවිල්ලා මට කිව්වා, "රාජිත මේකට විරුද්ධව පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කරලා ඉල්ලා අස් වන්න මගේ තීන්දුවක් තිබෙනවා" කියලා. මම කිව්වා, "ඒක කරන්න එපා. ඉල්ලා අස් වනවා නම් රටේ ප්‍රශ්නයක් වෙනුවෙන් ඉල්ලා අස් වන්න. මේ වාගේ විජාතික ප්‍රශ්නවලට ඉල්ලා අස් වන්න එපා. මහ රැජින ලංකාවට එනවාද නැද්ද කියන එක වැදගත් නැහැ. ඉදිරියේදී මේ රටේ ජාතික ප්‍රශ්නයක් ඒවි. අන්න එදාට අපි ඔක්කෝම එකතු වෙමු. එතෙක් ඒක කරන්න එපා" කියලා. මොකද, අපි දැක්කා අපේ වාමාංශික ව්‍යාපාරය කඩා ගෙන වැටුණේ ලංකාවේ ප්‍රශ්නවලට නොවන බව. ට්‍රොට්ස්කිලයි, ස්ටාලින්ලයි එහේ ගහ ගන්න කොට මෙහේ අයත් ගහ ගත්තා. මාඕ රුසියාව එක්ක තිබුණ අර්බුදයේදී මෙහේ අය ගහ ගත්තා. ඒ වාගේ අනවශ්‍ය විධියට තමයි මෙහේ ගුරුකුල පටන් ගත්තේ. අද ඔය මතවාද එකක්වත් නැතිව ඔක්කෝම ගුරුකුල එකතු වනවා. එතුමා එදා නොයෙකුත් තීන්දු ගන්න කොට දේශපාලනයේ පැරණි මිතුරන් විධියට අපිත් එක්ක කථා කළා. අද දේශපාලනයේ ඉන්න කට්ටිය නොයෙකුත් ස්ථානවල හිටියත් අමරසිරි දොඩන්ගොඩයි, මමයි ඇතුළු ඒ කණ්ඩායම - දේශපාලනයේ හිටපු පැරණි කට්ටිය - එකට එකතු වනවා. ඒ කට්ටිය ඔක්කෝම එකතු වනවා. මේ ළඟදීත් අපි එකතු වුණා. පේරාදෙණියේ දේශපාලන ගුරුකුලයේ අපි ඔක්කෝම එකතු වුණා. නමුත් එතුමාට එන්න විධියක් තිබුණේ නැහැ. ඒ වන කොට එතුමා අභාවප්‍රාප්ත වෙලා. ඒ රාත්‍රී භෝජනය වෙලාවේ අපේ පැරණි කට්ටිය ඔක්කෝම අය කථා කළේ දොඩන්ගොඩ නැති පාඩුව ගැනයි. දොඩන්ගොඩලා අපි ඔක්කෝම සහෝදරයෝ වාගේ හිටපු කට්ටිය. අපි කට්ටිය තවමත් හමු වනවා. ඒ අවස්ථාවල තවමත් දොඩන්ගොඩ ගැන කථා කරනවා. මොකද, දොඩන්ගොඩ නැති පාඩුව අපට බොහෝ සේ දැනෙන නිසා. රෝගී තත්ත්වය නිසා අවසාන කාලයේ එතුමාට එතුමාගේ දේශපාලන ජීවිතය ගත කරන්න බැරි වුණා. ඒ රෝගී තත්ත්වය නිසා නියම ගාමක දොඩන්ගොඩගේ චරිතය අලුත් පරපුරේ කට්ටිය දැක්කේ නැහැ. නමුත් දොඩන්ගොඩ කියන්නේ දකුණෙන් බිහි වුණු ඉතාමත් කීර්තිමත් දේශපාලනඥයෙක්. එතුමා හැම දාම වර්තමාන ජනාධිපතිවරයාත් එක්ක හිටියා. හැම අර්බුදයේදීම නොසැලී හිටියා. මැතිනියද, මහින්දද කිව්වොත් එදා ඔහු මහින්දත් එක්ක හිටියා. ඒ විධියට දිගටම හිටියා. ඒ නිසා තමයි ජනාධිපතිතුමාත් ඒවා අමතක නොකර අමරසිරි දොඩන්ගොඩට කළ හැකි සියලු දේවල් අවසානය දක්වා කළේ. මේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වනවා දකින්නට දේශපාලන ලෝකයේ ආශාවෙන්ම හිටපු පුද්ගලයා අමරසිරි දොඩන්ගොඩය කිව්වොත් වැරදි නැහැ. දකුණෙන් දේශපාලන නායකයකු බිහි කළ යුතුය කියන මතවාදයේ එතුමා දීර්ඝ කාලයක් නොසැලී සිටියා.

අපේ ආගමානුකූලව අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාට නිවන් සුව ලැබේවා කියලා මේ වෙලාවේ ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ භාර්යාව ඇතුළු දරුවන්ට අපේ ශෝකය පළ කරන්නට මා පමණක් නොව මගේ පවුලේ සියලුම දෙනා එකතු කර ගන්නවා. එතුමා මගේ පියා එක්ක, මගේ මවත් එක්ක පවා සම්බන්ධ වෙලා හිටියා. මොකද, එතුමා ඒ කාලයේ දේශපාලන කටයුතුවලට කොළඹ ඇවිල්ලා රෑට නැවතුණේ අපේ ගෙදර. ඒ නිසා අපේ පවුලේ සියලුම දෙනාගේම ශෝකය ඒ පවුල වෙත පළ කරමින්, එතුමාට නිවන් සුව අත් වේවා! කියා ප්‍රාර්ථනා කරමින් මා නිශ්ශබ්ද වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමා.

[අ. භා. 12.06]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ඉතාමත්ම ස්තුතිවන්ත වනවා. දිවංගත අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී දේශපාලන නායකයන්, මැති ඇමතිවරුන් බොහෝ දෙනකු අදහස් ප්‍රකාශ කළ නිසාත්, තවත් කථිකයෝ බොහෝ දෙනකු සිටින නිසාත්, ඒ වාගේම කාලය සම්බන්ධයෙන් ඔබතුමා ප්‍රකාශ කළ නිසාත් මා දීර්ඝ ලෙස කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා දුර්ලභ ගණයේ දේශපාලනඥයකු විධියටයි අපි සලකන්නේ. එතුමා බද්දේගම ප්‍රදේශයේ මධ්‍යම පන්තියේ දරුවන් නව දෙනෙකුගෙන් යුත් පවුලක හතර වැනියා ලෙස ඉපිද බද්දේගම රතනසාර විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා, ඉන් පසුව රිච්මන්ඩ් විද්‍යාලයෙන් ද්විතීයික අධ්‍යාපනය ලැබුවා. අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා ගෙන ඊට පසුව "ජන වේගය", "ගිනි පුපුර" වැනි වාමාංශික දේශපාලන ව්‍යාපාරවලට සම්බන්ධව කටයුතු කළා. එක්සත් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී පක්ෂයෙන් පළමු වන වරට දේශපාලනයට පිවිසි එතුමා දිවංගත වන අවස්ථාව වන විට මේ රටේ කාගේත් ආදරයට, ගෞරවයට ලක් වුණු නිහතමානි අවංක දේශපාලනඥයකු වුණා.

එතුමා සේවය කළ සියලු අමාත්‍යාංශවල නිලධාරීන් අද එතුමා ගැන ගෞරවයෙන් කතා කරනවා. එතුමා සමුපකාර, පළාත් සභා සහ දේශීය වෛද්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කළ

අවස්ථාවේදී, ඒ වාගේම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා වශයෙන් කටයුතු කළ අවස්ථාවේදී කළ සේවාව කවුරුවත් අමතක කරන්නේ නැහැ. ඒ තැන්වල වැඩ කරපු නිලධාරීන් අදත් එතුමා ගැන කතා කරන්නේ බොහොම ගෞරවයෙන්. එතුමා තමන්ගේ පදවිය, තමන්ට තිබුණු බලය, තමන්ට තිබුණු ශක්තිය ගැන උඩඟු නොවී මහජනතාවට ඉතා සාධාරණ ලෙස විශිෂ්ට සේවාවක් කළා.

එතුමා ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ කාලයේදී බලය බෙදා හැරීමේ ප්‍රශ්නය ආදී කටයුතුවලදී ක්‍රියා කළ ආකාරය ගැන අදත් සියලු දෙනාම මතක් කරනවා. ඒ නිසා අද අපි කතා කරන්නේ මේ රටේ ජීවත් වුණු විශිෂ්ට ගණයේ, දුර්ලභ ගණයේ දේශපාලනඥයකු ගැනයි. ඒ වාගේම මා කියන්න ඕනෑ, දේශපාලනඥයකු වශයෙන් එතුමා තම දෑත් කිලිටි කර ගත්තේ නැති බව. ඕනෑම වෙලාවක ලජ්ජාවක්, බයක් නැතුව ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමා කියා කට පුරා අමන්ත්‍රණය කරන්න පුළුවන් විශිෂ්ට කීර්තිමත් චරිතයක් එතුමා සතු වුණා. එතුමා සමඟ කිට්ටුවෙන් කටයුතු කරන්න, එතුමාව කිට්ටුවෙන් ආශ්‍රය කරන්න මටත් අවස්ථාව ලැබුණා. එතුමා තුළ රට ගැන විශාල හැඟීමක් තිබුණා. එතුමා රටට ආදරය කරපු පුද්ගලයෙක්; තමන්ගේ හෘදය සාක්ෂියට අනුව කටයුතු කරපු පුද්ගලයෙක්; මහජනතාව සමඟ ජීවත් වුණු පුද්ගලයෙක්. ඒ වාගේම මට මේ අවස්ථාවේදී මතක් වනවා, එතුමා අසනීපයෙන් සිටියදී පවා රෝද පුටුවෙන් ගිහිල්ලා ජනහිතකාමී ව්‍යාපෘති විවෘත කරන කොට ඒවාට සහභාගි වුණ බව. මේ අවස්ථාවේදී මා බොහොම ගෞරවයෙන්, බොහොම භක්තියෙන්, සෙනෙහසින් එතුමා කළ සේවය ගැන සඳහන් කරනවා.

මේ අවස්ථාවේදී එතුමාගේ මැතිනිය, දරුවන් ඇතුළු සියලු දෙනාටත්, ගරු චන්ද්‍රිම වීරක්කොඩි මන්ත්‍රීතුමා ඇතුළු පවුලේ අනිකුත් ඥාතීන්ටත් එක්සත් ජාතික පක්ෂයේ ශෝකය පළ කරන අතර එතුමාට නිවන් සුව ලැබේවා!යි ප්‍රාර්ථනා කරනවා.

**[பி.ப. 12.10]**

**ගරු වී. පුත්තිරසිගාමනී මහතා (අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා )**

(மாண்புமிகு வீ. புத்திரசிகாமணி - நீதிப் பிரதி அமைச்சர்)

(The Hon. V. Puththirasigamoney - Deputy Minister of Justice )

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அமைச்சர் அமரசிறி தொடங்கொட அவர்களுடைய மறைவையொட்டிய இரங்கலுரையை நான் இங்கு தமிழிலே ஆற்ற விரும்புகின்றேன். நீதிப் பிரதி அமைச்சராகப் பதவியேற்ற நான், அவருடைய காரியாலயத்திலே அவரை முதன்முதலில் சந்தித்தபோது, அவர் "இந்த அமைச்சுக்கு முதற் தடவையாக மலையக மக்களின் பிரதிநிதியாகிய வந்த உங்களுடைய சேவை முக்கியமாக மலையக மக்களைச் சென்றடையவேண்டும்" என்று என்னிடம் கூறினார். நான் மாகாண சபை அமைச்சராக இருந்தபோதுதான் முதலிலே அவரைப்பற்றி அறியக்கூடியதாக இருந்தது. அப்பொழுது அவர் தென் மாகாண சபையின் முதலமைச்சராக இருந்தார். நான் அவரைச் சந்தித்தபோதெல்லாம் 13வது திருத்தச் சட்டம் பற்றியும் மாகாண சபைகளுக்குக் கொடுக்க வேண்டிய பொறுப்புக்கள் பற்றியும் அவர் என்னிடம் நிறையப் பேசியிருக்கின்றார். குறித்த விடயங்கள் சம்பந்தமாகப் பேசுகின்றபோதெல்லாம் அவர் ஓர் நடமாடும் வாசிகசாலைபோன்று செயற்பட்டார். அதுமாத்திரமல்ல, அவர் ஒரு சிறந்த இடதுசாரி அரசியல்வாதியாகவும் திகழ்ந்தார்.

அவருடைய பெயர் வடக்கு, கிழக்கு, தெற்கு, மேற்கு என்று எல்லாப் பகுதிகளிலும் நிலைத்திருக்கும் என்பதற்கு ஒரு காரணம், அவருடைய காலத்திலே பல்வேறு இடங்களிலும் மேல் நீதிமன்றங்கள் நிறுவப்பட்டமையாகும். கல்முனை, யாழ்ப்பாணம், மொனராகலை ஆகிய இடங்களிலுள்ள மேல் நீதிமன்றங்களாகட்டும், அல்லது மேல் மாகாணத்திலுள்ள பல்வேறு மேல் நீதிமன்றங்களாகட்டும், அங்கெல்லாம் அவரது பெயர் பொறிக்கப்பட்டிருக்கின்றது. அவர் இறந்த தினத்தன்றுதான் நுவரெலியா மேல் நீதிமன்றம் திறந்துவைக்கப்பட்டது. நாம் அங்கிருந்தபோதுதான் அமைச்சர் அவர்கள் காலமான செய்தி எங்களுக்குக் கிட்டியது. நுவரெலியா மேல் நீதிமன்றத்திலும்கூட அவருடைய பெயர் பொறிக்கப்பட்டிருக்கின்றது. ஆனால், அவருடைய பெயர் கல்லில் மாத்திரமல்ல, மக்கள் மனத்திலும் பொறிக்கப்பட்டிருக்கின்றது என்பதையும் நாங்கள் இங்கு கூற வேண்டும்.

எனக்கு முன்பு பேசியவர்கள் அவரைப் பற்றிய பல விடயங்களைக் குறிப்பிட்டிருந்தாலும்கூட, மேலும் சில விடயங்களை நான் குறிப்பிட விரும்புகின்றேன். அவர் சுகவீனமுற்றிருந்த காலத்திலே நான் அவருடைய அமைச்சின் பதில் அமைச்சராகச் செயற்பட்டிருக்கின்றேன். சுகவீனமுற்று கட்டிலில் இருந்தபோதும்கூட அவர் எங்களுடைய சுக நலத்தைப் பற்றி விசாரிப்பவராக இருந்தார் என்பதையும் நான் இங்கு கூறி வைக்க விரும்புகின்றேன். அவர் தான் நடக்க முடியாத காலத்திலும் அமைச்சுக்கு வந்து, என்னை அழைத்துப் பல்வேறு வேலைகளையும் பொறுப்புக்களையும் தருவார். அப்பொழுதெல்லாம் எந்தவித பிரச்சினையுமின்றி நான் அந்தக் கடமைகளைச் செய்திருக்கின்றேன். எனவே, நான் அவருடைய பிரதியமைச்சராக வேலை செய்த ஓராண்டு காலம் மிகவும் சந்தோஷமான காலமென்றே இந்த நேரத்தில் சொல்லவேண்டும்.

நீதி, சட்ட மறுசீரமைப்பு அமைச்சர் என்ற வகையிலே அவர் இந்தச் சபையில் பல்வேறு புதிய சட்டங்களைக் கொண்டு வந்திருக்கின்றார். இந்த நாட்டில் உண்மையான நீதி நிலைத்திருக்க வேண்டும் என்பதற்காக அவர் கடைசியாகத் தயாரித்தத சட்ட வரைபு Assistance and Protection to Victims of Crime and Witnesses ஆகும் என்பதையும் நான் இந்த நேரத்திலே குறிப்பிட விரும்புகின்றேன். என்னுடைய அமைச்சின் மூலமாக குறுகிய காலத்திற்குள்ளே எமது பிரதேச மக்களுக்கு பல்லேறு சேவைகளைச் செய்யக்கூடிய வாய்ப்பை எனக்கு அளித்திருக்கிறார். எனவே, மலையக மக்களும் மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்களும் அவருக்கு நனறியுடையவர்களாக இருக்கவேண்டும்.

எனக்கு முன்னர் உரையாற்றியவர்களில் மிக முக்கியமாக நிர்மாணத்துறை, பொறியியல் சேவைகள் அமைச்சர் மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன அவர்கள், தான் அவருடன் நெருங்கிப் பழகிய காலத்தில் இடம்பெற்ற பல விடயங்களை இங்கு குறிப்பிட்டிருந்தார். ஆரம்பத்தில் இந்த நாட்டின் இடதுசாரி இயக்கத்தில் இருந்த ஒவ்வொருவரும் சிறுபான்மையின மக்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் தொடர்பாக மிகவும் ஆழமாகச் சிந்தித்துச் செயற்பட்டவர்கள் என்றே கூறவேண்டும். இப்பொழுது அரசியலமைப்பின் பதின்மூன்றாவது திருத்தச் சட்டம் தொடர்பாக இங்கு நிறையப் பேசப்படுகின்றது. அவர் முன்பு ஒரு மாகாண முதலமைச்சராக இருந்தவர். எனவே, அவர் முதலமைச்சராக இருந்த காலத்தில் அரசியலமைப்பின் பதின்மூன்றாவது திருத்தச் சட்டத்தின் மூலமாக இந்த நாட்டில் புரையோடிப்போயிருக்கின்ற பிரச்சினைகளைத் தீர்க்க முடியும் என்ற நம்பிக்கையுடனேயே அவர் இருந்தார் என்பதை நான் இச்சந்தர்ப்பத்திலே சுட்டிக்காட்ட விரும்புகின்றேன். எனவே, அவருக்கு சிங்கள வார்த்தையிலே "නිවන් සුව පතමු" எனக் கூறி அஞ்சலி செலுத்தி, அவருடைய பாரியாருக்கும் குழந்தைகளுக்கும் அவருடைய உறவினர்களுக்கும் மலையக மக்கள் சார்பிலும் தனிப்பட்ட ரீதியாக எனதும் எனது குடும்பத்தினரதும் அனுதாபங்களைத் தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி.

**නියෝජ්‍ය කථානායකතුමා**

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

ස්තුතියි. කථිකයන් රාශියක් සිටින නිසා, මේ යෝජනාව සඳහා වෙන් වූ කාලය පස්වරු 1.00 දක්වා දීර්ඝ කරන්නට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි. මීළඟට ගරු මහින්ද යාපා අබේවර්ධන අමාත්‍යතුමා.

[අ. භා. 12.17]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கலாசார அலுவல்கள், தேசிய மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardene - Minister of Cultural Affairs and National Heritage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමරසිරි දොඩන්ගොඩ අමාත්‍යතුමා වෙනුවෙන් අපගේ ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ සඳහන් කරන්නට ඕනෑ, මේ රටේ ජීවත් වුණු අති ශ්‍රේෂ්ඨ ගණයේ මනුෂ්‍යයෙකු හැටියට එතුමා පිළිබඳ මතකය සදා කාලිකවම අපේ සිත් තුළ රැඳී පවතින බව. මට එතුමාව ආශ්‍රය කරන්නට ලැබුණේ 1970 දශකයේයි. එදා ඉඳලා එතුමා මිය යන තුරුම ඉතාමත් සමීප, හිතවත්, විශ්වාසවන්ත මිත්‍රයන් හැටියට අපට ආශ්‍රය කරන්නට අවස්ථාව ලැබුණා. 1970 දශකයේ අප දෙදෙනා සිටියේ ප්‍රතිවිරුද්ධ දේශපාලන කඳවුරු දෙකකයි. අපි දෙන්නා එක කාමරයේ සිටියා. නමුත් දේශපාලන වශයෙන් අප දෙදෙනා අතර කවදාවත් මත භේදයක් ඇති වුණේ නැහැ. එතුමාගේ දේශපාලනය ගැන මම ප්‍රශ්න කළේත් නැහැ. මගේ දේශපාලනය ගැන එතුමා කථා කළේත් නැහැ. ඒ තරම් සමීප, හිතවත්කමක් අප දෙදෙනා අතරේ තිබුණා. අප දෙදෙනාට ඉතාමත්ම කිට්ටුවෙන් කටයුතු කරන්නට අවස්ථාව ලැබුණේ 1993 අවුරුද්දේ දකුණු පළාත් සභා මැතිවරණයෙන් පසුවයි. එදා මම ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණෙනුත්, එතුමා පොදු ජන එක්සත් පෙරමුණෙනුත් පත් වුණා. අපි දෙ ගොල්ලන් එකට එකතු වුණාම තමයි පළාත් සභාව පිහිටු වන්න අපට අවශ්‍ය බහුතරය ලැබුණේ. එදා එක්සත් ජාතික පක්ෂය එම පළාත් සභා පිහිටු වීම වැළැක්වීම සඳහා ගන්න පුළුවන් උපරිම වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කළා. ඒ හැම වෙලාවකම අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා අප කෙරෙහි විශාල විශ්වාසයක් තබා ගෙන කටයුතු කළා. පළාත් සභාවේ සභාපතිවරයා හැටියට සභාව ආරක්ෂා කර ගෙන කටයුතු කිරීමේ සම්පූර්ණ වගකීම තිබුණේ මා අතේයි. ඒ වෙලාවේ මා කල්පනා කළා, මගේ මිත්‍රයාට ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කර ගෙන යාම සඳහා ශක්තියක් ලබා දීමට ලැබුණු අවස්ථාවක් කියලා. අවුරුදු ගණනාවක අප දෙදෙනාගේ ආශ්‍රය, අප දෙදෙනාගේ හිතවත්කම, මිත්‍රකම ඒ කාරණයට දැඩි ලෙස හේතු වුණා. ඒ නිසා දන්නා සෙල්ලම් සියල්ලම දමලා තමයි එදා අපි පළාත් සභාව ආරක්ෂා කර ගන්නට කටයුතු කළේ. අවසානයේ මොකද වුණේ කියලා, ගරු වජිර අබේවර්ධන මන්ත්‍රීතුමා දන්නවා ඇති. පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුව පැහැර ගෙන ඇවිල්ලා තමයි, යන්තම් මේක කඩා ගන්න පුළුවන් වුණේ. ඒත් එක්සත් ජාතික පක්ෂයට ගන්න බැරි වුණා. එක්සත් ජාතික පක්ෂය ඉතිහාසයේ කරපු ඉතාමත්ම බරපතළම මෝඩකම්වලින් එකක් හැටියට තමයි ඒ වෙලාවේ එම මන්ත්‍රීවරයාව බලහත්කාරයෙන් පැහැර ගෙන ආපු එක අපි දකින්නේ. ඒ, ප්‍රැන්සිස්කෝ මන්ත්‍රීතුමා. එදා ඒ වැරැදීම තමයි අදත් ඔය වැරැදිලා තිබෙන්නේ. ඒ ගත්තු වැරැදි තීරණයේ ප්‍රතිඵල නිසා තමයි, අදත් එක්සත් ජාතික පක්ෂය යන එන මං නැති තැනට වැටිලා තිබෙන්නේ. අපි එදා සභාව ආරක්ෂා කර ගන්න ඒ විධියට කටයුතු කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙලාවේ අපට විවිධ බලපෑම්වලට යටත් වන්නට සිද්ධ වුණා. විවිධ තර්ජනවලට යටත් වන්නට අපට සිද්ධ වුණා. නමුත් අපි ඒකට මුහුණ දුන්නා. මුහුණ දීලා අපි එකා වාගේ ඒ ප්‍රශ්නයේ දී අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා වෙනුවෙන් කැප වීමෙන් කටයුතු කළා.

ඒ වාගේම එතුමාත්, මමත් ජීවිතයේ එකඟ නොවුණු එකම එක දෙයයි තිබුණේ. ඒක මා මේ වෙලාවේ කියන්නේ නැහැ. ඒ නිසාම තමයි, එතුමාගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහෙන්නට පටන් ගත්තේ. අපි දෙදෙනා අතරේ මතයක්, වාදයක් ඇති වුණා නම් ඇති වුණේ ඒකට විතරයි. හුඟක් වෙලාවට මා එතුමාත් එක්ක විරුද්ධ වුණේ එතැනදීයි. නමුත් එතුමා මහජන සේවයට ගියාම කල් වේලා බැලුවේ නැහැ. ජීවිතයේ අවසාන දවසේත්, තමන් ඇඳට වැටෙන තුරුත්, රෝද පුටුවෙන් ගිහිල්ලා හරි ජනතා අවශ්‍යතාවන් ඉෂ්ට කරන්නට එතුමා කටයුතු කළා. අන්න ඒ විධියේ පුදුමාකාර මනුෂ්‍යකමක්, පුදුමාකාර ලෙන්ගතුකමක් තිබුණු පුද්ගලයෙක්. කවදාවත් කෙනෙකුගේ හිත රිදෙන්නට වචනයක් කියනවා මම අහලා නැහැ. කිසිම කාලෙක කෙනෙකුට බැණ වදිනවා ඇහිලා නැහැ. කිසිම කාලෙක කෙනෙකුට දොස් කියනවා ඇහිලා නැහැ. අඩු පාඩුවක් වුණත් ඉතා සාවධානව කථා කරලා ඒ ප්‍රශ්නය විසඳන්න එතුමා හැම වෙලාවේම කටයුතු කළා. අන්න ඒ විධියේ පුදුම ගතිගුණ තිබුණු පුද්ගලයෙක්. ඒ නිසාම තමයි එතුමාගේ ශරීර සෞඛ්‍ය ගැනත් එතුමා නොසලකා හැරියේ. ඒ හේතුව නිසාම තමයි අවසානයේ අපට එතුමා නැති වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ මට කියන්නට තිබෙන්නේ, අපට නැති වුණේ ඉතා ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයකු බවයි. ඒ මනුෂ්‍යායට තව හුඟක් වැඩ කරන්න පුළුවන්කම තිබුණා. හුඟක් කාලයක් තව ජීවත් වන්නත් පුළුවන්කම තිබුණා. නමුත් ඒ සියල්ලම එතුමා නොසලකා හැරියේ මහජන සේවය සඳහා එතුමාගේ තිබුණු කැප වීම නිසයි; මහජනයා අතරේම ජීවත් වන්න තිබුණු වුවමනාව නිසයි; මහජනයා අතරේම තමන්ගේ ජීවිතය ගත කරන්න තිබුණු වුවමනාව නිසයි. තමන්ගේ පවුල ගැන එතුමා සැලකුවේ නැහැ. තමන්ගේ ජීවිතය ගැනවත් එතුමා ඒ තරම් සැලකිල්ලක් දැක්වූවාය කියලා මට හිතන්න බැහැ. ඒ තරමම කැප වීමකින් එතුමා කටයුතු කළේ. හුඟක් වෙලාවට ගෙදරක් ගැන හිතන්නේත් සේරම වැඩ ඉවර වුණාට පස්සේයි. සේරම වැඩ ඉවර වෙලා රෑ 12.00ත් පහු වුණාට පස්සේ තමයි ගෙදර යන්න කල්පනා කරන්නේ. ඒ විධියේ පුදුමාකාර ගතිගුණ එතුමා තුළ තිබුණා. ඒ නිසයි මම කියන්නේ අපට නැති වුණු මේ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයා අපේ ජීවිතවලට; මගේ ජීවිතයට කවදාවත් අමතක නොවන අතිශ්‍රේෂ්ඨ චරිතයක් කියලා. එතුමා ඉතාමත්ම අවංකව, ඉතාමත්ම කැප වීමෙන්, ඒ වාගේම කවදාවත්ම වචනයකින්වත් කෙනෙකුගේ හිත රිද්දන්නේ නැතිව කටයුතු කරපු අතිශ්‍රේෂ්ඨ ගණයේ මන්ත්‍රීවරයෙක්; ඇමතිවරයෙක්. ඒ වාගේම අතිශ්‍රේෂ්ඨ ගණයේ මනුෂ්‍යයෙක්. එවැනි මනුෂ්‍යයන්ගේ ආශ්‍රය අපට ලැබෙන්නේ ඉතාමත්ම කලාතුරකින්. ඒ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයාගේ පවුලේ සියලු සාමාජිකයන්ට මගේ හෘදයාංගම කනගාටුව පළ කරන අතරම, එතුමාට නිවන් සුව අත් වේවා! කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි, ගරු ඇමතිතුමා. ඉතාමත්ම කෙටියෙන් කථා කරන්නය කියා මා ඉල්ලීමක් කරනවා.

මීළඟට ගරු වජිර අබේවර්ධන මන්ත්‍රීතුමා.

[අ. භා. 12.23]

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Vajira Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායක ගැලරියේ සිටින මාඉටිපේ මැතිනිය -දොඩන්ගොඩ මැතිනිය- සහ දරුවන් ඇතුළු පවුලේ සාමාජිකයන් සියලු දෙනාම මා මේ වෙලාවේ සිහිපත් කරනවා. ඒ වාගේම මහින්ද යාපා අබේවර්ධන අපේ හිටපු ප්‍රධාන අමාත්‍යතුමා සඳහන් කළ අන්දමට දීර්ඝ කාලයක් තිස්සේ ළඟ මිත්‍රත්වයක්, සම්බන්ධතාවක් ඇති කර ගෙන තිබුණු ඇමතිවරයෙක්, මන්ත්‍රීවරයෙක්, මිත්‍රයෙක් ගැන සිහිපත් කිරීම ඉතා වැදගත්ය කියලා මම කල්පනා කළා. ඒ නිසාමයි අද කෙසේ හෝ එතුමා ගැන අදහස් කිහිපයක් ප්‍රකාශ කළ යුතුමයි කියලා මා හිතුවේ.

පළාත් සභා සංකල්පය බිහි වුණු වෙලාවේ 1987 දී මා පළාත් සභාවෙන් දේශපාලනයට පිවිසියා. ඒ වකවානුවේදී මට දොඩන්ගොඩ මැතිතුමාව දැන හඳුනා ගන්න, ආශ්‍රය කරන්න, එතුමා සමඟ මිත්‍රත්වයක් ඇති කර ගන්න අවස්ථාවක් ලැබුණා. දොඩන්ගොඩ මැතිතුමා වාගේම එම මැතිනියගේ පවුලේ සාමාජිකයනුත් -මගේ අසල්වැසියන් හැටියට ජීවත් වන මාඉටිපේ පරම්පරාවත්- මා හොඳින් හඳුනනවා. ගාල්ලේ මගේ නිවස ආසන්නයේම සිටින, විශාල සාමාජික සංඛ්‍යාවකින් යුත් ඉතාමත්ම කීර්තිමත් පවුලක සිටි මාඉටිපේ මැතිනිය සමඟයි දොඩන්ගොඩ මැතිතුමා විවාහ වුණේ. එතුමා ආපු දේශපාලන ගමනේදී දශක තුනකට ආසන්න කාලයක් තමා දරපු, තමා විශ්වාස කරපු, තමා අධ්‍යයනය කරපු දේශපාලන මතවාදය තමන්ගේ කණ්ඩායම තුළට ප්‍රචලිත කිරීමට, එහෙම නැත්නම් තමන්ගේ දේශපාලන පක්ෂය තුළ එම මතවාදය ගොඩ නැඟීමට එතුමාගේ මුළු ජීවිතයම කැප කළාය කියා මා කල්පනා කරනවා. අපට එතුමාගේ ජීවිතයෙන් ආදර්ශයක් ගන්න පුළුවන්. එතුමා සමහර අදහස්, බොහොම සමාජවාදීව ගැඹුරටම කල්පනා කරලා සම්පූර්ණයෙන්ම වෙනස් කළ යුතුයි කියලා කල්පනා කළ අවස්ථාත් තිබුණා. එහෙම අවස්ථාවක තමයි, දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට එතුමා දිවුරුම් දුන්නේ. ඒ වෙලාවේ මේ රටේ දේශපාලන තීන්දු, තීරණ ගණනාවක් වෙනස් වුණු අවස්ථාවක්. මේ රටේ තවත් ප්‍රධාන දේශපාලන බලවේගයකට ඡන්ද ඉතිහාසයේ 1956ට පස්සේ ඡන්ද දශ ලක්ෂයක් වෙන් වුණු අවස්ථාවකයි, දොඩන්ගොඩ මැතිතුමා ඒ කණ්ඩායමත් සමඟ ඒක රාශි වෙමින් ප්‍රධාන අමාත්‍යවරයා හැටියට දිවුරුම් දීම සිදු වුණේ. ඒ අතරේ දකුණු පළාතේ ඒ මැතිවරණයත් එක්කම නැවත පළාත් සභාවේ අතුරු මැතිවරණයකට එතුමා මුහුණ දුන්නා. ඒකත් එතුමා ජයග්‍රහණය කළා. ඉන් අනතුරුව එතුමා 1994 පාර්ලිමේන්තු මැතිවරණයත් ජයග්‍රහණය කළා. විශේෂයෙන් මේ ආණ්ඩුව අද මේ මාවතට හරවන්න නායකත්වය දුන්නේ දොඩන්ගොඩ මැතිතුමාය කියලා කිව්වොත් මම හිතනවා ඒක වඩාත් නිවැරදියි කියලා. අද පවතින පොදුජන එක්සත් පෙරමුණේ ආණ්ඩුව බලයට පත් කිරීම සඳහා ලංකාවේ මතවාදයක් ඇති කරපු පුද්ගලයා හැටියට තමයි මට එතුමාව පෙනෙන්නේ. එක්සත් ජාතික පක්ෂය අවුරුදු දහහතකට ආසන්න දීර්ඝ කාලයක් මේ රට පාලනය කරමින් සිටි අවස්ථාවක පොදුජන එක්සත් පෙරමුණට මේ රටේ දේශපාලන බලය ලබා දීමේ ක්‍රියාවලිය ආරම්භ කළේ එතුමායි. දහහත් වසරක් බලයට පැමිණීමට නොහැකිව සිටි එවැනි අවස්ථාවක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කෙරෙහිත්, පොදුජන එක්සත් පෙරමුණ කෙරෙහිත් මේ රටේ විශ්වාසයක් ගොඩ නඟන්න දොඩන්ගොඩ මැතිතුමාට පුළුවන්කම තිබුණා. එතුමා දකුණේ මතවාදය දිනා ගනිමින් පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කරවමින් දකුණේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට දිවුරුම් දීලා "එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව වෙනස් කළ යුතුයි" කියන මතවාදයට මුළු රටේම නායකත්වය දීමට සමත් වුණායි කීවොත් මම හිතනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක තමයි සත්‍ය කරුණ කියා. තමා දරපු එම මතවාදය වෙනුවෙන් තමන්ගේ මුළු ජීවිතයම දොඩන්ගොඩ මැතිතුමා සම්පූර්ණයෙන් කැප කළා. ඒ වාගේම එතුමා කලක් ගාල්ල දිස්ත්‍රික්කයේ මගේ ප්‍රතිවිරුද්ධ දේශපාලන මතය දරන නායකයා හැටියට වැඩ කළා. අපට දේශපාලනයේදී විවිධ අවස්ථාවල විවිධ ප්‍රශ්නවලට, විවිධ කරුණුවලට මුහුණ දෙන්න සිද්ධ වනවා. එහෙම මුහුණ දෙන අවස්ථාවලත් අපි දේශපාලන වශයෙන් කුමන මතවාදයක් දැරුවත්, අපේ දේශපාලන පක්ෂය කුමන මතවාදයක් දැරුවත්, එතුමා කුමන මතවාදයක් දැරුවත්, එතුමාගේ දේශපාලන පක්ෂය කුමන මතවාදයක් දැරුවත් ගාල්ල දිස්ත්‍රික්කය තුළ දේශපාලනයේදී එතුමාටත්, ඒ වාගේම මටත් පුළුවන්කම තිබුණා, දීර්ඝ කාලයක් කිසිදු ගැටලුවකින් තොරව දිස්ත්‍රික්කයේ දේශපාලන කටයුතු කර ගෙන යන්න. සමහර වෙලාවට දේශපාලන කටයුතු කරන පහළ සාමාජිකයන් තුළ කුමන ප්‍රශ්න ඇති වුණත්, පහළ සාමාජිකයන්ගෙන් විවිධ මතවාදී අරගල සහ ගැටුම් ඇති වුණත්, ඒ ගැටුම් සියල්ලක් පාලනය කර ගැනීමට හැකියාව ලැබුණේ දොඩන්ගොඩ මැතිතුමා ලැබූ ගැඹුරු දේශපාලන අත් දැකීම් සහ පළපුරුද්ද නිසාය කියලා කිව්වොත් එය වඩාත් නිවැරදියි කියලා මම හිතනවා.

ඉන් අනතුරුව මට තවත් අත් දැකීම් ගණනාවක් දොඩන්ගොඩ මැතිතුමා සමඟ ලබා ගන්න පුළුවන්කම ලැබුණා. 2001 දෙසැම්බර් මාසයත්, 2004 අප්‍රේල් මාසයත් අතර කෙටි කාලයේ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා හැටියට ඉඳලා අපේ ආණ්ඩුවේ බලය මාරු වුණාට පසුව ඒ අමාත්‍යාංශයේ වැඩ භාර ගන්න ගියේ මගේම දිස්ත්‍රික්කයේ මිත්‍රයකු වුණු අමරසිරි දොඩන්ගොඩ ඇමතිතුමායි. ඇමති පදවිය වෙනස් වෙලා, මම ඇමති පදවිය අත හැරලා පාර්ලිමේන්තුවට එන කොට, එතුමා ගිහින් රාජ්‍ය පරිපාලන විෂයය භාර ඇමතිවරයා හැටියට ඒ ඇමති පදවිය භාර ගත්තා.

ආණ්ඩුවක් වෙනස් වුණාම නිලධාරින්ගේ සහ සියලු දෙනාගේ ස්වභාවය තමයි, පාලනය කරපු පක්ෂයේ නියෝජිතයාට විරුද්ධව කුමක්ද කළ හැක්කේ කියලා බලන සාධකය. මේ රටේ සුප්‍රසිද්ධ රාජ්‍ය නිලධාරිනුත් එහෙමයි, අනෙක් අයත් එහෙමයි. සියලු දෙනා දේශපාලන වශයෙන් කල්පනා කරන්නේ තමන්ගේ ප්‍රතිවිරුද්ධවාදියා කෙසේද මර්දනය කර ගන්නේ, කෙසේද පාලනය කර ගන්නේ කියන එකයි. දොඩන්ගොඩ ඇමතිතුමා රාජ්‍ය පරිපාලන විෂයය භාර ඇමතිවරයා හැටියට අමාත්‍යාංශයට ගිහින් වැඩ භාර ගත්තාට පස්සේ මම නැවත විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට එතුමාට සුබ ප්‍රාර්ථනා කර දින කීපයකට පස්සේ එතුමා මට කිව්වා, "අපේත් වෘත්තීය සමිති ගණනාවක් මේ අමාත්‍යාංශයේ තිබෙනවා, මේ අය සියලු දෙනාම දැන් කියනවා, හිටපු ඇමතිවරයා හැටියට ඔබතුමාගේ අඩු පාඩු වැරදි තිබෙනවා නම් හොයලා ඉක්මනට මොනවා හෝ ක්‍රියා කරන්න" කියලා. එතකොට මම හිනා වෙලා, දොඩන්ගොඩ මැතිතුමාට කිව්වා, "ඔබතුමාට තිබෙන්නේ සියල්ල හොයලා බලලා මොනවා හෝ ක්‍රියාදාමයක් තිබෙනවා නම් ඒ පිළිබඳව නැවත ක්‍රියා කරන්න"යි කියලා. එතකොට දොඩන්ගොඩ ඇමතිතුමා හිනා වෙලා මට කිව්වා, "වජිර, අපි දේශපාලනය කරන්නේ මේ රටට යමක් කරන්න. එහෙම නැත්නම් මේ රටේ ජනතාවට යමක් කරන්න. හැබැයි මමත් ඔයත් එහෙම හිතුවාට අපේ සාමාජිකයෝ එහෙම හිතන්නේ නැහැ. අපේ සාමාජිකයෝ හිතනවා, බලය අහිමි වුණාම අර බලය තිබුණු පුද්ගලයාට හිරිහැර කරන්න පුළුවන් මාර්ගය කුමක්ද කියලා. ඒ නිසා වජිර මම ඒ අය කියන කරුණු කාරණා ගැන බොහොම විමසිල්ලෙන් කල්පනාවෙන් ඉන්නේ. ඒ අය කියන කරුණු මොනවා හෝ තිබුණොත් මම නැවත වජිර සමඟ සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා" කියා. ඒ එතුමාට තිබුණු අත් දැකීම සහ පළපුරුද්ද නිසාම -එතුමාට තිබුණු දේශපාලනයේ ගැඹුරු අත් දැකීම සහ පළපුරුද්ද නිසාම- එතුමාට දේශපාලනයේ එහෙම හැසිරෙන්න පුළුවන්කමක් තිබුණා. එතකොට අමාත්‍යාංශ මාරුවක් සිදු වුණාමත්, විෂය භාර ඇමතිවරයා හැටියට නැවත එය භාර ගත්තාට පසුව ඒ හැකියාව, ඒ බුද්ධිය එතුමා සතුව තිබුණා. කුමන දේශපාලන මතයක් දැරුවත් තමන් මේ රටට කරන්නට බලාපොරොත්තු වන සේවය වෙනුවෙන් තමන්ගේ මතවාදය නොබියව ඉදිරියට ගෙන යන්නට දොඩන්ගොඩ මැතිතුමා තමන්ගේ මුළු ජීවිතයම කැප කළාය කියලා කල්පනා කළොත්, මේ ගරු සභාවේ සිටින සියලු දෙනාම එයට එකඟත්වය පළ කරයි කියලා මා හිතනවා. ඒ වාගේම දොඩන්ගොඩ මැතිතුමා තමන්ගේ ජීවිත කාලය තුළ ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් කටයුතු කරද්දී එතුමා පුදුම ඕනෑ කමකින්, උනන්දුවකින් තමන්ගේ ප්‍රදේශයේ දියුණුව සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් එතුමාගේ සම්පූර්ණ අවධානය යොමු කළා. ප්‍රතිවිරුද්ධ මතවාද දරන සියලු දෙනාගේ අදහස්වලටත් සවන් දෙමින්, එයිනුත් ගත යුතු ප්‍රයෝජන ලබා ගනිමින්, ගාල්ල දිස්ත්‍රික්කයේ දියුණුව සඳහාත්, රටේ දියුණුව සඳහාත් දොඩන්ගොඩ මැතිතුමාගේ මුළු ජීවිතයම කැප කළාය කියන එක මේ වෙලාවේ සිහිපත් කළ යුතුයි.

මා මීට වඩා දීර්ඝ වශයෙන් කරුණු කියන්නට යන්නේ නැහැ. දොඩන්ගොඩ මැතිතුමාගේ දරුවනුත්, එම මැතිනියත් ඇතුළු පවුලේ සියලු සාමාජිකයන්ට එක්සත් ජාතික පක්ෂයේ ශෝකය පළ කරනවා. විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ අවස්ථාවේ විදේශගත වෙලායි සිටින්නේ. ඒ නිසා එතුමාගේ

[ගරු වජිර අබේවර්ධන මහතා]

ශෝකයත් දොඩන්ගොඩ පවුලේ සාමාජිකයන් වෙත පළ කරන අතර, දොඩන්ගොඩ මැතිතුමාට නිවන් සුව අත් වේවා! යි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්තුතියි. මීළඟට ගරු නන්දිමිත්‍ර ඒකනායක මන්ත්‍රීතුමා.

[අ. භා. 12.33]

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් 1989 වර්ෂයේ ඉඳලා අප සමඟ සමීප මිත්‍රයකු වශයෙන් කටයුතු කරපු, මා මේ පාර්ලිමේන්තුවට මුලින්ම පැමිණි අවස්ථාවේ දී මට වඩා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු වශයෙන් මා උපදෙස් ලබා ගත් කල්‍යාණ මිත්‍රයකුගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ දී මටත් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා. අපේ ගරු සභානායකතුමා ඇතුළු සියලුම කථිකයන් කළ සියලු කථාවන් තුළ ගැබ් වෙලා තිබුණු සියලු අදහස් මා අනුමත කරනවා. එතුමා වමේ පන්නරය තුළින් දේශපාලනයට ආපු කෙනෙක්. මමත් එහෙමයි. මට පෙර කථා කරපු රාජිත සේනාරත්න ඇමතිතුමාත් එහෙමයි. චීන පිලට සම්බන්ධ වන කොට අපත් ශිෂ්‍යයන් වශයෙන් වමටයි සම්බන්ධ වෙලා සිටියේ. මේ මානවවාදී දේශපාලනඥයා විවිධ ඇමතිකම් දැරූ පසුත්, දරන්නට ඉස්සර වෙලාත් කටයුතු කළේ මනුෂ්‍යත්වය මුල් කර ගෙනයි. අතුරු මැතිවරණ 17ක් පැරදුණු වෙලාවේ රිචඩ් පතිරණ මැතිතුමාත්, එතුමාත් ගාලු දිස්ත්‍රික්කයෙන් මෙහාට ආවා. අපි බොහොම ආශාවෙන් මේ පාර්ලිමේන්තු විවාද කියෙව්වා. ඒ කියවන කොට අපට පෙනී ගියා, ඉතාම කෘතහස්ත විධියට, ඉතාම ව්‍යක්ත විධියට, ඒ වාගේම ඉතාම හරවත් විෂයානුබද්ධ දැනුමකින් යුක්තව මේ ගරු සභාව අමතපු දේශපාලනඥයකු තමයි අපේ දොඩන්ගොඩ මැතිතුමා කියන එක. එවකට විපක්ෂයේ ඉතාම අඩු මන්ත්‍රීන් සංඛ්‍යාවක් සිටියදී, එතුමා ඇතුළු දැන් අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත්, ආනන්ද දසනායක මැතිතුමාත් විපක්ෂය වෙනුවෙන් එදා ගරු සභාව තුළ හඬ නැඟුවා. අපි හැම දාම පත්තරය පෙරළලා බලන්නේ මේ අයගේ කතා මොනවාද කියලායි.

ඊළඟට අපි ආයෙත් හමු වුණේ 1989 දී මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් වශයෙනුයි. මේ රටේ ඉතාම භීෂණකාරී තත්ත්වයක් ඇති වී තිබුණු අවස්ථාවක්, ඒ. මහා භීෂණයක් පැවතුණා. තරුණ අරගලයකට සම්බන්ධ වුණු තරුණයන් ඝාතනය කරපු, තරුණයන් පැහැර ගෙන ගිය, තරුණයන් අතුරුදහන් වුණු යුගයක ඒ තරුණයන් වෙනුවෙන් විශාල හඬක් නඟපු අපේ කණ්ඩායම වෙනුවෙන් එදා නායකත්වය ගත්තේ වත්මන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමායි. එතුමා බණ්ඩාරනායක මැතිනියගේ සභාපතිත්වයෙන් මානව හිමිකම් කමිටුවක් පළමු වන වරට පාර්ලිමේන්තුවේ ස්ථාපිත කළා. ඒ කමිටුවේ ක්‍රියාකාරිකයන් වශයෙන් හිටපු දොඩන්ගොඩ මැතිතුමා ඇතුළු අපි මානව අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳව මේ ගරු සභාව තුළ හඬ නැඟුවා. ඒ විතරක් නොවෙයි. එදා ආණ්ඩු විරෝධී, ඒකාධිපති වියරුව වශයෙන් හඳුන්වපු ඒ රජයට විරුද්ධව ගත් සෑම ක්‍රියා දාමයකම වත්මන් අතිගරු ජනාධිපති, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සෙවනැල්ල වාගේ හිටපු දොඩන්ගොඩ මැතිතුමා, "පාද යාත්‍රා", "ජන ඝෝෂා" ඇතුළු සියලු උද්ඝෝෂණ ව්‍යාපාරවල පෙරමුණේ සිටියා. ලිප්ටන් වට රවුමට කථා කරන්නට පුළුවන් නම් කියයි. අපි පවත්වපු ඒ සෑම විරෝධතා ව්‍යාපාරයකම එතුමාත් පෙරමුණේ සිටියා.

එතුමා විශ්වන්තරවාදියෙක්. හැම දෙයක් ගැනම හුඟක් දන්නවා. වෛද්‍ය විද්‍යාව ගැන ගත්තත් -එතුමා දේශීය වෛද්‍යවරයෙක්ද මම දන්නේ නැහැ.- දේශීය වෛද්‍ය විද්‍යාවට අනුව අපට උපදෙස් දෙනවා. පොඩි අසනීපයක් වුණත් හුඟක් දෙනෙක් දොඩන්ගොඩ මැතිතුමා ළඟට ඇවිල්ලා ඉඳ ගෙන අහ ගන්නවා. එතුමා ඒ වාගේ කටයුතු කළා. එපමණක් නොවෙයි.

එතුමා මාධ්‍යවේදීන්ට බොහොම හිතකරව සිටියා. ඒ වෙලාවේ මාධ්‍යවේදීන්ට තිබුණු දරුණු ප්‍රහාරයන් හමුවේ අභීතව අපත් එක්ක සිටියා. "බියෙන් අත් මිදෙමු" වාගේ සටන් ව්‍යාපාර දියත් වන විට එතුමාත් විපක්ෂයේ අපේ කණ්ඩායමේ පෙරමුණේම සිටි කෙනෙක්. "මවු පෙරමුණ", "අතුරුදහන් වූවන්ගේ දූ දරු පෙරමුණ" යන මේවා බිහි වන විට ඒවා තුළත් ක්‍රියාකාරිකයකු වශයෙන් එතුමා කටයුතු කළා. රිචඩ් ද සොයිසා ඝාතනය පිළිබඳව හැන්සාඩ් පිරෙන්න මේ සභාවේ එතුමා ප්‍රශ්න අහලා ඇති; කථා කරලා ඇති. ඒ කොහොම කළත් එතුමා මේ දේශපාලන ක්ෂේත්‍රය තුළ බොහොම නිහතමානිව කිසිම කෙනෙක් එක්ක තරහක් ඇති කර ගත්තේ නැතිවයි කටයුතු කළේ. රිචර්ඩ් පතිරණ මැතිතුමාත්, දොඩන්ගොඩ මැතිතුමාත් සංසන්දනය කළාම වරිත දෙකක් තමයි අපට මැවුණේ. රිචර්ඩ් පතිරණ මැතිතුමාට සුළු දෙයකදී පවා සභාව තුළත්, ඉන් පිටතත් බොහොම කේන්ති යනවා. නමුත් පියසේන ගමගේ ඇමතිතුමා දන්නවා, දොඩන්ගොඩ මැතිතුමාට කවදාවත් කේන්ති ගිහින් සිටිනවා අපි දැක්කේ නැහැ කියලා. බොහොම යථාර්ථවාදීව අදහස් ප්‍රකාශ කරමින් - කරුණු ප්‍රකාශ කරමින්- අනික් අයටත් දැන ගන්න පුළුවන් වන විධියට කටයුතු කළා.

එතුමා නිහතමානිකමේ ප්‍රතිමූර්තියක් වශයෙන් සභානායකතුමා සඳහන් කළා. මමත් ඒක ඒ ආකාරයෙන්ම අනුමත කරනවා. මොකද, මට මතකයි 1983 පාර්ලිමේන්තුවට ආව අයට ඒ රජය කාලයේ තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලැබුණා. ඒ වාහන බලපත්‍රය ලැබුණේ අර “මිට්සුබිෂි” වර්ගයේ හෙල්ලෙන දුවන වාහනයකට. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් ඒ වර්ගයේ වාහනයක් පාවිච්චි කරනවා මම දැක්කා. දොඩන්ගොඩ මැතිතුමාට ඊට වඩා හොඳ වාහන හම්බ වුණාට පස්සෙත් එතුමාගෙන් මම ඇහුවා, “ඇයි ඔබතුමා ඔය වාහනයම පාවිච්චි කරන්නේ” කියලා. එතුමා කිව්වා, "මේක තමයි හොඳ. ඩොක ඩොක ගාලා යන විට ප්‍රෙෂර් එන්නේ නැහැ; කොලොස්ටරෝල් බහිනවා." කියලා. මේ විධියේ උත්තරයක් තමයි දුන්නේ. මුල් අවධියේ එතුමාට ඊට වඩා මැති ඇමතිකම් ලැබෙන විට ඊට වඩා හුඟක් සුඛෝපභෝගී වාහන පාවිච්චි කරන්න තිබුණත් ඉතාම සරල විධියේ වාහන පාවිච්චි කරමින් තමයි ජීවත් වුණේ. මා කාලය වැඩිපුර ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. තව කියන්න හුඟක් කාරණා තිබුණත් තව හුඟක් කථික මහත්වරු සිටින බව ඔබතුමා ප්‍රකාශ කළ නිසා මම මීට වඩා කථා කරන්න යන්නේ නැහැ.

1993 දී එතුමා අපේ විපක්ෂයේ ඉඳලා දකුණේ මහ ඇමති වශයෙන් තරග කරන්න ඉල්ලා අස් වෙලා ගියා. මමත් එතුමාගේ සටනට උර දුන්නා. එදා මුල්කිරිගල ආසනය භාරව කටයුතු කළේ මමයි. එදා ලොකු විප්ලවයක් කරලා තමයි ඒ තානාන්තරයේ එතුමාට දිවුරුම් දෙන්න පුළුවන්කම ලැබුණේ. ඊට පස්සේ එතුමා 1994 දී පාර්ලිමේන්තුවට යළි පත්ව ආවා. ඒ ඇවිල්ලා ඇමති ධුර ලැබුවා. ඒ ඇමති ධුර අතර රාජ්‍ය පරිපාලන අමාත්‍ය ධුරය දැරුවා; දේශීය වෛද්‍ය අමාත්‍ය ධුරය දැරුවා; වෘත්තීය පුහුණු අමාත්‍ය ධුරය දැරුවා. කවදාවත් මෙතැනදී විපක්ෂයෙන් චෝදනාවක් එල්ල නොවුණු ඇමතිවරයෙක් වශයෙන් තමයි අපි එතුමාව හඳුනා ගෙන තිබෙන්නේ. එතුමාගේ කාල පරිච්ඡේදය තුළ හැම විටම උත්සාහ දැරුවේ බොහොම නිහතමානිව විපක්ෂයේ අදහසුත් ගොනු කර ගෙන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙත් ඉල්ලීම්වලට ඇහුම් කන් දෙමින් කටයුතු කිරීමටයි. ඒ නිසා නායකත්ව ගුණාංග ගැන කල්පනා කළාම එතුමා හොඳ ඇහුම් කන් දෙන්නෙක්. ඇහුම් කන් දෙනවා පමණක් නොවෙයි, ඒක ධාරණය කර ගෙන ඒ අනුව එතුමාගේ දේශපාලන ජීවිතය ප්‍රතිපත්තිගරුකව ඉන්ද්‍රඛීලයක් සේ සිටිමින් කටයුතු කළ නායකයෙක් වශයෙන් අපට එතුමා හඳුන්වා දෙන්න පුළුවන්. එතුමාගේ පවුලේ සියලු දෙනාටම මේ අවස්ථාවේදී පෞද්ගලිකව අපේ ශෝකයත්, මාතලේ දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකයත් ප්‍රකාශ කරමින් එතුමාට අජරාමර නිවන් සුව අත් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 12.42]

**ගරු ගුණරත්න වීරකෝන් මහතා (ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு குணரத்ன வீரக்கோன் - தேசத்தைக் கட்டியெழுப்புவதற்கான அமைச்சர்)
(The Hon. Gunaratne Weerakoon - Minister of Nation Building)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේත්, ඒ වාගේම ශ්‍රී ලංකාව තුළත් මෑත කාලයේ බිහි වුණු විශිෂ්ට ගණයේ, ඒ වාගේම අග්‍ර ගණයේ උතුම් දේශපාලනඥයකු හැටියට දිවංගත ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා හඳුන් වන්නට පුළුවන්. වර්තමාන දේශපාලන ලෝකය දිහා බැලුවාම, ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා වැනි අය කලාතුරකින් බිහි වන දේශපාලනඥයන් හැටියට හඳුන් වන්න පුළුවන්. මා එතුමාව මුලින්ම හඳුනා ගත්තේ 70 දශකයේදී අපේ වර්තමාන ජනාධිපතිතුමා බෙලිඅත්ත ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරයා හැටියට කටයුතු කරන අවධියේයි. ඒ අවධියේ අවස්ථා ගණනාවකදීම ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා අතිගරු ජනාධිපතිතුමාගේ මැදමුලන මහගෙදරට පැමිණියා. එහිදී දීර්ඝ කාලයක්, දීර්ඝ වේලාවක් දේශපාලන වශයෙන් බොහෝ සාකච්ඡා සිදු වුණා. කොහොම වුණත් 1991 වර්ෂයේ කරන්දෙනිය ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායකවරයා හැටියට මා පත් වන විට අපේ ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා බද්දේගම ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායකතුමා හැටියට කටයුතු කළා. ඒ කාලය තුළ ඉතාම ළ බැඳි සබැඳියාවක් අප දෙදෙනා තුළ ඇති වුණා. ඒ වාගේම 1993 වසර ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ විශාල වෙනසකට භාජන වුණු වසරක්. දකුණු පළාත් සභා මැතිවරණය වෙලාවේ ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස් වෙලා ඒ විශාල අභියෝගය භාර ගත්තා. දහහත් වසරක් එක්සත් ජාතික පක්ෂයේ අඳුරු පාලනය අවසන් කරන්නට පළමු වැනි වෙඩි මුරය තැබීමේ අභියෝගය භාර ගත්තේ අපේ ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමායි. 1993 දී පළාත් සභාව ජයග්‍රහණය කළත් දිවුරුම් දෙන්න අවස්ථාව ලබා නොදුන්නු වෙලාවේ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, ගරු රිචර්ඩ් පතිරණ මැතිතුමාත්, ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාත් ආණ්ඩුකාර කාර්යාලයට බලෙන් ගිහිල්ලා ඒ අවශ්‍ය කටයුතු කළාට පසුවයි අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා මහ ඇමතිවරයා හැටියට දිවුරුම් දුන්නේ. විශාල අභියෝගයන් තුළයි ඒ කටයුත්ත කළේ. මට මතකයි, එදා ඒ දිවුරුම් දීමෙන් පසුව ගාල්ල ශ්‍රී ගුණරතන බෞද්ධ මධ්‍යස්ථානයේ ආගමික වතාවත්වලට පැමිණෙන වෙලාවේ මාර්ගය හරස් කරලා, පොලිසිය යොදවා කඳුළු ගෑස් ගැහුවා. ඒ විතරක් නොවෙයි, පොලිස් වෙඩි පහරින් අපේ පාක්ෂිකයන් දෙදෙනෙක්ද මිය ගියා. ඒ අවස්ථාවේදී -1993- ගරු අමරසිරි දොඩන්ගොඩ ඇමතිතුමා දැවැන්ත අභියෝගයකට මුහුණ දීලා ඒ අභියෝගය ජයග්‍රහණය කළා. ඉන් අනතුරුව 1994 දකුණු පළාත් සභා මැතිවරණයේදීත් එතුමා දකුණු පළාත විශිෂ්ට ජයග්‍රහණයක් කරා මෙහෙයවූවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂ අඳුරු පාලන යුගය අවසන් කරන්නට අපට ශක්තියක් තිබෙනවාය කියන පණිවිඩය දුන්නේ 1994 දකුණු පළාත් සභා මැතිවරණයෙන්. ඉන් අනතුරුව, 1994 පාර්ලිමේන්තු මැතිවරණයේදීත් එතුමා මනාප ඡන්ද එක්ලක්ෂ හැත්තෑහයදහසක් ලබා ගෙන පාර්ලිමේන්තුවට පැමිණියා. එතුමාට අමාත්‍ය ධුරයන් ලැබුණා. එතුමා අමාත්‍යවරයෙක් හැටියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරපු කාලය තුළ, අප එතුමා තුළ දැකපු ඉතාම වැදගත්ම ගුණාංගය තමයි කෙනකුට ඇහුම් කන් දීම සඳහා එතුමාට විශාල ශක්තියක් තිබීම. ඕනෑම ප්‍රශ්නයක් පිළිබඳව පැය ගණනාවක් වුණත් ඇහුම් කන් දීලා ඒ සඳහා තමන්ට දිය හැකි විසඳුම ලබා දෙන්න තරම් නිහතමානි වුණු දේශපාලනඥයකුයි අපේ ගරු අමරසිරි දොඩන්ගොඩ ඇමතිතුමා.

ගාල්ල දිස්ත්‍රික්කය තුළ එතුමාගෙන් ගුරුහරුකම් ලබා ගෙන, එතුමා නිසා ගොඩ නැඟුණු දේශපාලනඥයින් විශාල පිරිසක් අද ඉන්නවා. ඒ වාගේම එතුමා තුළ තිබුණු තවත් ගුණාංගයක් තමයි නිවැරදි මතය දරමින් ඒ මතය ප්‍රායෝගික තත්ත්වයට ගෙන ඒම සඳහා උපරිම කැප කිරීම් කිරීම. අපේ ගරු අමරසිරි දොඩන්ගොඩ ඇමතිතුමා ඒ ආකාරයෙන් කටයුතු කරපු කෙනෙක්. ගාල්ල දිස්ත්‍රික්කය තුළ අපට දේශපාලන නායකත්වය ලබා දුන්නා වාගේම දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු පිළිබඳව විශාල උනන්දුවක් දැක්වූවා. එතුමාට විශාල සැලැස්මක් තිබුණා. දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සැලැස්මක් තිබුණා. ඒ වාගේම ඒ සඳහා කටයුතු කරන්ට අවශ්‍ය ශක්තිය එතුමාට තිබුණා. අපට මතකයි, අතිගරු මහින්ද රාජපක්ෂ වර්තමාන ජනාධිපතිතුමා එදා ජනාධිපතිවරණය සඳහා නාම යෝජනා ලබා ගැනීමේ අවස්ථාවේ ඉඳලා ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කරවීම වන තෙක් ගරු අමරසිරි දොඩන්ගොඩ ඇමතිතුමා ස්ථිර අධිෂ්ඨානයෙන් යුක්තව, ඉතාම කැප වීමෙන් යුක්තව වැඩ කරපු ආකාරය. එදා ඒ දේශපාලන සටන ජයග්‍රහණය කරවීම සඳහා ගාල්ල දිස්ත්‍රික්කය තුළ පමණක් නොවෙයි, ජාතික වශයෙනුත් විශාල මෙහෙවරක් ඉෂ්ට කරපු දේශපාලන නායකයෙක් තමයි එතුමා. ගරු අමරසිරි දොඩන්ගොඩ ඇමතිතුමා නැති වීම තුළ, ගාල්ල දිස්ත්‍රික්කයේ ඇති වුණු හිඩැස පියවන්නට අපට බොහෝ කාලයක් යාවිය කියා මම විශ්වාස කරනවා. එවැනි උතුම් ගුණාංගවලින් පිරිපුන් දේශපාලනඥයකු දීර්ඝ කාලයක් යන තුරු බිහි වේවිය කියා අපට විශ්වාසය තියන්න බැහැ.

අවසන් වශයෙන්, ගරු අමරසිරි දොඩන්ගොඩ ඇමතිතුමාගේ මැතිනිය ඇතුළු දරුවන්ටත්, පවුලේ ඥාතින්ටත් අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරන අතර, සසර වසන තුරු, නිවන් දකින තුරු අප අතර නැවත නැවතත් ඉපදිලා මේ සමාජ මෙහෙවර කරන්නට අපේ ගරු අමරසිරි දොඩන්ගොඩ ඇමතිතුමාට හේතු වාසනා වේවායි ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

බොහොම ස්තුතියි. මීළඟට ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා.

[අ. භා. 12.49]

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාලු දිස්ත්‍රික්කයට පමණක් නොවෙයි, මුළුමහත් ලංකාවටම නිවැරැදි දේශපාලන දර්ශනයක් ඉදිරිපත් කිරීමට තමන්ගේ ජීවිත කාල පරිච්ඡේදය තුළම කැප වෙච්ච ශ්‍රේෂ්ඨ දේශපාලනඥ, ගාලු දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, හිටපු අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා ගැන කතා කිරීමට මේ අවස්ථාව ලැබීම මා භාග්‍යයක් කොට සලකනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා බද්දේගම ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයට ලැදි පවුල් පසු බිමක ජන්ම ලාභය ලැබුවත් තමන් ලද අධ්‍යාපනය තුළින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ වාමාංශික දේශපාලන ව්‍යාපාරය පිළිබඳව අධ්‍යයනය කරලා, තමන්ගේ නිවැරැදි දර්ශනය වෙනුවෙන් කුඩා කාලයේ සිට ජීවිතය අවසන් වන තුරුම විවිධ අභියෝගයන් මැද්දේ නිවැරැදිව, නොසෙල්වී ජීවත් වෙච්ච අපූර්ව දේශපාලන චරිතයක්. එතුමාගේ දර්ශනය, එතුමා තුළ මේ රට වෙනුවෙන් තිබිච්ච බලාපොරොත්තුව එතුමාගේ ජීවිතයේ අවසාන කාලය වන කොට අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ "මහින්ද චින්තන" තුළින් ප්‍රායෝගිකව එළි දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට එක්සත් ජාතික පක්ෂ ග්‍රහණයෙන් මුදා ගෙන, 1994 වර්ෂයේ පොදුජන එක්සත් පෙරමුණ රජය මේ රටේ බිහි කිරීමට පරිත්‍යාගශීලීව මුල් වුණේ, ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාය කියන එක මේ ගරු සභාවේ පුනපුනා කිව යුතු නැහැ. එදා එවැනි වෙනසකට එතුමා මුල් වුණේ, සංකල්පනාත්මකව මේ රටේ ගමන් මඟෙහි නිවැරැදි වෙනසක් සිදු විය යුතුය කියන දැඩි අධිෂ්ඨානයෙනුයි. ඒ

[ගරු චන්දිම වීරක්කොඩි මහතා]

අධිෂ්ඨානය තුළ, බහුතරයක් ගමන් කර වීමට, මෙහෙය වීමට අපහසු වුණත් එතුමා ප්‍රායෝගිකව තමන් විශ්වාස කරපු දර්ශනය පිළිපැද්දා. එතුමාගේ දේශපාලන දර්ශනය තුළ තිබුණේ මේ රට දියුණු කිරීමට නම් මේ රටේ දරුවන්ට ප්‍රමුඛ තැන දිය යුතුයි කියන මතයයි; තරුණයන් සවි බල ගැන්විය යුතුයි කියන මතයයි. එතුමාගේ ඥාතිවරයෙක් හැටියටත්, එතුමාව ඉතාම ළඟින් ආශ්‍රය කළ කෙනෙක් හැටියටත් මට කියන්න පුළුවන්, එතුමා ජීවිත කාලයේදී ඉතාම ආශාවෙන් කටයුතු කරපු අමාත්‍ය ධුරය, වෘත්තීය පුහුණු සහ මානව සම්පත් සංවර්ධන අමාත්‍ය ධුරය බව. ලංකාවේ ප්‍රථම වතාවට මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශයක් බිහි කිරීමට යෝජනා කර ඒ තුළින් මේ රටේ ඉදිරි පරපුර නඟා සිටු වීමේ වැඩ පිළිවෙළ එතුමාගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් පැහැදිලිව ඉදිරියට ගෙන ගියා.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති කරවීම සඳහා මීට දශක කිහිපයකට එහා සිට එතුමාත් එක්ක එතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් වැඩ කරපු කැප වුණු ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාට ඒ වැඩ පිළිවෙළ ප්‍රායෝගිකව එළිදකින මොහොතේ දීර්ඝ කාලයක් සම්බන්ධ වෙන්න බැරි වීම ගැන අපි සියලු දෙනාටම ශෝකයක් ඇති වෙනවා. ඒ වාගේම නියම සිංහල ගැමියෙක් හැටියට එතුමා තුළ යම් ශක්තියක් තිබුණා නම් ඒ ප්‍රධානතම ශක්තිය එතුමාගේ ආදරණීය මැණියන්ගෙන් -පුණ්‍යවතී ගුණසේකර මැතිනියගෙන්- ලැබුණු ශක්තිය හැටියට එතුමා හැම වෙලේම විශ්වාස කළා. එතුමා ජීවිතයේදී කම්පා වුණේ එතුමාගේ මැණියන්ගේ අභාවය අවස්ථාවේදීයි. එතුමා කවදාවත් ඒ තරම් කම්පා වුණා කියා මම හිතන්නේ නැහැ. ලාංකීය ඌරුවට, ලාංකීය ක්‍රමයට ගමේ හැදුණු ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා තමන්ගේ ජීවිත කාලය කැප කළේ මේ රටේ දේශපාලනය වෙනුවෙනුයි. එතුමා කුඩා කාලයේ ඉඳන් ආශ්‍රය කරපු එතුමාගේ ඥාති පුත්‍රයෙක් හැටියට දේශපාලනික වශයෙන් මට හැම දාම කිව්වේ, "දේශපාලනය කරන්න ඕනෑ නම් ඉස්සෙල්ලා ඉගෙන ගන්න. ඊට පස්සේ තමන්ගේ ආර්ථිකය හදා ගන්න. ඊට පස්සේ තමන්ගේ චරිතය ආරක්ෂා කර ගන්න. තමන් විශ්වාස කරන දේශපාලන පක්ෂයේ තමන් විශ්වාස කරන දේශපාලන දර්ශනය නොවෙනස්ව තබා ගෙන, පැති මාරු කරන්නේ නැතිව ඒ දේශපාලන දර්ශනයේ ජීවත් වන්න." කියායි. දේශපාලනයට අවතීර්ණ වන හැම තරුණයකුටමත් එතුමා දුන්නු උපදෙස වුණේ ඒකයි. ඒ වාගේම එතුමා කිව්වා, දේශපාලනඥයෙක් හැටියට ස්වශක්තියෙන් නැඟී සිටින්නට තමන්ගේ ශක්තිය වර්ධනය කර ගන්නය කියා. මෙන්න මේ පණිවුඩයයි එතුමා තුළින් මම දකින්නේ. වසර 30කට එහා කාලයක් දේශපාලනයේ නියැලි ලාංකීය දේශපාලනයේ පතාක යෝධයෙක් වුණු, නිහතමානී, තමන් විශ්වාස කරන දේ පිළිපැද්ද ඒ ශ්‍රේෂ්ඨ යුග පුරුෂයා අපට දුන් ප්‍රධානතම පණිවුඩය එයයි. ශ්‍රී ලාංකීය දේශපාලනයේ අමරසිරි දොඩන්ගොඩ සලකුණ කියන්නේ මෙන්න මේ එතුමා විසින් තරුණ, නවක දේශපාලනඥයන් වන අපට ලබා දුන් උපදෙස් හැකි උපරිම ආකාරයෙන් පිළිපැදීමට අනුගත වීමයි කියා මම විශ්වාස කරනවා.

අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා රෝගීව සිටි අවස්ථාවේදීත්, ඒ වාගේම එතුමා ජීවිතක්ෂයට පත් වූ අවස්ථාවේදීත් එතුමාට ලෙන්ගතු කල්‍යාණ මිත්‍රයෙක් වූ අතිගරු ජනාධිපතිතුමා දැක්වූ අනුග්‍රහය හා සැලකිල්ල වෙනුවෙන් එතුමාගේ ඥාතිවරයෙක් හැටියට අතිගරු ජනාධිපතිතුමාට මම ස්තුතිවන්ත වනවා.ඒ වාගේම ඒ වෙනුවෙන් සහභාගි වුණු, ඒ සඳහා විවිධ ආකාරයෙන් උපකාර කළ ගරු ඇමතිවරුන් ප්‍රධාන සියලුම දේශපාලනඥයන්ටත්, අනිකුත් සියලු දෙනාටත් ස්තුති කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. අප අතරින් වෙන් වූ ගරු අමරසිරි දොඩන්ගොඩ මැතිතුමාට නිවන් සුව ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ස්තුතියි. තවත් කථිකයන් රාශියක් සිටින නිසා කාලය දීර්ඝ කර ගැනීමට අවශ්‍යයි. එම නිසා තව පැය භාගයක් ඉදිරියට ශෝක යෝජනාව ගෙන යාමට සභාව එකඟද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

තව පැය භාගයක් මදි වෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Can we have it on another day, Mr. Deputy Speaker?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

No, we cannot have it on another day because we have fixed the late Hon. Alick Aluvihare's Vote of Condolence for the 16th of July. We will have to first complete this Vote of Condolence before we take up the next one. So, on the 16th , if we can take up the Hon. Dodangoda's Vote of Condolence and conclude it, if there is agreement on that, we can take up the next one. Will you agree? Then, we can adjourn. We can take one hour on the 16th. 16 වැනි දා රැස්වීම් ආරම්භ කරලා පැයක් මේ සඳහා යොදා ගෙන ඉන් අනතුරුව ඇලික් අලුවිහාරේ මන්ත්‍රීතුමාගේ ශෝක යෝජනාව ගන්න පුළුවන්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

එහෙම නම් 16 වැනි දා රැස්වීම් ආරම්භ කර පැයක් ගරු අමරසිරි දොඩන්ගොඩ මන්ත්‍රීතුමාගේ ශෝක යෝජනාව අර ගෙන, ඊට පසුව ඇලික් අලුවිහාරේ මන්ත්‍රීතුමාගේ ශෝක යෝජනාව ගනිමු. ඒ සඳහා සභාවේ එකඟත්වය?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

## නොපැමිණීමේ අවසරය : ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා

**வராதிருக்க அனுமதி : மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்**

LEAVE OF ABSENCE : HON. M.K. SHIVAJILINGAM

**ගරු පද්මිනී සිදම්බරනාදන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பத்மினி சிதம்பரநாதன்)
(The Hon. (Mrs.) Pathmini Sithamparanathan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே,

"யாழ்ப்பாணத் தேர்தல் மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு எம்.கே. சிவாஜிலிங்கம் அவர்களுக்கு இலங்கை சனநாயக சோசலிஷக் குடியரசின் அரசியலமைப்புச் சட்டத்தின் 66 (ஊ)ஆம் உறுப்புரையின் பிரகாரம் 2009 யூலை மாதம் 24ஆந் திகதியிலிருந்து மூன்று மாத காலம் பாராளுமன்ற அமர்வுகளுக்குச் சமுகமளிக்காதிருப்பதற்கு அனுமதி வழங்கப்படுமாக"

என்று நான் பிரேரிக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## නොපැමිණීමේ අවසරය : ගරු එස්. කනගරත්නම් මහතා
**வராதிருக்க அனுமதி : மாண்புமிகு எஸ். கனகரத்தினம்**
LEAVE OF ABSENCE : HON. S. KANAGARATNAM

**ගරු කේ. තුරෙයිරෙට්නසිංහම් මහතා**
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே,

" வன்னித் தேர்தல் மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு எஸ். கனகரத்தினம் அவர்களுக்கு இலங்கை சனநாயக சோசலிஷக் குடியரசின் அரசியலமைப்புச் சட்டத்தின் 66(ஊ) ஆம் உறுப்புரையின் பிரகாரம், 2009 யூலை மாதம் 24 ஆந் திகதியிலிருந்து மூன்று மாத காலம் பாராளுமன்ற அமர்வுகளுக்குச் சமுகமளிக்காதிருப்பதற்கு அனுமதி வழங்கப்படுமாக"

என்று நான் பிரேரிக்கின்றேன்.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
**பாராளுமன்ற அமர்வு**
SITTINGS OF THE PARLIAMENT

I

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2009 ජූලි මස 16 වැනි බ්‍රහස්පතින්දා දින පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2009 ජූලි මස 16 වැනි බ්‍රහස්පතින්දා දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 1.00 දක්වා විය යුතු ය. අ. භා. 1.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

III

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2009 ජූලි මස 16 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
**ஒத்திவைப்பு**
ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මන්ත්‍රීතුමා.

## නව සාමූහික ගිවිසුම තුළින් වතු කම්කරු වැටුප් වැඩි කිරීම
**புதிய கூட்டு ஒப்பந்தத்தின் மூலம் தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை அதிகரித்தல்**
SALARY INCREASE OF ESTATE WORKERS BY NEW JOINT AGREEMENT

**ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே. வி. சமந்த வித்தியாரத்ன)
(The Hon. K.V. Samantha Vidyaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ දී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"වතු කම්කරු වැටුප් වැඩි කිරීමේ සාමූහික ගිවිසුම පසු ගිය මාර්තු 30 වන දින අවසන් විය. එම ගිවිසුම අවසන් වී දැනට මාස තුනක් ගත වුවද නව සාමූහික ගිවිසුම අත්සන් කිරීම කල් මරමින් සිටිනා බවයි පෙනී යන්නේ. නමුත් 2006 වර්ෂයේ සිට රුපියල් 200.00ක දෛනික වැටුප් සොච්චමකට තමන්ගේ ශ්‍රමය වගුරු වන වතු කම්කරුවන්ගේ ජන ජීවිතය අන්ත අසරණභාවයට වැටී ඇත.

එම නිසා දැනට අත්සන් කිරීමට නියමිත සාමූහික ගිවිසුම අත්සන් කිරීම කඩිනම් කරන ලෙසත්, එමඟින් වතු කම්කරුවන්ගේ ජීවන වියදමට සරිලන වැටුප් වැඩි කිරීමක් ලබා දීමට කටයුතු කරන ලෙසත් මෙම සභාව ඉල්ලා සිටී."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ වතු කම්කරුවන් ලක්ෂ හතරකට ආසන්න ප්‍රමාණයක් සිටිනවා. ඒ වතු කම්කරුවන්ගෙන් යැපෙන මුළු ජනගහනය ලක්ෂ දහයකට

[ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා]

ආසන්න ප්‍රමාණයක්. ඒ නිසා මේ රටේ විශාල ජන කොටසකට අදාළ යෝජනාවකුයි මවිසින් මේ ඉදිරිපත් කරනු ලබන්නේ. අපි කවුරුත් දන්නවා, වසර 180කට වැඩි කාලයක් තිස්සේ මේ රටේ වතු වැවිලි ක්ෂේත්‍රය ක්‍රියාත්මක වෙමින් තිබෙන බව. අපේ රටේ ජාතික ආදායමට විශාල පංගුවක් ලබා දීමට මේ වතු ක්ෂේත්‍රය දායක වනවා. අපේ රටේ ජාතික ආදායම ලබා දෙන්න ඒ කම්කරුවන් තමන්ගේ දහඩිය, ශ්‍රමය වගුරවමින් ඉන්නවා. ඒ නිසා ඔවුන්ගේ ජන ජීවිතය සාමාන්‍යයෙන් පවත්වා ගෙන යන්නට සමත් ආකාරයට කටයුතු කළොත් තමයි මේ ජාතික ආදායම ඉදිරියටත් ලබා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා අපි මේ පිළිබඳව වත්මන් රජයේ විශේෂ අවධානය යොමු කරවනවා. මොවුන්ගේ ප්‍රශ්නය දිහා ඉතා අවධානයෙන් බලන්න; සානුකම්පිතව බලන්න. නැතිනම් විශාල අර්බුද ගණනාවකට වතු ක්ෂේත්‍රය ඇද වැටෙන්න පුළුවන්කම තිබෙනවා.

අපි දන්නවා, ඉතිහාසයේ වතු රජයට අයත්ව තිබුණු යුගයක් පැවති බව. පසුව මේ වතු පෞද්ගලීකරණය කරනු ලැබුවා. ඒ වතු පෞද්ගලීකරණය කරන කොට එවකට පැවැති රජයන් සහ එවකට තිබුණු ප්‍රධාන වෘත්තීය සමිති වතු කම්කරුවන්ට සුරංගනා ලෝකයක් මැව්වා.

මේ පෞද්ගලීකරණය හරහා තිබුණාට වඩා ජීවන තත්ත්වය උසස් කර ගන්න පුළුවන්ය කියා කිව්වා. තමන්ටම කියලා නිවාස ලබා ගන්න පුළුවන්ය කියා කිව්වා. වතු ක්ෂේත්‍රයේ නව රැකියා උත්පාදනය වනවාය කියා කිව්වා. ඉඩමක අයිතියක් ලබා ගන්න පුළුවන්ය කියා කිව්වා. මෙහෙම කියලා තමයි වතු පෞද්ගලීකරණය කරනු ලැබුවේ. හැබැයි අද වන කොට ඒ ජනතාව එදා හිටපු තත්ත්වයටත් වඩා ඉතා දුක්ඛිත තත්ත්වයකට පත් වෙමින් සිටිනවා; මුහුණ දෙමින් සිටිනවා.

මේ පෞද්ගලීකරණයෙන් පසුව ආව වතු කම්කරුවන්ගේ ගැටලු නිරාකරණය කර ගන්න එක් එක් යෝජනා ඉදිරිපත් වුණා. ඒ ඉදිරිපත් වුණු එක් යෝජනාවක් තමයි, සාමූහික ගිවිසුම්වලට එළැඹීම. සාමූහික ගිවිසුම්වලට එළැඹෙන්නේ වතු හාම්පුතුන් සහ වතු කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින වෘත්තීය සමිතියි. මේ දෙ ගොල්ලන් එකඟතාවකට එනවා, ඉදිරි කාලයේ වතු කම්කරුවාගේ ජීවන තත්ත්වය නඟා සිටු වන්න, වත්තේ තත්ත්වය නඟා සිටු වන්න අදාළ යෝජනාවලට. සාමාන්‍යයෙන් වසර දෙකින් දෙකට හාම්පුතුන් සහ වතු වෘත්තීය සමිති සාමූහික ගිවිසුම්වලට එළඹෙනු ලබනවා. 1992-1993 කාලයේ සිට තමයි, -

**නියෝජ්‍ය කථානායකතුමා**

(பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර නිශ්ශබ්ද වන්න. මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. SPEAKER *took the Chair.*

**ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා**

(மாண்புமிகு கே. வி. சமந்த வித்தியாரத்ன)

(The Hon. K.V. Samantha Vidyaratne)

ගරු කථානායකතුමනි, මා කථා කරමින් සිටින්නේ, ඔබතුමාත්, මමත් ජීවත් වන බදුල්ල දිස්ත්‍රික්කයේත්, රටේ බොහොමයක් කඳුකර ප්‍රදේශවල සහ පහත රට ප්‍රදේශයේත් වතු කම්කරුවන් සම්බන්ධයෙන්, ඔවුන්ගේ ජීවන තත්ත්වය සම්බන්ධයෙන් වුණු යෝජනාවක් ගැනයි. ඔබතුමා මූලාසනය ගැනීම ගැන ඒ අර්ථයෙන් අපි සතුටු වනවා. ඔබතුමාත් දන්නා කරුණක් සම්බන්ධයෙනුයි මේ සාකච්ඡා කරන්නේ.

මේ සාමූහික ගිවිසුම් 1992-1993 වකවානුවේ සිට ආරම්භ කරනු ලැබුවා. ඒ අනුව වෘත්තීය සමිති සහ හාම්පුතුන් එකඟතාවන්ට එනු ලැබුවා. එහිදී කම්කරුවාගේ වැටුප කීයද, කම්කරුවාගේ නිවසේ තත්ත්වය නඟා සිටු වන්නේ කොහොමද, ඔවුන්ගේ පාසලේ තත්ත්වය, වත්තේ සංවර්ධන කටයුතු ආදිය සම්බන්ධයෙන් එකඟතාවන්වලට එනු ලැබුවා. බොහෝ විට මුල් කාලයේ නම් වතු වෘත්තීය සමිති කම්කරුවාගේ අයිතිවාසිකම් ලබා දීම සඳහා පෙනී සිටියා. හාම්පුතුන් කම්කරුවාගේ යුතුකම් ඉටු කිරීමේ පැත්තට අවධානය යොමු කරන කොට, දෙ පැත්තේ අරගල නිසා මේක ටිකක් සම බර වෙලා වතු කම්කරුවා සම්බන්ධයෙනුත් සලකනු ලැබුවා. නමුත් මෑත කාලීනව හාම්පුතුන්ගේ පැත්තට වැඩි නැඹුරුවක් දක්වන වෘත්තීය සමිති කම්කරුවාගේ පැත්ත නොබලා, ඔවුන්ගේ ජීවන තත්ත්වය නොබලා කටයුතු කරන ස්වභාවයක් අපි දකිනවා. ඒ නිසාම තමයි, අද අපට මේ යෝජනාවත් මේ පාර්ලිමේන්තුවට ගෙන එන්න සිදු වුණේ.

එකඟතාවන්ට අනුව සාමූහික ගිවිසුම අත්සන් කරන්න ඕනෑ, 2009 මාර්තු 30 දින වන විට. මොකද, එදිනට වසර තුන ඉක්ම වනවා. අවසන් සාමූහික ගිවිසුම අත්සන් කළේ 2006 දීයි. වසර දෙකකට වතාවක් නැවත සාමූහික ගිවිසුමට ආ යුතුයි; ගිවිසුම අලුත් කළ යුතුයි. නමුත් 2008 වසරේ දී වසරකින් ඒ කාලය දීර්ඝ කර ගනු ලැබුවා. ඒ අනුව මේ වසරේ මාර්තු 30 වන දිනට වසර තුන සම්පූර්ණ වෙලා තිබෙනවා. දැන් මාස තුනකුත් දවස් 10ක් ඉක්ම ගොස් තිබෙන නමුත් නව ගිවිසුමට එළැඹෙන්නේ නැහැ. ඒ නිසා වතු කම්කරුවා මුහුණ දෙන ප්‍රශ්නය සාකච්ඡා කරන්න ඉඩක් නැහැ. වතු ක්ෂේත්‍රයේ, වතුකරයේ කම්කරුවන්ට නායකත්වය දෙන වෘත්තීය සමිති මොකද කරන්නේ කියලා අපි අහනවා. ඔවුන් ඒ ගැන බලන්නේ නැති නිසා මේ රටේ උත්තරීතර යයි කියන පාර්ලිමේන්තුවට මේ යෝජනාව ඉදිරිපත් කරනවා; එය මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා.

ලක්ෂ හතරක් වන වතු කම්කරුවන්ට, ඔවුන්ගෙන් යැපෙන ලක්ෂ 10ක් පමණ වන මුළු ජනගහනයකට බලපාන ප්‍රශ්නයක් වන මේ සාමූහික ගිවිසුම අත්සන් කිරීම වහා කඩිනම් කරන්න. ඒ කම්කරුවාගේ ජීවිතය ගෙන යන්නට සමත් වැටුපක් ලබා දෙන්න. ඒ සාමූහික ගිවිසුම්වලදී ඉතිහාසයේ කථා කළා සේ අනිකුත් කරුණු කාරණා ගැන සාකච්ඡා කරන්න; වතුවල යටිතල පහසුකම් වැඩි කරන එක, සුබසාධන කටයුතු වැඩි කරන එක ගැන සාකච්ඡා කරන්න.

ගරු කථානායකතුමනි, ආරම්භක අවධියේ නම් මේ සාමූහික ගිවිසුම්වලට එළඹෙන මොහොතේ පාර්ශ්වයක් හැටියට රජයේ නියෝජිතයෙක් ද ඒ සාකච්ඡාවට මැදිහත් වුණා. නමුත් පසු ගිය කාලයේදී මේ රජයේ නියෝජිතයා ඉවත් වෙලා හාම්පුතුන් සහ වෘත්තීය සමිති පමණක් මේ ගිවිසුම්වලට එළැඹෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසාම අපි රජයට යෝජනා කරනවා, මේ රටේ බහුතර ජන කොටසකගේ ප්‍රශ්නයක් නිසා, මේ රටේ ජාතික ආදායමට විශාල පංගුවක් සපයන ජනතාවගේ ප්‍රශ්නයක් නිසා, වසර 180ක් පැරණි කර්මාන්තයකට සම්බන්ධ වුණු ප්‍රශ්නයක් නිසා මේ කෙරෙහි ඉක්මනින් දැඩි අවධානය යොමු කරන්නය කියලා. එහෙම නැති වුණොත් අපට බරපතළ ප්‍රශ්නවලට මුහුණ දෙන්න වේවි.

අපි දන්නවා, අද බොහෝ වෘත්තීය සමිති කටයුතු කරන්නේ ඒ කම්කරුවාගේ පැත්ත අරගෙන නොවෙයි; සාමාජිකයාගේ පැත්ත අරගෙන නොවෙයි කියලා. වතු ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති හාම්පුතුන්ගෙනුත් සන්තෝසම් ලබනවා, වරප්‍රසාද ලබනවා කියා අපි දකිනවා. ඒ වාගේම කම්කරුවාගේ පඩියෙනුත් යම් කිසි මුදලක් වෘත්තීය සමිතියට මාස් පතා කපා ගන්නවා. ඒ සියල්ලත් අරගෙන, හාම්පුතුන්ගෙනුත් සන්තෝසම් අරගෙන කම්කරුවන්ට නොසලකා හරින වෘත්තීය සමිති තිබෙන බව අපි දකිනවා. අද මේ වන විට ඌව පළාත් සභාවේ මැතිවරණයට සූදානම් වනවා. දැන් වෘත්තීය සමිති නායකයෝ දේශපාලන පක්ෂවලට බෙදිලා, පටු අරමුණුවලට ඇවිල්ලා මනාප සොයා ගෙන වතුකරයට යනවා. සමහර ප්‍රධාන වෘත්තීය සමිතිවල ඉන්නේ ඒ ප්‍රදේශයේ අයත්

නොවෙයි. ඉන්දියාවේ පදිංචි සමහර අය කොළඹ ලිපිනයන් දමා ගෙන ඇවිල්ලා ඡන්ද සොයා ගෙන යනවා. ඒ වතුවල කම්කරුවා ජීවත් වන්න බැරි තත්ත්වයට පත් වෙලා සිටිනවා. ඔවුන්ගේ යටිතල පහසුකම් දියුණු වෙලා නැහැ. ඒ නිසා එහෙම බැහැ. කම්කරුවාගේ සාමාජික මුදල් අර ගෙන ඔවුන් වෙනුවෙන් පෙනී සිටිනවා නම් වහාම මේ සාමූහික ගිවිසුමට එන්නය කියලා මේ උත්තරීතර සභාවේ සිට අපි ඒ වෘත්තීය සමිතිවලටත් කියනවා. අපි රජයටත් කියන්නේ මේක වෘත්තීය සමිති මතම පටවලා අත හරින්න බැහැ, වහාම ඒ කම්කරුවන් දෙස ඇස් ඇරලා බලන්න, නැත්නම් බරපතළ ගැටලුවලට මුහුණ දෙන්න වෙයි කියලායි.

ගරු කථානායකතුමනි, අද රටේ අවම දෛනික වැටුප ලබන්නා සිටින්නේ වත්තේ. රුපියල් 200යි, දවසක වැටුප. අපි අහනවා, දවසකට රුපියල් 200ක් අරගෙන හතර දෙනෙක්, පස් දෙනෙක් ඉන්න පවුලක් නඩත්තු කරන්නේ කොහොමද කියලා. වත්තේ එක ලැයිම් කාමරයේ පවුල් තුන හතර ඉන්නවා. දවසට රුපියල් 200ක් අරගෙන දරුවන් පාසල් යවලා, කෑම බීම ටික දීලා නඩත්තු කරන්නේ කොහොමද? ඒ ගැන අපි අවධානය යොමු කරවනවා. ඒ වත්තේ කම්කරුවා දහදිය හෙළලා, තමන්ගේ ශ්‍රමය කැප කරලා එකතු කරන දළු ටික තමයි මුදල හැටියට මහා භාණ්ඩාගාරයට එකතු වන්නේ. මන්ත්‍රීවරු හැටියට, ඇමතිවරු හැටියට, වරප්‍රසාද ලබන්නන් හැටියට පඩිනඩි විධියට ලක්ෂ ගණනින් ගන්නේ ඒ මුදල් තමයි. මේ විධියට බෙදා හරින්නේ ඒ මුදල්. ඒ නිසා මේ මුදල් එකතු කර දෙන්නන් සම්බන්ධයෙනුත් මේ රජය අවධානය යොමු කළ යුතුය කියලා අපි කියනවා. දවසකට රුපියල් 200ක පඩියක් අර ගෙන කිසි දෙයක් කරන්න බැහැ. ඒ රුපියල් 200ක පඩිය ගත්තේත් පාර්ලිමේන්තුවේ අරගල කරලායි. වතු කම්කරුවෝ අරගල කළා; පෙළපාලි ගියා; උද්ඝෝෂණ කළා. ඒක නිකම් දුන්නේ නැහැ. සාමූහික ගිවිසුම අනුව මෙන්න මෙහෙම දෙනවා කියලා කම්කරුවා ගැන කල්පනා කරලා දුන්නා නොවෙයි. කම්කරුවෝ අරගල කරලා, ඇනලා, ඇනලා තමයි කඳුළක් වට්ටවා ගත්තේ; මුදලක් ඉල්ලා ගත්තේ. මෙහෙම කරන එක වැරදියි කියලා අපි කියනවා. සාමූහික ගිවිසුමට එළඹෙන්න ඕනෑ දින පැනලා. එහෙම තියෙද්දී අදටත් දවසක වැටුප හැටියට ලැබෙන්නේ රුපියල් 200යි. කොහොමද, මේකෙන් ජීවත් වන්නේ?

2006 දී වතු කම්කරුවාට රුපියල් 200ක වැටුපක් දෙන්න තීන්දු කළා. 2006 දී පිටි කිලෝව තිබුණේ රුපියල් 36ටයි. අද වත්තේ පිටි කිලෝව රුපියල් 72 සිට 90 දක්වා විකිණෙනවා. ඌව-පරණගම ලකී ලැන්ඩ් වත්තට ගියාම පිටි කිලෝව රුපියල් 76යි. ඔබතුමාගේ ආසනයේ පූනාගල වත්තට ගියාම, දඹේතැන්නට ගියාම පිටි කිලෝව රුපියල් 72ට, 74ට විකිණෙනවා. ස්ප්‍රින්වැලි වත්තට ගියාම, මේමලේට, පුදුමලේට ගියාම පිටි කිලෝව රුපියල් 90ට කිට්ටු වෙනවා. කන්ද නඟින්න, නඟින්න පිටි කිලෝවේ ගණන වැඩි වනවා. 2006 දී රුපියල් 200 දෛනික වැටුපට පිටි කිලෝව රුපියල් 36ට ගත්ත කම්කරුවා අද රුපියල් 72කට අර ගෙන රොටිය ගහන්නේ කොහොමද කියලා අපි අහනවා. සාමාන්‍යයෙන් වතු කම්කරුවා උදේ ආහාරයත්, දහවල් ආහාරයත් සපයා ගන්නේ පාන් පිටි මූලික කර ගෙන රොටියක් හදා ගෙනයි. දැන් ඔවුන් රුපියල් 200ක දෛනික වැටුපක් අර ගෙන ඒ කාර්යය කරන්නේ කොහොමද? හතර දෙනෙක්, පස් දෙනෙක් ඉන්න පවුලකට අවම ලෙස රොටී ටික හදා ගෙන උදේ දහවල් බඩ පුරවා ගන්න දවසකට පිටි කිලෝ එකහමාරක් විතර යනවා. දැනට වත්තේ මිනිස්සු බත් ටිකක් අනුභව කරන්නේ රෑට විතරයි. රුපියල් 200ක් අර ගෙන මේක කරන්නේ කොහොමද කියලා අපි අහනවා. 2006 දී සීනි කිලෝව තිබුණේ රුපියල් 33ටයි. දැන් සීනි කිලෝවක මිල කීයද? වත්තේ කඳු මුදුන්වලට යන කොට සීනි කිලෝව රුපියල් 87 ඉඳන් රුපියල් 90ට නඟිනවා. එදා හාල් කිලෝව තිබුණේ රුපියල් 30ට, 35ට. අද හාල් කිලෝව රුපියල් 60, 70 ඉඳන් රුපියල් 75 දක්වා යනවා. හාල් ටික අර ගෙන කඳු මුදුන්වලට නඟින කොට ගණන වැඩි වනවා. ඒ නිසා මේ රුපියල් දෙසීයේ දෛනික වැටුපේ කිසිදු සාධාරණත්වයක් නැහැ. රුපියල් දෙසීයේ දෛනික වැටුපෙන් කම්කරුවාට ජීවත් වන්න බැහැ. අද අපේ ප්‍රදේශවල අත් උදවු දෙන කෙනෙකුත්, කුලී වැඩ කරන කෙනෙකුත් දවසකට රුපියල් 500ක, 550ක වැටුපක් ලබනවා. මේසන් බාස් කෙනෙක් රුපියල් 750ත්, 1,000ත් අතර දෛනික වැටුපක් ලබනවා. අද රටේ ඉතා අඩුම දෛනික වැටුප ලබන්නා ඉන්නේ වත්තේ. මේ රටේ ජාතික ආදායමට විශාල පංගුවක් එකතු කරන්නා සිටින්නේ වත්තේ. මෙහෙම කටයුතු කරන්නේ කොහොමද කියලා අපි අහනවා. ඒ නිසා ඒ අයට සාධාරණ වැටුපක් අවශ්‍යයි. අද රටේ තිබෙන තත්ත්වය අනුව කල්පනා කරලා අපිට වැඩි වැටුපකට එකඟ වෙන්න පුළුවන් වෙයි කියලා හිතනවා. අපි 2006 දීත් රුපියල් 300ක දෛනික වැටුපකටවත් යන්න කියලා ඉල්ලුවා. අපි මේ කියන්නේ සාධාරණ ගණනක් නොවෙයි. නමුත් අද රටේ තිබෙන තත්ත්වයත්, කර්මාන්තවල තත්ත්වයත් ගැන කල්පනා කරලා අඩුම තරමින් රුපියල් 500ක දෛනික වැටුපකටවත් යා යුතුය කියලා අපි හිතනවා.

ගරු කථානායකතුමනි, වතුකරයේ කම්කරුවාට මේ රුපියල් 200 හෝ ගන්න එක ලෙහෙසි නැහැ. දවසකට කඩන්න ඕනෑ දළු ප්‍රමාණයේ ඉලක්කයක් තිබෙනවා; කිලෝ ප්‍රමාණයක් තිබෙනවා. ඒක කඩා ගන්න බැරි වුණොත් දවසේ සම්පූර්ණ ගණන වැටෙන්නේ නැහැ. දවසේ වැටුප පහළට යනවා. නියඟය එන කොට දළු ප්‍රමාණය අඩුයි. එතකොටත් ඒ කිලෝ ප්‍රමාණය කඩන්න බැහැ. එතකොට රුපියල් 200 හම්බ වෙන්නේ නැහැ. දවස් භාගයට වැටුප හදනවා. වතු කම්කරුවා මාසයකට වැඩ කරන්න යා යුතු දින ගණනක් තිබෙනවා. වෛරස් උණ හැදුණොත්, ඩෙංගු උණ හැදුණොත් ඒ දින ගණන යන්න බැරි වනවා. ඒකට මෙඩිකල් එකක්, වෛද්‍ය සහතිකයක් ගෙනත් දුන්නත් වත්තෙන් ඒක පිළිගන්නේ නැහැ. සම්පූර්ණ දින ගණන ගියාම රුපියල් 20ක, රුපියල් 70ක විශේෂ දීමනාවක් ලැබෙනවා. එතකොට ඒවා ලැබෙන්නේත් නැහැ. සියයට 75කට වඩා පැමිණීම සලකුණු වුණොත් තමයි රුපියල් 20 දීමනාව පවා අර 200ට එකතු වන්නේ. ඒ නිසා මේක සානුකම්පික ප්‍රශ්නයක්; මේක බඩගින්න සම්බන්ධ ප්‍රශ්නයක්. මේක වතුකරය සම්බන්ධ ප්‍රශ්නයක්. මේ රටේ ජාතික ආදායම එකතු කරන්නන් සම්බන්ධයෙන් ප්‍රශ්නයක්. ඒ නිසා හාම්පුතුන්ට, වෘත්තීය සමිතිවලට මේවා නොසලකා හරින්න පුළුවන්. හැබැයි රජයකට මේවා නොසලකා හරින්න බැහැ. ඒ නිසා අපි රජයට කියනවා, වහාම මේ ගැන සැලකිල්ල යොමු කරන්නය කියා. එහෙම නැති වුණොත් ඒ කම්කරුවන්ගේ ජීවන තත්ත්වය කෙබඳු වෙයිද කියන්න බැහැ.

ගරු කථානායකතුමනි, බදුල්ල දිස්ත්‍රික්කයේ, සංඛ්‍යා ලේඛන අංශයේ කාර්යාලයෙන් පසු ගිය සතියේ නිකුත් කරපු පොත මා සතුව තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කයේ තත්ත්වය ඒ පොතේ සටහන් වනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා නියෝජනය කරන හල්දුම්මුල්ල ආසනයේ තනි කාමරයකින් යුත් නිවාස ප්‍රමාණය සියයට 13.6යි. මේ වැඩි හරියක්ම වතුවල ලැයිම් කාමරයි. සමහර වෙලාවට ඔය එක කාමරයක පවුල් තුන, හතර ඉන්නවා. වැලිමඩ ප්‍රදේශයේ තනි කාමරයකින් යුත් නිවාස ප්‍රමාණය සියයට 6.7යි; ඇල්ල ප්‍රදේශයේ ඒ ප්‍රමාණය සියයට 11.3යි; පස්සර ප්‍රදේශයේ ඒ ප්‍රමාණය සියයට 9.8යි. ඔය මා සඳහන් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් වැඩි හරියක් වතු ක්ෂේත්‍රය තමයි නියෝජනය කරන්නේ. ඒ නිසා තනි කාමරයේ නිවාස ප්‍රමාණය වැඩියි. ඇල්ල ප්‍රදේශයේ ස්ථිර බිත්ති නැති නිවාස සංඛ්‍යාව සියයට 26යි. ඒ ගෙවල් සියයක් ගත්තොත් එයින් 26කට ස්ථිර බිත්ති නැහැ. කටුමැටි බිත්ති තිබෙන්නේ. මෝඩ ගඩොල්වලින් තමයි බිත්ති බැඳලා තිබෙන්නේ. මහ කඳු මුදුන් සහිත සීතල ප්‍රදේශයක්. වැහි කාලයට ඒ ජනතාව කොහොමද ඉන්නේ කියලා අපි අහනවා. වැලිමඩ ප්‍රදේශයේ නිවාස 100ක් ගත්තොත් එයින් 32කට ස්ථිර බිත්ති නැහැ. හල්දුම්මුල්ලේ ස්ථිර බිත්ති නැති නිවාස සංඛ්‍යාව සියයට 27යි. ඒවායේ බිත්තිවලට ඉටි රෙදි ගහලායි තිබෙන්නේ. සමහර තැන්වල මෝඩ ගඩොල් තියා තිබෙනවා. කටු මැටි හගලා, නිකම් තහඩු අතුරලා තිබෙනවා. මේවායේ ඉන්නේ සත්තු නොවෙයි. ඒ ඉන්නේත් අපේ රටේ ජනතාව; අපේ රටේ වතු කම්කරුවෝ. නුවර එළිය, බදුල්ල, රත්නපුර යන හැම දිස්ත්‍රික්කයකම වතුකරයේ ජනතාව අන්ත දුඃඛිත තත්ත්වයකට පත් වෙලා සිටිනවා. අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා සිටිනවා. එහෙම තිබිය දී තමයි ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට ලක්ෂ ගණන් නිවාස කුලී

[ගරු කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා]

ගෙවන්නේ. මේ ක්‍රියා පිළිවෙළෙහි සාධාරණයක් නැහැ කියා අපි කියනවා. වතුකරයේ අය නෙළා දෙන දළුවලින් භාණ්ඩාගාරය එකතු කරන මුදල් තමයි මේ නිවාස කුලී සඳහා වැය කරන්නේ. නමුත් මේ මුදල් උපයා දෙන ඔවුන් බඩගින්නේ; හාමතේ. ඔවුන්ට දරුවන්ට උගන්වන්න විධියක් නැහැ.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඉන්න හපුතලේ නගරයේ දෙමළ මහා විද්‍යාලයට ඉංග්‍රීසි ගුරුවරු නැහැ; විද්‍යා ගුරුවරු නැහැ. පූනාගල තත්ත්වය එහෙමයි. බොන්න වතුර නැති තැන් තිබෙනවා. ඉතින් මේක කරන්නේ කොහොමද කියා අපි අහනවා. මෙහෙම යන්න බැහැ. පස්සර, යූරි වත්තේ කර්මාන්ත කොටසේ පවුල් 100ක් ඉන්නවා. ඒ අයට බොන්න වතුර නැහැ. ඒ අය අන්ත දුඃඛිත තත්ත්වයකට පත් වෙලා සිටිනවා. ඇටම්පිටිය පළමු කොටසේ දේවාලේ ගාව, කෝවිල ගාව ලැයිමේ වහල කඩා ගෙන වැටිලා. හදලා දෙන්න කෙනෙක් නැහැ. ඉස්සර නම් වතු සමාගමෙන් හදලා දුන්නා. දැන් කවුද හදන්නේ? ඒ අම්මලා තාත්තලා, දරුවනුත් එක්ක තෙමිතෙමී කල් ගත කරනවා. මෙහෙම කරන්න බැහැ. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරන්නය කියා අපි කියනවා. ඌව-පරණගම, අලගලගොඩ කොටසේ, නාපලබොක්ක කොටසේ ජනතාව වතුර ගෙනෙන්න කිලෝමීටර් දෙක, තුන යනවා. ලකී ලැන්ඩ් වත්තේ කොණ්ඩගල කොටසේ ළමයින් ස්කෝලෙට යන්න කිලෝමීටර් පහ, හය පයින් යනවා. ඒ ප්‍රදේශයේ පාර හදලා නැහැ. වාහනයක් දමන්න බැහැ. ඒ නිසා අපි කියනවා, වතුකරයේ ජනතාව ප්‍රශ්න කන්දරාවකින් පෙළෙන මෙහොතක තමයි, ඔවුන්ගේ අතට සොච්චමක් දෙන්න පුළුවන් මේ සාමූහික ගිවිසුම -පඩිය වැඩි කර ගන්න පුළුවන් ගිවිසුම- අත්සන් කෙරෙන්නේ නැත්තේ. ඒ සාමූහික ගිවිසුම තුළින් වත්තේ, ලැයිමේ වහල හදා ගන්න එක කතා කර ගන්න පුළුවන්. වතුකරයේ පාර හදන එක ගැන කතා කර ගන්න තිබෙන්නේ සාමූහික ගිවිසුම තුළිනුයි. වතුකරයේ යටිතල පහසුකම්, තමන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගන්න තොරතුරු ටික කතා කර ගන්න පුළුවන් වන්නේ, එකඟතාවන්ට එන්න පුළුවන් වන්නේ මේ සාමූහික ගිවිසුම තුළිනුයි. හාම්පුතුන් සහ වෘත්තිය සමිති තමයි ඒ සාමූහික ගිවිසුමට එළඹෙන්න ඕනෑ. ඔවුන් මේ තත්ත්වය දෙස බලන්නේ නැත්නම්, නිද්‍රාශීලී ලෙස කල් ගත කරනවා නම් වග කිව යුතු රජයකට, වග කිව යුතු ආණ්ඩුවකට ඇස් කන් පියා ගෙන බලා ගෙන ඉන්න බැහැ; උත්තරීතර සභාවකට බලා ගෙන ඉන්න බැහැ. ඒ නිසා තමයි අපි දැඩි අවධානය යොමු කරන්නේ වහාම ඒ දෙස ඇස් ඇර බලන්නය කියා. අද රටේ බඩු මිල ඉතා ඉහළ ගිහින් තිබෙන මොහොතක ඉතා අවම වැටුපක් අර ගෙන ඉතා දුක්ඛිත ජීවිතයක් ගත කරන කොටසක් අපේ වතුකරයේ ප්‍රදේශවල ඉන්නවා. ඔවුන්ගේ තත්ත්වය නඟා සිටු වන්න නම් වහාම ඒ සාමූහික ගිවිසුම්වලට එළඹෙන්නය කියා අපි කියනවා. මේ වන කොට මාස තුනයි, දවස් දහයක් ගත වෙලා තිබෙනවා. ගිවිසුම ගහන්න ඕනෑ කාලය පහු වෙලා තිබෙනවා. ඒ නිසා වහාම මේ ගිවිසුමට එළඹිලා ඒ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටු වන්න කටයුතු කරන්නය, ඒ වාගේම ඒ සඳහා රජයේ අවධානය දැඩි ලෙස යොමු කරලා අදාළ පාර්ශ්වයන් ඒ තැනට ගෙන්වා ඒ කටයුත්ත කරවන්නය කියන ඉල්ලීම අපි කරනවා. ඉතිහාසයේ කළා සේ ජාතික නිෂ්පාදනයට බාධා වන අයුරින් ආපසු අරගල බිමට බැහැලා තමන්ගේ ජීවිතය ගත කරන්න අවශ්‍ය දේවල් ඉල්ලන තත්ත්වයට වතු කම්කරුවා පත් කරන්න එපාය කියන ඉල්ලීම කරමින්, මේ කරුණු නිරාකරණය කරන්න වහාම මැදිහත් වන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**

(மாண்புமிகு இரா. சந்திரசேகர் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Ramalingam Chandrasekar - Deputy Chairman of Committees)

கௌரவ சபாநாயகர் அவர்களே! இன்று இச்சபையிலே தோட்டத் தொழிலாளர்களுடைய சம்பள உயர்வுக்காக தற்பொழுது கைச்சாத்திடப்படவுள்ள கூட்டு உடன்படிக்கையைத் துரிதப்படுத்தும்படியும் அதன்மூலம் தோட்டத் தொழிலாளர்களுடைய வாழ்க்கைச் செலவுக்கு ஏற்ற சம்பள அதிகரிப்பினை வழங்க நடவடிக்கை எடுக்குமாறும் கௌரவ சமந்த வித்தியாரத்ன அவர்களால் முன்மொழியப்பட்டுள்ள மிகவும் முக்கியமான பிரேரணையை நான் வழிமொழிகின்றேன். இலங்கையில் இன்று நான்கு இலட்சத்துக்கும் மேற்பட்ட தோட்டத் தொழிலாளர்கள் வாழ்கிறார்கள் என்பது அனைவரும் அறிந்ததே. இன்று அவர்களை நம்பி தோட்டப்புறங்களிலே பத்து இலட்சத்துக்கும் மேற்பட்ட தோட்ட மக்கள் வாழ்ந்து கொண்டிருக்கிறார்கள். இவர்களில் பெரும்பாலானவர்கள் இன்று தேயிலை உற்பத்தித் தொழிலை நம்பி வாழ்கின்ற மக்களாகவே இருக்கிறார்கள். இன்று அந்தத் தோட்டத் தொழிலாளர்களுக்கு கிடைக்கின்ற சம்பளமோ ஒரு நாளைக்கு இருநூறு ரூபாய். இன்றைய காலகட்டத்தில் சாதாரணமாக ஒரு மனிதன் இந்த இருநூறு ரூபாய் சம்பளப் பணத்துடன் வாழ முடியாது என்பதும் தொழிலாளர்கள் மிகுந்த கஷ்டத்திலே வாழ்கின்றார்கள் என்பதும் எங்கள் எல்லோருக்கும் நன்றாகத் தெரியும்.

2006 ஆம் ஆண்டில் தோட்டத் தொழிலாளர்களுக்கு இருநூறு ரூபாய் சம்பளம் பெற்றுக் கொடுப்பதற்கு ஏதுவான ஒரு கூட்டு உடன்படிக்கை செய்துகொள்ளப்பட்டது. ஆனால், 2006ஆம் ஆண்டில் செய்து கொள்ளப்பட்ட அந்தக் கூட்டு உடன்படிக்கை 2009ஆம் ஆண்டு மார்ச் மாதம் 31ஆம் திகதியுடன் முடிவடைந்துள்ளது. இந்தக் கூட்டு உடன்படிக்கை காலாவதியாகி மூன்று மாதங்களுக்கு மேலாகிவிட்டது. இந்தக் காலகட்டத்தில் உரிய தொழிற்சங்கங்கள் கவனமெடுத்து இந்தத் தோட்டத் தொழிலாளர்களுடைய சம்பளத்தை உயர்த்துவதற்கு ஏதுவான நடவடிக்கையை எடுத்திருக்கிறார்களா? என்று தேடிப்பார்க்கின்ற பொழுது "இல்லை" என்ற பதிலே கிடைக்கின்றது. ஒருபுறம் தோட்டத் தொழிலாளர்களுடைய சம்பளத்தை அதிகரிப்பது தொடர்பில் தொழிற் சங்கங்கள் உரிய நடவடிக்கையை எடுக்காதிருக்கின்ற அதேவேளையில், மறுபுறத்தில் தோட்டக் கம்பனிக்காரர்கள் - தோட்ட முதலாளிமார் சம்மேளனம் அண்மையில் நடத்திய பத்திரிகையாளர் மகாநாட்டிலே, "தேயிலை உற்பத்தியின் 140 வருட கால வரலாற்றிலே இன்றைய காலகட்டம்தான் மிகுந்த நெருக்கடியைச் சந்திக்கின்ற சந்தர்ப்பம்" என்று கூறியுள்ளார்கள். ஆகவே, தோட்டத் தொழிலாளர்களுடைய சம்பளத்தை அதிகரிப்பது பிரச்சினைக்குரிய விடயம் என தோட்ட முதலாளிமார் சம்மேளனம் குறிப்பிடுகின்றது. கௌரவ சபாநாயகர் அவர்களே! அந்தப் பத்திரிகையாளர் மகாநாட்டிலே ஒரு பத்திரிகையாளர் "அப்படியாயின் கூட்டு உடன்படிக்கையில் சம்பந்தப்பட்ட தோட்டத் தொழிலாளர்களுடைய சம்பளத்தை அதிகரிக்க வேண்டுமே?" என்று கேட்டபொழுது அதற்குப் பதிலளித்த தோட்ட முதலாளிமார் சம்மேளனத்தின் அங்கத்தவர் ஒருவர் "இலங்கையின் தோட்டத் தொழிலாளர்கள்தான் உலகத்திலேயே கூடுதலான சம்பளத்தைப் பெறும் தோட்டத் தொழிலாளர்கள்; அதுமட்டுமல்ல, அவர்களுக்கு சுகாதாரம் உள்ளிட்ட பல்வேறு சலுகைகளும் செய்து கொடுக்கப்படுகின்றன" என்று மிகவும் தெளிவாகச் சொன்னார்.

கௌரவ சபாநாயகர் அவர்களே! உங்களுக்கு நன்கு பரிச்சயமான, உங்களது தேர்தல் தொகுதியான ஹப்புத்தளைப் பிரதேசத்திலிருக்கின்ற இதல்கஸ்ஹின்ன தோட்டம் மற்றும் உடவேறிய, ஓஹிய தோட்டங்களை எடுத்துக்கொள்வோம். நீங்கள் சபாநாயகர் ஆசனத்தில் இருக்கின்றபொழுது இதைப்பற்றிக் குறிப்பிடுவதில் ஒருபுறம் எனக்குப் பெருமையாகவும் மறுபுறம் வேதனையாகவும் இருக்கின்றது. நான் பிறந்தது பண்டாரவளைப் பிரதேசத்தில்; உங்களது சொந்த ஊர் ஹப்புத்தளைப் பிரதேசம். அந்த ஹப்புத்தளைப் பிரதேசத்தின் அபிவிருத்தியில் நீங்கள் பல்வேறு காத்திரமான நடடிக்கைகளை எடுத்தீர்கள். உண்மையிலே அவை பாராட்டுக்குரியவை. கௌரவ சபாநாயகர் அவர்களே, அவ்வாறான நடவடிக்கைகள் எடுக்கப்பட்டிருந்தபோதிலும் இதல்கஸ்ஹின்ன ஸ்ரேசனுக்குப் பக்கத்தில் இருக்கின்ற தமிழ் பாடசாலையை எடுத்துக்கொண்டால், அங்கு மலசலகூடம்கூட இல்லாத நிலைமை! மலசலகூடம் இல்லாத பாடசாலை எங்கிருக்கின்றது? மலசலகூடத்துக்குக் கதவில்லாத பாடசாலை எங்கிருக்கின்றது? என்று

தேடிப்பார்க்கின்றபொழுது, வேறு எங்குமல்ல, அது ஊவா மாகாணத்திலுள்ள எங்களது மாவட்டத்தில்தான் இருப்பதைக் காணலாம். அந்த பிரதேசத்தில் வாழ்கின்ற மக்கள் இப்படியான பிரச்சினைகளுக்கு மத்தியில்தான் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். தோட்டத் தொழிலாளர்களுக்கு பல்வேறு சலுகைகள் செய்து கொடுக்கப்பட்டிருப்பதாக தோட்டக் கம்பனிக்காரர்கள் கூறுகின்றபொழுது, தோட்ட மக்களைப் பிரதிநிதித்துவம் செய்வதாகக் கூறிக்கொள்கின்ற தொழிற்சங்கத் தலைவர்கள் என்ன செய்துகொண்டிருக்கின்றார்கள்? கூட்டு உடன்படிக்கையில் கைச்சாத்திடுபவர்கள் என்ன செய்துகொண்டிருக் கின்றார்கள்?

கௌரவ சபாநாயகர் அவர்களே, மிகவும் வேதனைக்குரிய விடயம் என்னவென்றால், இன்று ஊவா மாகாணசபைத் தேர்தல் களத்தில் குதித்திருக்கும் அவர்கள், அந்த தேர்தலில் போட்டியிட்டு தங்கள் குடும்ப உறுப்பினர்களை எப்படி மாகாண சபைக்கு அனுப்புவது என்றும் அடுத்து அவர்களை எப்படிப் பாராளுமன்றத்துக்கு அனுப்புவது என்றும் அதேநேரத்தில், ஆரம்பகால உறுப்பினர்களாக இருக்கின்ற பதுளை மாவட்டத்தைப் பிரதிநிதித்துவம் செய்கின்ற சச்சிதானந்தன் போன்றவர்களைக் கட்சியிலிருந்து அகற்றிவிட்டு தங்கள் குடும்பத்தைப் பாதுகாப்பது எப்படியென்றும் சிந்தித்துக்கொண்டிருப்பதுதான். மறுபுறத்தில், அங்கிருக்கின்ற பிரதியமைச்சருக்கெதிராகப் போராட்டங்களையும் அடிதடிகளையும் கட்டவிழ்த்துவிடுகின்ற காடைத்தனங்களில் ஈடுபட்டுக்கொண்டிருக்கின்றார்களே தவிர, தோட்டத் தொழிலாளர்களின் வாழ்க்கையை மேம்படுத்துவதற்கேதுவான நடவடிக்கை எடுக்கப்படவில்லையென்பது நிதர்சனமான உண்மையாகும். அதனால், இன்று மக்கள் விடுதலை முன்னணியின் உறுப்பினரான கௌரவ சமந்த வித்தியாரத்ன அவர்களால் கொண்டுவரப்பட்டிருக்கின்ற இந்தப் பிரேரணையை மிக மிக முக்கியமான ஒன்றாகவே நான் கருதுகின்றேன்.

ஒருபுறத்தில் தோட்டங்கள் இன்று நஷ்டத்தில் இயங்குவதாகவும், பாரிய நெருக்கடி ஏற்பட்டிருப்பதாகவும் மறுபுறத்தில் உலக பொருளாதாரத்தில் நெருக்கடி ஏற்பட்டிருப்பதாகவும் தோட்டக் கம்பனிக்காரர்கள் கூறுகின்றார்கள். கௌரவ சபாநாயகர் அவர்களே, தோட்டக் கம்பனிக்காரர்கள் கூறுவதுபோல் அல்லது முதலாளிமார் சம்மேளனம் கூறுவதுபோல் தேயிலை உற்பத்தியிலோ அல்லது தேயிலை ஏற்றுமதியில் கிடைக்கின்ற வருமானத்திலோ எந்தவிதமான வீழ்ச்சியும் ஏற்படவில்லையென்றே நாங்கள் குறிப்பிடுகின்றோம். அதைப்பற்றி எங்களுக்கு நன்றாகத் தெரியும். அந்த வகையில், ஒரேயொரு புள்ளிவிபரத்தை மட்டும் நாங்கள் சுட்டிக்காட்ட விரும்புகின்றோம். அதாவது, 2006ஆம் ஆண்டில் 310 மில்லியன் கிலோ கிராம் தேயிலை உற்பத்தி செய்யப்பட்டிருக்கின்றது; அதில் 280 மில்லியன் கிலோ கிராம் ஏற்றுமதி செய்யப்பட்டிருக்கின்றது. அதேபோல், 2007ஆம் ஆண்டு 327 மில்லியன் கிலோ கிராம் தேயிலை ஏற்றுமதி செய்யப்பட்டிருக்கின்றது. இது ஏற்றுமதித் துறையில் கூடுதலான பங்கை வகிக்கின்றது. இந்த வகையில், ஒரு கிலோ தேயிலை உற்பத்திக்கான செலவுடன் இதை ஒப்பிட்டுப் பார்க்கின்றபொழுது தேயிலை உற்பத்தியின்மூலம் வருமானம் அதிகரித்திருப்பதைத்தான் காணலாம். ஆகவே, இலங்கையில் தேயிலைத் தோட்டங்களில் இலாபம் கிடைத்திருக்கின்றதே தவிர தோட்டங்கள் நஷ்டத்தில் இயங்கியதாக வரலாறு கிடையாது. உள்நாட்டுச் சந்தை நிலைவரத்தை நாங்கள் எடுத்துப் பார்க்கின்றபோது இன்றும்கூட ஒரு கிலோ தேயிலை 360 ரூபாய்க்கு விற்கப்படுகின்றது. அதேபோல் இறப்பரை எடுத்துக்கொண்டால், 2007ஆம் ஆண்டு அதன் மொத்த உற்பத்தி 104 மில்லியன் கிலோகிராம்களாகும். இதனுடைய ஏற்றுமதி வருமானத்தை எடுத்துக்கொண்டால், அது 234 மில்லியன் ரூபாயாகும். எனவே, இந்த ஒவ்வொரு துறை வருமானமும் ஒவ்வொரு முறையும் ஒரு மடங்கு-இரு மடங்கு என்று அதிகரித்திருக்கின்றது.

கௌரவ சபாநாயகர் அவர்களே, ஒரு தோட்டத் தொழிலாளி ஒரு நாளைக்குக் குறைந்தது 14 கிலோகிராம் கொழுந்தைப் பறித்தாக வேண்டும் என்று தோட்டக் கம்பனிக்காரர்கள் வலியுறுத்துகின்றார்கள் அல்லது அழுத்தம் கொடுக்கின்றார்கள். அந்த 14 கிலோகிராம் பச்சைக் கொழுந்திலிருந்து நாலு கிலோ தேயிலையைப் பெற்றுக்கொள்ள முடியும். அதன் ஊடாக நாங்கள் பார்க்கின்றபொழுது ஒரு கிலோ தேயிலையின் விலை 360 ரூபாயாக இருந்தால் ஒரு தோட்டத் தொழிலாளி ஒரு நாளைக்கு 1,440 ரூபாயை அந்தக் கம்பனிக்குச் சம்பாதித்துக் கொடுக்கின்றான். கௌரவ சபாநாயகர் அவர்களே! அவ்வாறு 1,440 ரூபாய் சம்பாதித்துக் கொடுக்கின்ற இந்தத் தோட்டத் தொழிலாளி வாழ்வதற்குப் போதுமான சம்பளத்தைப் பெற்றுக்கொடுங்கள் என்றுதான் நாங்கள் இந்தச் சபையிலே அடிக்கடி கேட்கின்றோமே தவிர, தோட்டங்கள் அனைத்தையும் மூடிவிட்டு அவர்களைப் பாதுகாத்து வாருங்கள் என்று நாங்கள் கூறவில்லை.

கௌரவ சபாநாயகர் அவர்களே, ஓர் உண்மை எங்களுக்குத் தெரிகின்றது. அதாவது, இப்படி இலாபங்கள் கிடைக்கின்ற பொழுது அது சம்பந்தமாக இந்தப் பாராளுமன்றத்தில் மாத்திரமல்ல, மத்திய வங்கி அறிக்கையிலும்கூட மிகத் தெளிவாகச் சுட்டிக் காட்டப்படுகின்றது. அந்த வகையில் கடந்த வருடத்தில் மாத்திரம் தேயிலை வருமானம் 100 கோடி ரூபாய் கிடைத்திருக்கின்றது. 2006ஆம், 2007ஆம் ஆண்டுகளில் தேயிலை உற்பத்தி வெற்றிகரமாக நடைபெற்றிருக்கின்றது என்று மத்திய வங்கியின் அறிக்கையிலே குறிப்பிடப்பட்டிருக்கின்றது. அதேநேரம் தேயிலையில் கிடைக்கின்ற வருமானம் அதிகரித்திருக்கின்றது என்று நாங்கள் இந்தச் சபையிலும்கூடப் பெருமையாகப் பேசுகின்றோம். ஆனால், தோட்டங்கள் இலாபமீட்டுகின்றபொழுது "இதோ எங்களுக்கு இலாபம் கிடைக்கின்றது, இதிலிருந்து தோட்டத் தொழிலாளர்களுக்கு நன்மையைப் பெற்றுக் கொடுக்கப்போகின்றோம்" என்று சொல்ல மட்டும் தோட்டக் கம்பனிக்காரர்கள் வாய் திறப்பதேயில்லை. கௌரவ சபாநாயகர் அவர்களே! அதுமட்டுமல்ல, அவர்கள் தோட்டங்களிலே இருக்கின்ற பிள்ளை மடுவங்களைப் பராமரிப்பதற்கு ஏதுவான நடவடிக்கைகளை எடுக்கக்கூட மறுத்து வருகின்றார்கள். ஆனால், இவர்கள் "தோட்டங்கள் நஷ்டத்தில் இயங்குகின்றபோது தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பளத்தையோ வருமானத்தையோ பெற்றுக் கொடுக்க முடியாது" என்கின்ற கூற்றை முன்வைக்கின்றார்கள்.

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ சமந்த வித்தியாரத்ன அவர்கள் குறிப்பிட்டதுபோன்று இன்று தோட்டத் தொழிலாளர்கள் மிகவும் கஷ்டத்தில் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். ஆனால், அவர்கள் சம்பந்தப்பட்ட விவாதம் நடைபெறுகின்ற இந்தவேளையில் அரச தரப்பில் கௌரவ தொழில் அமைச்சர் அவர்கள் மாத்திரமே அமர்ந்திருப்பது மிக மிக வேதனைக்குரிய விடயமாக இருக்கின்றது. அதேநேரம் இதற்குரிய பதிலை அவர் நல்ல முறையில் பெற்றுக் கொடுப்பார் என்று எனக்கு நம்பிக்கை இருக்கின்றது. ஏனென்றால், 2006ஆம் ஆண்டு தோட்டத் தொழிலாளர்கள் சம்பள உயர்வு கோரிப் பலமுறை வீதிக்கு இறங்கிப் போராடியபோது, அந்தத் தோட்டத் தொழிலாளர்களுக்கு ஏதாவது நியாயத்தைப் பெற்றுக் கொடுக்க வேண்டும் என்பதற்காக ஹற்றன் நகரில் நடைபெற்ற ஒருசில பேச்சுவார்த்தைகளில் கலந்துகொண்டவர் என்ற அடிப்படையில் இந்த விடயம் அவருக்கு நன்றாகத் தெரியும். 2006ஆம் ஆண்டு தோட்டத் தொழிலாளர்கள் 300 ரூபாய் சம்பளம் உயர்வு கோரியபோது அவர்களுக்கு அந்தச் சம்பள உயர்வைப் பெற்றுக் கொடுப்பது நியாயமானது என்று அன்று பிரதித் தொழில் அமைச்சராக இருந்த மேர்வின் சில்வா அவர்கள் குறிப்பிட்டிருந்தார். இன்று அவர் என்ன சொல்லப் போகின்றார் என்பது எனக்குத் தெரியாது. ஆனால், தோட்டத் தொழிலாளர்களுக்கு 500 ரூபாய் சம்பளம் கொடுக்கப்பட வேண்டும் என்கின்ற கோரிக்கைக்கு கௌரவ அமைச்சர் மேர்வின் சில்வா அவர்கள் இன்றும்கூட இந்தப் பாராளுமன்றத்தில் தனது இரு கரங்களையும் உயர்த்தி ஆதரவு தெரிவிப்பார் என்கின்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது, கௌரவ சபாநாயகர் அவர்களே! எது எவ்வாறாயினும், தோட்டத் தொழிலாளர்கள் இன்று மிகுந்த வேதனையுடனும் துன்பத்துடனும் வாழ்ந்து கொண்டிருக்கிறார்கள் என்பதே உண்மையாகும்.

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

கௌரவ சபாநாயகர் அவர்களே! கௌரவ அமைச்சர் அவர்களே! நான் இன்னும் ஒரேயொரு உதாரணத்தைக் கூறி எனது பேச்சை முடிக்கலாமென நினைக்கின்றேன். 2005ஆம் ஆண்டில், இலங்கையிலே மிகவும் வறுமையினால் வாடுகின்ற மக்கள் வாழும் பிரதேசத்தை அறிவதற்காகக் கணிப்பீடொன்று நடைபெற்றது உங்கள் அனைவருக்கும் தெரிந்திருக்கும். அந்தக் கணிப்பீட்டின் பிரகாரம் இலங்கையில் சியம்பலாண்டுவ பிரதேச செயலாளர் பிரிவிலே வாழ்கின்ற மக்கள்தாம் கூடுதலாக வறுமையால் வாடுகின்றனர் எனக் கண்டறியப்பட்டது. அன்றைய காலகட்டத்தில் தோட்டத் தொழிலாளர்களில் நூற்றுக்கு முப்பது சதவீதமான மக்கள் மட்டுமே வறுமையால் வாடுகின்ற மக்களாகக் கணிக்கப்பட்டனர். அதன் பின்னர் 2007ஆம் ஆண்டில் செய்யப்பட்ட கணிப்பீட்டின் பிரகாரம் சியம்பலாண்டுவ பிரதேச செயலாளர் பிரிவிலுள்ள மக்களின் வறுமை நிலை மாறி அவர்கள் பொருளாதாரத்தில் சற்று உயர்ச்சியடைந்திருக்கின்ற வேளையில், தோட்டத் தொழிலாளர்களின் வறுமை நிலை 30 சதவீதத்திலிருந்து 33 சதவீதமாக உயர்ச்சியடைந்துள்ளமை அறியப்பட்டுள்ளது. அதன் பிரகாரம் தோட்டத் தொழிலாளர்களுடைய வறுமை நிலையும் மந்த போசணையும் அதிகரித்திருக்கின்றது; இன்று அந்த மக்கள் இரத்தச்சோகையினால் பீடிக்கப்பட்டு மிகுந்த துன்பகரமான நிலைமைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள் என்பதே இன்று எனக்கிருக்கின்ற வேதனையாகும்.

கௌரவ சமந்த வித்தியாரத்ன அவர்கள், இலங்கையிலே பொருட்களின் விலைவாசிகளை அவதானிக்கின்றபொழுது சகல பொருட்களினுடைய விலைகளும் 2006ஆம் ஆண்டில் இருந்ததைவிட இன்று இரண்டு-மூன்று மடங்காக அதிகரித்துக் காணப்படுவதாகக் குறிப்பிட்டார். ஆனால் கௌரவ சபாநாயகர் அவர்களே! விலைவாசியில் ஏற்பட்ட உயர்ச்சிக்கு ஏற்றவாறு அந்த மக்களுடைய சம்பளப் பட்டியலில் ஒரு சதமேனும் அதிகரிக்கப்படவில்லை. கடந்த 180 வருட காலமாக இந்த நாட்டுக்காக உழைத்துக் கொண்டிருக்கின்றவர்கள் - இன்றும் இந்த நாட்டுக்காகவே உழைக்கின்ற மக்கள் - அது மாத்திரமல்ல, கடந்த நான்கு தலைமுறைகளாக தங்களுடைய இரத்தத்தையும் வியர்வையையும் இறுதியாகத் தமது எலும்புக் கூடுகளையும் இந்தத் தேயிலைச் செடிகளுக்கு உரமாக்கிய மக்கள் வேறு யாருமல்ல, அந்தத் தோட்டத் தொழிலாளர்களே ஆவர். கௌரவ சபாநாயகர் அவர்களே! 1972ஆம் ஆண்டுக்கும் 1975ஆம் ஆண்டுக்கும் இடைப்பட்ட காலப்பகுதிகளில் இலங்கையில் காணிச் சீர்திருத்தம் கொண்டுவரப்பட்டது. அரசாங்கம், பாரிய பல்தேசியக் கம்பனிக்காரர்களுடைய காணிகளைப் பறித்தெடுத்து காணிகள் இல்லாத மக்களுக்குப் பகிர்ந்துகொடுத்தது. நாங்கள் எல்லோரும் நிலச் சீர்திருத்தம் - காணிச் சீர்திருத்தம் - கொண்டுவரப்பட்டதை எண்ணிப் பெருமைகொண்டோம். ஆனால், கடந்த 150 வருட காலமாக இந்த நாட்டுக்காகத் தமது இன்னுயிரைத் தியாகம் செய்து உழைக்கின்ற தோட்டத் தொழிலாளர்களுக்கு இன்றுவரையில் ஒரு துண்டுக் காணியேனும் கொடுக்கப்படவில்லை. 2005ஆம் ஆண்டில் மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் தனது 'மஹிந்த சிந்தனை'யில் குறிப்பிட்டிருந்தார், 'ஏழு பேச்சஸ் காணி உரிமை பெற்றுத் தருவேன்; அரிசி, மா என்பன மானியமாகத் தருவேன்; ஒரு பிரதேச செயலாளர் பிரிவுக்கு ஒரு தேசியப் பாடசாலை என்ற ரீதியில் பாடசாலைகளை அமைத்துக் கொடுப்பது உள்ளிட்ட, தோட்டத் தொழிலாளர்கள் முகங்கொடுக்கின்ற பலதரப்பட்ட பிரச்சினைகளையும் தீர்ப்பேன்" என்று. ஆனால், கௌரவ சபாநாயகர் அவர்களே! இன்றுவரையில் தோட்டத் தொழிலாளர்களுடைய ஒரு பிரச்சினைதானும் தீர்த்துவைக்கப்படவில்லை என்பது மிகுந்த வேதனைக்குரிய விடயமாகும். பிறக்கின்ற பொழுது தொட்டிலும் கயிறும் கிடைப்பதைப் போன்று இறக்கின்றபொழுது தொழிலாளர்களுக்குக் கிடைப்பது சவப்பெட்டியும் சவப்பெட்டியை அடக்கம் செய்வதற்கான இடமும் மட்டுமேதவிர, வேறெதுவுமில்லை என்று கூறிக்கொண்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් තිබෙන්නේ ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාව. ඊට කලින් මම සභාවේ අවසරය පතනවා, ඇමතිතුමාගේ කථාව අවසාන වන තෙක් සභාවේ කාලය දීර්ඝ කර ගැනීමට. පස් වරු 1.30ටයි සභාවේ කටයුතු අවසන් වෙන්න තිබුණේ. කාලය දීර්ඝ කර ගැනීමට සභාවේ අනුමැතිය දෙන්න.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මර්වින් සිල්වා ඇමතිතුමා.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා (කම්කරු අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி மேர்வின் சில்வா - தொழில் அமைச்சர்)
(The Hon. (Dr.) Mervyn Silva - Minister of Labour)

අතිගරු කථානායකතුමනි, ඔබතුමා මට විනාඩි කීයක්ද දෙන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔබතුමාට මිනිත්තු කීයක් ඕනෑද?

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

මට පුළුවන්, හෙට එළි වෙන තෙක් වුණත් කථා කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

එහෙම බැහැ නේ.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

මට පුළුවන්. එතුමන්ලා කියනවා නම් මට උත්තර දෙන්න පුළුවන්. මට කියන්න තිබෙන්නේ වචන දෙකයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ආ, එහෙම නම් වචන දෙකෙන් ඉවර කරන්න.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

ගරු කථානායකතුමනි, අහසම කළු කළා. හරියට ගෙරෙව්වා. හුඟක් දෙනෙක් රේඩියෝ වහලා, ටී.වී. වහලා දැම්මා. පාරේ සිටිය සියලු මිනිස්සු ගෙවල් ඇතුළට වුණා. බස් ස්ටෑන්ඩ් එකේ හිටපු මිනිස්සු බස් නැවතුම ඇතුළට ගියා. බලන් හිටියා. වැස්සෙ නැහැ නේ. ඒ වාගේ තමයි සමන්ත විද්‍යාරත්න මන්ත්‍රීතුමාගේ - මගේ මිත්‍රයාගේ- යෝජනාවත්, රාමලිංගම් චන්ද්‍රසේකර් මන්ත්‍රීතුමාගේ ස්ථිර කිරීමත්. ඔබ දෙපොළ උපන්නේ ගිය සුමානේද, නැත්නම් ගිය මාසේද, නැත්නම් මේ අවුරුද්දේද?

අතිගරු කථානායකතුමනි, අවුරුදු තිහක මහා ව්‍යසනය වතුකරයේ ජනතාවට වේවා, උතුරු-නැඟෙනහිර ජනතාවට වේවා, දකුණේ ජනතාවට වේවා එක සේ බලපෑවා. හැබැයි යුද්ධයෙන්

ගොඩ යන ජාතිය මහින්ද රාජපක්ෂ රජ්ජුරුවන්ගේ ආණ්ඩුවේ නැහැ. කෙළින් වැඩ, කෙළින් කථාව. මම කම්කරු ඇමතිවරයා හැටියට -මගේ ඇමතිතුමා අද සභා ගර්භයේ නැහැ.- පිළිතුරු දෙන්නයි ආවේ. එතුමා කිව්ව දෙය මම හොඳට අහ ගෙන සිටියා. මම කාටවත් ඒකට කරදර කළේ නැහැ. විජිත රණවීර මන්ත්‍රීතුමා මගේ මිත්‍රයා, මගේ ගමේ. මගේ කථාව අහ ගෙන ඉන්න අමාරු නම් මම පොත වහලා යන්නම්.

**ගරු විජිත රණවීර මහතා**
(மாண்புமிகு விஜித ரணவீர)
(The Hon. Vijitha Ranaweera)
ඔබතුමා මේ වැදගත් සාකච්ඡාවකට අවතීර්ණ වුණේ.

**ගරු ආචාර්ය මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
වැදගත් සාකච්ඡාව කරන කොට නිශ්ශබ්දව ඉන්න. අනෙක් ඇමතිවරු වාගේ නොවෙයි මම, මට ඉඩ දුන්නේ නැත්නම් මේ පොත වැහුවා, මම ගියා ගරු කථානායකතුමනි. එච්චරයි. දඟලන්න ආවොත් මේකට වචනයක් කථා නොකර පොත වැහුවා, ගියා. උත්තර දෙන්නේ නැහැ අතිගරු කථානායකතුමනි.

පසු ගිය කාලය තුළ ගමේ ගොඩේ, වෙළෙඳ පොළේ සිට නගරය දක්වා හැම මිනිහකුම ජීවත් වුණේ "මරුවා සමඟ වාසේ" වාගේ, දෙලොවක් අතර. බලන්න, අපේ වීර ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ රණ විරුවන් දුන්නු ආදර්ශය. මේ රටේ කිසිම රාජ්‍ය නායකයකුට කරන්න බැරි වෙච්ච දේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ රජ්ජුරුවෝ කළා. විජිත රණවීර මන්ත්‍රීතුමා දන්නවා, බෙලිඅත්තෙන් ආවේ මහින්ද මහත්තයා. ඊට පස්සේ බෙලිඅත්තේ මන්ත්‍රීතුමා. ඊට පස්සේ එතුමා විපක්ෂ නායකතුමා, එතුමා ඇමතිතුමා, එතුමා අගමැතිතුමා, එතුමා ජනාධිපතිතුමා. ඉතිහාසයේ කියමනක් තිබෙනවා, දුටුගැමුණු කුමාරයා එළාරගේ වසර 43ක පාලනය නිම කළාම රජු බවට පත් වුණාය කියලා. මහා විජයබාහුටත් එහෙමයි කිව්වේ. 2009 මැයි මාසයේ දහහත් වෙනි දා මහා ව්‍යසනය ඉවර කළාම ජනාධිපතිතුමා ලංකාව එක් සේසත් කරපු රජවරු අට දෙනා අතරට වැටෙනවා, නව වැනියා හැටියට. මේ සියලුම කරුණු කාරණා තියෙද්දී මේ වීර හමුදාවේ රණ විරුවෝ කිව්වාද, ඒ අයගේ බංකරයේ මදුරුවන් ඉන්නවා කියලා? ඒ අය කිව්වාද, ඒ අය දණ වටක් ඉණ වටක්, කර වටක් වතුරේ ඉන්නවා කියලා? ඒ උදවිය පඩි ගැන කථා කළාද? ඒ උදවිය කෑම ගැන කථා කළාද? ජනතා විමුක්ති පෙරමුණේ තමුන්නාන්සේලාට තිබුණු ඒ වාසනාවට තමුන්නාන්සේලා කථා කළේ නැහැ. දෙව්දත්තර අජාසත්තට කරපු දේ තමයි තමුන්නාන්සේලාට මුල සිටම කරන්න හැදුවේ. පන්සල්වල ඉන්න ඇබිත්ත මහත්තුරුත් කිසිම දෙයක් දන්නේ නැහැ නේ. වැදගත් පක්ෂය ඇබිත්තයෝ වන්න හදන්න එපා. නිගණ්ඨ නාතපුත්‍රගේ නිකායට යන්න එපා. 2009 මැයි මාසයේ දහහත් වැනි දා තමයි මේ මහා ව්‍යසනයට අවසාන පරාල ඇණය ගැහැව්වේ. රුපියල් බිලියන 450ක් -මිලියන නොවෙයි- මේ වෙනුවෙන් මහින්ද රාජපක්ෂ රජ්ජුරුවන්ගේ රජය වියදම් කරලා තිබෙනවා. හැබැයි පොලීසියේ, හමුදාවේ ඒ වීර වික්‍රමාන්විත සෙබළුන් මොන යම් ඉල්ලීමක්වත් කළේ නැහැ. ගෙදර දරුවන්, බිරිඳ, සහෝදරයන් ගැන හිතුවේ නැහැ. මේ රට නිදහස් කළ යුතුයි කියන මතයේ සිටියේ. එහෙම මානුෂික මෙහෙයුම සිදු වන අතරේත් මේ පාර්ලිමේන්තුවේ එක්සත් ජාතික පක්ෂය විතරක් නොවෙයි, දෙමළ ජාතික සන්ධානයේත් සමහර උදවිය කොටියාට මැස්ස ගහන අතරේ, තමුන්නාන්සේලාගේ පක්ෂය අපිත් එක්ක ඉඳලා, අපේ ආණ්ඩුවේ ඇමතිකම් අරගෙන කටයුතු කළා. ඒ කාලයේ තමුන්නාන්සේලා හීනෙන්වත් දැක්කේ නැහැ, වතු කම්කරුවන්. සමන්ත විද්‍යාරත්න මන්ත්‍රීතුමා ඒ කාලයේ බදුල්ලේ යන්න නැතිව ඇති. වතු දකින්නට නැතිව ඇති. හුළඟවත් වදින්න නැතිව ඇති. ගරු කථානායකතුමනි, දැන් මේ හදිසියේ ඇයි? ඌවේ පළාත් සභා මැතිවරණය පැවැත්වෙනවා නේ. ඕවා කිව්වාට වතුකරයේ ජනතාව දන්නවා. වතුකරයේ ජනතාවගේ ජීවනාලිය, හද ගැස්ම විධියට තොණ්ඩමන් මැතිතුමාව තමයි අපි මතක් කර ගත යුත්තේ. වතුකරයේ වෘත්තීය සමිති රාශියක් තිබෙනවා. නමුත් කවුරු හිටියත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමයි මේ රටේ කම්කරු ව්‍යාපාරය වෙනුවෙන් අධිරාජ්‍යවාදී ධනපති පන්තිය බැඳලා තිබුණු බැමි කඩලා, බිඳලා, කම්කරුවන්ව එළියට ගත්තේ.

